# අරුණ

2023 ජුලි 20 බ්‍රහස්පතින්දා | හතර වැනි කාණ්ඩය | 248 කලාපය | මිල රු 60.00 | www.aruna.lk



පුවත්පත
නිවසටම ගෙන්වා ගැනීමට
දැන්ම අමතන්න : 0761 367 623
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න




# ළමයින් හා කාන්තාවන් ලක්ෂ 9කට මන්දපෝෂණය

සෞඛ්‍ය අමාත්‍යාංශය පාර්ලිමේන්තුවට කියයි

## වැඩිම පිරිස බස්නාහිර

නිලන්ත මදුරාවල

වයස අවරුදු පහට අඩු දරුවන් තුන් ලක්ෂ හත්සිය හතළිස් හය දෙනෙක් ද කාන්තාවන් හය ලක්ෂ හැත්තෑ එක් දහස් එකසිය හතළිස් දෙදෙනෙක් ද මන්දපෝෂණයෙන් පෙළෙන බව පාර්ලිමේන්තුවේ ඊයේ (19වැනිදා) සභාගත කරන ලද පිළිතුරක සඳහන් වෙයි.

02 පිටුවට

# සෑම පැමිණිලිකරුවකුගේම තොරතුරු ලේඛනයක් හදන්න

කොමිසමෙන් පොලිසියට උපදෙස්

## පොලිස් 27 පෝරමයත් පැමිණිලිකරුවන්ට දෙන්න කියයි

එෆ්. අස්ලම්

02 පිටුවට

# ජෙරොම්ට සල්ලි දුන් 13,000ක් පස්සෙන් CIDය පන්නයි



තිස්ස රවීන්ද්‍ර පෙරේරා

දේවගැති ජෙරම් ප්‍රනාන්දු විසින් ආගමික කටයුතු ප්‍රචාරය කිරීමට කටුනායක ඉදිකළ

02 පිටුවට

# වැඩ කරන අම්මලාට කිරිදෙන්න පැය දෙකක්

අශිකා ජයවීර

රාජ්‍ය, අර්ධ රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ සේවය කරන දරු ප්‍රසූතිය සිදුකළ මවකට තම දරුවාට කිරි ලබාදීම සඳහා එක් පැයක් නොව කිරි පැය දෙකක් හිමිවන බව කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශයේ කම්කරු කොමසාරිස් එන්.එම්.වයි.තුෂාරි පැවසුවාය.

02 පිටුවට

# මසකට ලක්ෂ 50 ගාණේ කෝටි 16 ගෙවන්න සක්විතිගෙන් ප්‍රතිඥා



කේ.එස්.උදයකුමාර

2006 වසරේ නුගේගොඩ ප්‍රදේශයේ මූල්‍ය සමාගමක් පවත්වාගෙන ගොස් තැන්පතු ලබාගෙන රුපියල් කෝටි 16 කට අධික මුදලක් වංක ලෙස පරිහරණය කළේ යැයි චෝදනා ලබා සිටි සක්විති රණසිංහ සහ ඔහුගේ බිරිඳ එම චෝදනාවට ඊයේ (19වැනිද) කොළඹ මහාධිකරණය හමුවේ වරද පිළිගත්හ.

02 පිටුවට

# බීමත් රියැදුරා පොලිසියට බාර දී එද්දී ට්‍රැෆික් OIC ගේ දඬුමොනරෙට ගිනි තියලා

සමන් පාලිත -හල්දුම්මුල්ල

දියතලාව නගරයේ රාජකාරි කළ පොලිස් උප පරීක්ෂකවරයකුගේ යතුරුපැදියක් පැහැරගෙන ගොස් ගිනිතබා විනාශ කර දමා තිබියදී ඊයේ(19) අලුයම හමුවූ බව දියතලාව පොලිසිය කියයි.

02 පිටුවට

# සුදු කබර සුව කරනවැයි කියා කතගෙන් ලක්ෂ තුනක් සූරගෙන

රාජගිරියේ වෛද්‍යවරයා ගැන විමර්ශනයක්

ඉෂාර රත්නකාර

02 පිටුවට

# සිඟිත්තාගේ බෙල්ලට පිහිය තියා තාත්තා පොලිසිය මෙල්ල කරයි

තිස්ස රවීන්ද්‍ර පෙරේරා/ මිහිසර රශ්මින්ද - මාරවිල

පොලිසියට පහර දී නිල ඇඳුම් ඉරා දැමූ සිද්ධියකට අත්අඩංගුවට ගැනීමට ගිය පුද්ගලයකු පොලිසියෙන් බේරීමට තම අවුරුදු තුනහමාරේ දරුවා ප්‍රාණ ඇපයට තබාගෙන මන්නා පිහියකින් කැපූ සිද්ධියක් මදුරන්කුලියෙන් වාර්තා වේ.

02 පිටුවට

# බස් අනතුර නරඹන්න ආ කත ගිලන් රියට පටවයි



අමිල ක්‍රිෂාන්ත - පස්සර

බදුල්ල සිට කොළඹ බලා ධාවනය වෙමින් තිබූ පෞද්ගලික බස්රථයක් උඩුවර 7කණුව ප්‍රදේශයේදී අනතුරට ලක්ව එහි සිටි තුවාලකරුවන් රෝහල්ගත කරන අතරතුර එය නැරඹීමට ගිය කාන්තාවක් තුවාලකාරියක යැයි සිතා ගිලන් රථයක දමා ගෙන බදුල්ල මහ රෝහලට රැගෙන ගිය පුවතක් වාර්තා වේ.

02 පිටුවට




හරින් සහ මනුෂ සජබයෙන් ඉවත් කරලලු

දවල් සජබ රෑ ආණ්ඩුවෙ අයට ප්‍රශ්නයක් නැද්ද සර්

# ඔන්ලයින් ණය වංචා ගැන අපි වග කියන්නේ නැහැ

## T.R.C ය කියයි

සාලිය කුමාර ගුණසේකර

මාර්ග ගත ක්‍රමය ඔස්සේ (On line) ක්ෂණික ණය ලබාදෙන ආයතන අන්තර්ජාලය හෝ සමාජ මාධ්‍ය ජාලා භාවිත කර වංචාවක් සිදු කළහොත් ඊට විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවට වගකීමට නොහැකි බවත්, එම ආයතන පළකරන දැ නියාමනය නොකරන බවත් එම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (අනුකූලතා හා විමර්ශන) තරලිකා ලිවේරා පැවසුවාය.

02 පිටුවට









## අවුරුදු 15ක් තිස්සේ පොලිස් ඇහැට වැලි ගහලා



ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජේ.පී.එස්. ජයමහ



මුල්ලේරියාව පොලිස් ස්ථානාධිපති සුනිමල් සුසන්තට

## කෝටිපතියන් සෙල්ලම් කළ

# අංගොඩ රේණුකාගේ බූරුපොළ වැටලූ රහස් මෙහෙයුම



### තැන තැන කුලී ඔත්තුකරුවන්

### පොලිසිය සිවිල් ඇඳුමෙන් වැටලීමට යයි

■ එෆ්. අස්ලම්

මහා පරිමාණ කැසිනෝ ශාලාවලට මෙරට ප්‍රකෝටිපතින් යන්නේ රුපියල් මිලියන කෝටි ගණින් අරගෙනය. ඊට නොදෙවෙනි ලෙස රටේ අස්සක් මුල්ලක් නැරම නාගරික හා ග්‍රාමීය මට්ටමින් ද සූදු පොළවල් වැඩි වන්නට පටන්ගෙන ඇත්තේ නීතියේ ඇසට වැලි ගසමිනි.

නීති විරෝධී අන්දමින් මනා පූර්ණ බාහිර ආරක්ෂාවක් යටතේ කරගෙන යන මෙවන් සූදුපොළවල් පොලිසියට වැටලීමට පවා නොහැකි වී ඇත්තේ ඔත්තුකරුවන්ගේ සහයෙන් එය පවත්වාගෙන යනු ලබන පුද්ගලයන් ප්‍රබල සන්නිවේදන ජාලයක් ගොඩනගා ගෙනය. කුඩා කැටපොළකින් සූදු පොළක් පටන් ගෙන වසර පහළොවක් එය බූරුපොළක් බවට පවත්වාගෙන ගිය අංගොඩ ප්‍රදේශයේ සූදුපොළක් මුල්ලේරියාව පොලිසිය විසින් පසුගියද වටලනු ලැබුවේ ප්‍රථම වරටය.

අංගොඩ දෙල්ගහවත්ත ප්‍රදේශය නිවාස ගණනාවක් ඇති කිසිදු කලබලයක් නොමැති නිස්කලංක ප්‍රදේශයක්ය. මෙම ප්‍රදේශයේ දෙමහල් නිවසක දීර්ඝ කාලයක සිට පවත්වාගෙන යන බූරුපොළක් ගැන නුගේගොඩ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජේ.පී.එස්. ජයමහ වෙත තොරතුරක් ලැබෙන්නේ පසුගිය 16 වැනිද ය. ලද තොරතුරට අනුව වහාම ක්‍රියාත්මක වූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා මේ සම්බන්ධයෙන් වැටලීමක් කිරීමට උපදෙස් දෙන්නේ මුල්ලේරියාව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුනිමල් සුසන්තටය.

තොරතුර ලද එම ස්ථානය පූර්ණ ආරක්ෂාව යටතේ පවත්වාගෙන යන සූක්ෂම බූරු පොළක් නිසාත් මෙපමණ කාලයක් මෙම ස්ථානයේ කරන ලද සියලු වැටලීම් අසාර්ථක වූ නිසාත් විශේෂ සැලැස්මක් යටතේ අදාළ වැටලීම කිරීමට මුල්ලේරියාව පොලිස් ස්ථානාධිපතිවරයා සැලසුමක් යෙදුවේය. මෙම නිවසේ රාත්‍රි 09 සිට අලුයම 04 දක්වාම සූදු කෙළිය සිදුවන බවත් ඒ සඳහා නන්නාප්‍රකාර කෝටිපති ව්‍යාපාරිකයන් පැමිණෙන බවත් පොලිසිය දැන සිටියේය. මෙම දෙමහල් නිවස පිහිටි ස්ථානයට දෙපසින්ම ගමන් කළ හැකි වීම හා ඒ මාර්ගය පටු වීම නිසා බර වාහනවලින් ඇතුළු වීම අසීරු කටයුත්තක් ද විය.

ප්‍රථමයෙන් මුල්ලේරියාව පොලිසියේ නිලධාරීන් කණ්ඩායමක් මේ වැටලීම සඳහා තෝරාගත් ස්ථානාධිපතිවරයා රාත්‍රි 07 ට පමණ නිලධාරීන් තිදෙනකු මේ දෙමහල් නිවස අසලට යවනු ලැබීය. ඒ සිවිල් පුද්ගලයන් ලෙසය. ඔවුන්ට උපදෙස් දී තිබුණේ මේ දෙමහල් නිවසට පුද්ගලයන් ඇතුළු වන ආකාරයත් ඉන් පිටවීම සඳහා වපසරියේ ඇති මාර්ගත් හඳුනා ගන්නා ලෙසය. දුන් උපදේශය නිසි ලෙසම ඉටුකළ පොලිස් නිලධාරීන් තිදෙනා ස්ථානාධිපතිවරයාට ඒ බව සැල කළේය.

මෙම නිවසට පුද්ගලයන් දහ පහළොස් දෙනකු පැමිණි බවත් ඔවුන් පුද්ගලික වාහන වලින් නිවස අසලට පැමිණ වාහන පිටත් කර හැරි බවත් ඒ නිලධාරීන්ගෙන් ලද තොරතුර විය. වැටලීම සිදුකිරීමේදී පොලිසිය කල්පනා කළ තවත් එක් කරුණක් වූයේ පොලිස් නිල ඇඳුමෙන් මෙම ස්ථානය වැටලීමට යාම හෝ පොලිස් නිල රථවලින් ඒ සඳහා ගමන් කිරීම නිසැකවම වැටලීම අසාර්ථක වීමට හේතුවිය හැකි බවය.

මේ නිසා වැටලීම් කණ්ඩායමේ සියලු නිලධාරීන්ට උපදෙස් දී තිබුණේ සිවිල් ඇඳුම් වලින් වගේම තම පුද්ගලික යතුරුපැදිවලින් කොටස් කොටස් වශයෙන් මෙම නිවසට යන මාර්ග දෙකෙන්ම පැමිණිය යුතු බවය. එම පියවර ගත්තේ සූදුපොළ පවත්වාගෙන යන පුද්ගලයන් විසින් රුපියල් පන්දහස බැගින් දෛනිකව ගෙවීම් කර තැනින් තැන ඔත්තුකරුවන් යොදවා ඇති නිසාය.

මේ අනුව යතුරුපැදිවලින් පැමිණි මුල්ලේරියාව පොලිස් ස්ථානාධිපතිවරයා ප්‍රමුඛ කණ්ඩායමක් අදාළ ස්ථානය වටකරනු ලැබුවේ කිසිවකුට හෝ ඉන් පිටතට පලා යා නොහැකි වන සේය. ඊට පළමුව නිවසේ පහළ මාලයේ රැඳී සිටි ඔත්තුකරුවන් දෙදෙනා පොලිසියේ ග්‍රහණයට ගෙන ඔවුන්ගේ දුරකතන ද ලබාගෙන ඉහළ මාලයේ සූදුපොළට කිසිදු තොරතුරක් නොයන තැනට පත්කිරීමට වග බලා ගත්තේය.

මේ නිවසේ ඉහළ මාලයේ දොරටුව විවර වීමට නම් ඇඟිලි සලකුණු කිරීමක්ද සිදුකළ යුතුය. සූදුපොළට පැමිණෙන පුද්ගලයන්ට ඒ සඳහා ඇතුළු විය හැක්කේ ඇඟිලි සලකුණු කිරීමකින් පමණි. මේ ආකාරයෙන් සූදුපොළ පැවැති දෙවන මහලේ ස්ථානයට පැමිණි පොලිසියට ඒ වනවිටත් සූදුකෙළියේ නිරතවූ පුද්ගලයන් 15 දෙනකු සහ එය පවත්වාගෙන ගිය රේණුකා නමැති කාන්තාව අත්අඩංගුවට ගැනීමට හැකිවිය. ඒ වනවිට බූරුපොළේ රැඳී සිටි පුද්ගලයන් ඔට්ටු අල්ලා තිබූ රුපියල් අනූහයදහසක මුදලක්ද පොලිසිය භාරයට ගෙන තිබිණි.

මෙම බූරුපොළ මීට වසර පහළොවකට පෙර සිටම මෙම නිවසේ සූක්ෂම ලෙස පවත්වා තිබේ. මෙය පවත්වාගෙන යන රේණුකා නමැති කාන්තාව එකල සූදු කැටපොළකින් මෙම සූදුපොළ පටන්ගෙන ඇති අතර අංගොඩ, මුල්ලේරියාව, නවගමුව, කැලණිය, පෑලියගොඩ, කිරිබත්ගොඩ, බොරැල්ල, රාජගිරිය ඇතුළු ප්‍රදේශවල ව්‍යාපාරිකයන් මෙම බූරුපොළ සඳහා සාමාජිකත්වය ගත් අය වේ.

මෙම වැටලීමේදී අත්අඩංගුවට පත්වූ 15 දෙනාම කඩවත, කිරිබත්ගොඩ, රණාල, නවගමුව, පෑලියගොඩ, කැලණිය ඇතුළු ප්‍රදේශවල පදිංචි ධනවත් ව්‍යාපාරිකයන් වේ. ඔවුන් කොළඹ අලුත්කඩේ අංක 08 මහෙස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමෙන් පසු වසර පහකට අත්හිටුවූ මාසයක සිරදඬුවමක් නියම කෙරිණි.

# උගන්වන්න දන්නේ නැති නිසා පඩිය දන් දුන් ගුරුවරයා




■ හේෂාර සේනාල් සෝමරත්න - අනුරාධපුරය

මේ කතාව අනුරාධපුර නගරයෙන් ඈතට වන්නට පිහිටි අතිදුෂ්කර පාසලක සිදුවූවකි. කතානායකයා වන්නේද විදුහල්පතිවරයකි. ඔහු විදුහල්පතිවරයකු වීමට ගැටය ගැසුවේ අපූරු ක්‍රමයකටය.

මීට වසර කිහිපයකට පෙර පිටිසර ගම්බද පාසලකට ගුරු වෘත්තිය සඳහා කතානායකයා පැමිණ ඇත්තේ බාහිර උපාධිය සමත් වීමෙනි. කපටි පුද්ගලයකු වූ මොහු තමන්ට අවශ්‍ය තැනට අනෙක් කෙනා කපාගෙන හෝ යැම සිරිත කර ගත් අයකි. මේ සඳහා ඔහු වඩාත්ම භාවිත කළ සරලම ක්‍රමය වූයේ උඩින් මිතුරු යටින් කතුරු ක්‍රමවේදයයි. එම නිසා බොහෝ පිරිසක් මොහුගේ වචනයට රැවටී සිටියේය.

මෙම පුද්ගලයා උසස් පෙළ සිංහල ගුරුවරයකු ලෙසින් පාසල් සේවයට එක්ව තිබිණි. එහෙත් මෙම පාසල ප්‍රාථමික අංශය ඇති (එක වසරේ සිට පහ වසර දක්වා) පාසලක් නිසා ඔහුට භාර දුන්නේ පස්වන ශ්‍රේණිය ය. දැන් ඔහු පහ ශ්‍රේණියේ දරුවන්ට උගන්වන්නට දන්නේ නැත. නමුත් මේ ගුරුවරයා පහ වසර භාරගෙන මාස කිහිපයක් ඇතුළත පාසලේ පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵලය 100%ක් වූවේය.

මෙනිසාම ඔහුට පාසලේ කීර්තියක් මෙන්ම ඉමහත් ජනප්‍රියත්වයක් ලැබිණි. මාධ්‍යවලද ඔහුගේ දක්ෂතාව අගය කරමින් පුවත්පත් ලිපි පවා ලියැවිණි. මේ සියලු දේ ඔහුගේ අරමුණ කරා ළඟා වීමට හැකි පරිසරය ඉබේම නිර්මාණය කරන්නට වීය. පසුව පාසලේ දෙමාපියන්ම එක්වී මෙම පාසලේ හිටපු විදුහල්පතිවරයා අදක්ෂ විදුහල්පතිවරයකු බවත් පවසා ශිෂ්‍යත්ව විභාගයෙන් දරුවන් වැඩි ප්‍රතිශතයක් සමත් කරවූ ගුරුවරයා විදුහල්පති කරවීම වඩාත් සුදුසු යැයි දරුවන්ගේ දෙමාපියන් විසින්ම යෝජනා කරන ලදී. පාසලේ විදුහල්පති එළවා දමා දැන් අපේ කතානායක ගුරුතුමා විදුහල්පති පුටුවේ වාඩි කරවූයේ පාසලේම දෙමාපියන් විසිනි.

දිනක් මෙම විදුහල්පතිවරයාට තම යහළු පිරිස සමග උත්සව අවස්ථාවකට එක්වීමට අවස්ථාව සැලසිණි. ඒ අවස්ථාවේ දී මෙම කපටි මිතුරාගේ තරම ද දන්නා යාළුවන් මධුවිතයෙන් සප්පායම් වන අතරතුර දී " ඈ බන් උඹ මේ පොඩි කාලයට ඉස්කෝලේ ප්‍රින්සිපල් වුණේ කොහොමද? යන ප්‍රශ්නාර්ථය යහළුවන්ගේ මුහුණු අතර දැක ගැනීමට තිබුණද එය ඔහුගේ මුවින් පිටවන තෙක් යහළුවන්ද නිහඬව බලා සිටියහ. දැන් අපේ කතානායකයා පුරසාරම් දොඩවන්නට පටන් ගත්තේය. විදුහල්පති තනතුරට එන්නට ආ ගමන් මග උජාරුවෙන් කියන්නට විය. යහළුවන් කීවේ "එහෙනම් උඹට සල්ලි ඇති නේ ද මචං කියාය. එවිට අපේ කතානායක ගුරුතුමා සල්ලී. "මොන පිස්සුද බන් මොන සල්ලියක් ද යකෝ මගේ මුළු සේසතම වියදම් මට සත පහක් ඉතුරු නෑ. යැයි පැවසීය.

ඒ පිළිතුරින් යහළුවන් තවත් මවිතයට පත්විය. එක් යහළුවෙක් "ඇයි බන් ඒ මොකද ඒ උඹගේ පඩිය මෙනාටද වියදම් වෙන්නේ කියපන්කෝ. උඹ ඉන්නෙත් ඉස්කෝලේ ක්වාටර්ස්වලනේ. නෝනත් ජොබ් එකක් කරනවනේ මෙනාට ද බං ඒ තරම් වියදමක් වෙන්නේ යැයි විමසීය.

එවිට යහළුවා දුකෙන් මෙන් යකෝ "පහ වසරේ ළමයි ඔකකෝම මාස හයෙන් ගොඩ දන්න මං මගේ මුළු පඩියම වියදම් කරලා උන්ව ටියුෂන් යැව්වා. ඒ ටියුෂන් ගුරාට තමා මං මගේ පඩිය දුන්නේ බං. ඌ හින්ද තමා මං ගොඩ ගියේ යැයි කිවේ ලජ්ජාවෙන් මෙන් බිම බලා ගනිමිනි.

යහළුවෝ සියලු දෙනා මුහුණෙන් මුහුණ බලා ගත්තේ මෙහෙමත් ගොන් යාළුවෙක් යැයි තමන්ටම කියා ගනිමිනි.

## අපේක්ෂාවට ලේ බිඳුවක්



මහරගම "බර්ටස් පදනම" දොළොස් වැනි වරටත් සංවිධානය කළ ලේ දන් දීමේ වැඩසටහන මහරගම අපේක්ෂා රෝහලේදී පැවැත්විණි. මේ සඳහා "බර්ටස් පදනමේ" වත්මන් සභාපති ජයරුවන් විජේරත්න ඇතුළු සමාජිකයෝ එක්ව සිටියහ. මේ එහි අවස්ථාවකි.

# මැරුණු තාත්තා වළෙන් ගොඩ ඇවිත්





■ සුනිල් රූපසිංහ - පල්ලේපොළ

ඔහු මහනුවර පදිංචි විශ්‍රාමික බැංකු නිලධාරියකි. කුඩා කල හැදුණු වැඩුණු ගම් පියස පල්ලේපොළට නුදුරින් පිහිටා තිබේ. ගමේ ගොඩේ සිදදියේ හැදුණු වැඩුණු ඔහුට රැකියා වරම් ලැබුණු පසුව බොහෝ ප්‍රදේශවල ඔහු සේවයට ගියේය.

ඔහු විවාහ වූවේ ද බැංකු නිලධානියක සමගය. පසුව මහනුවර ප්‍රදේශයේ ඉඩකඩම් ගෙන පදිංචි වූවේය. තම දෙමාපිය උරුමයෙන් ලැබුණු පල්ලේපොළ ඉඩකඩම් අවස්ථා ගණනාවකදීම විකුණා දැමීමට ඔහු උත්සාහය ගත්තද ඒ සියල්ල නිෂ්ඵල වී තිබිණි.

ඒ ඉඩම්වල වටිනාකම මෙන් දෙතුන් ගුණයක ලංසුවක් තැබීම නිසාය. දැන් ඔහු විශ්‍රාමිකය. මේ අතරවාරයේ මොහුට මුහුණ දීමට සිදුවූයේ විශාල අකරතැබ්බකටය. ඒ ආණ්ඩුව ගත් හදිසි තීරණයක් වූ වගාවෙන් බැහැර කුඹුරු ඉඩම් හිමිකරු වගා නොකරන්නේ නම් ගොවියකුට පවරා දීමය.

ඒ කොරෝනා ව්‍යවසනයට පෙරය. ප්‍රදේශයේ කෘෂි නිෂ්පාදන සහකාර නිලධාරිනිය කළ නිරීක්ෂණයේදී මෙම ඉඩම යෝධ නිදිකුම්බාවලින් වැසී ගොස් කන්න කිහිපයක් වගා නොකර අතහැර දමා තිබෙන බව හඳුනා ගැණිණි. ඒ අනුව ඇය සතුව ඇති ලේඛනයේ ඉඩම හිමිකරුගේ දුරකථන අංකයට ඇමතුමක් ලබා ගත්තේය.

සුළු වේලාවක් දුරකථනයෙන් කතා බහ කළ නිලධාරිනිය "අනේ පව් මේ ඉඩමේ මහත්තයා කොරෝනා හැදිලා මිය ගිහින්නේ. ඒ මහත්තයාගේ පුතා කිව්වේ යැයි කාර්යාලයේ අයට පැවසුවාය.

පසුව නිලධාරිනිය ප්‍රදේශයේ කුඹුරු ඉඩම් පිළිබඳව කළ නිරීක්ෂණයේදී විශ්‍රාමික බැංකු නිලධාරියාගේ ඉඩම එළි පෙහෙළි කර තිබෙනු දැක අහල පහළ නිවෙස්වලින් ඔහු ගැන තොරතුරු විමසා තිබිණි.

ඉඩමට යාබද නිවැසියා කීවේ.. "අනේ නෝනා ඒ මහත්තයා තුන් හතර දෙනෙක් අරන් ඇවිල්ලා ඉඩම ශුද්ධ කළා ගිය සතියේ කියලා"

නිලධාරිනියට හීන්දඩිය දැමීමාය. ඇයට කිසිත් අදහා ගත නොහැකි වූවාය. නිරුත්තරව හුන් ඇය කල්පනාවේ නිමග්නව ඉනනා බව දුටු නිවැසියා "ඇයි.. නෝනා ප්‍රශ්නයක් ද? යැයි අසා ඇත්තේය. "පුදුම කතාවක්නේ. මේ මනුස්සයාට මම කොරෝනා කාලේ කතා කළානේ. ඉඩම ශුද්ධ කරන්න කියන්න. ඒ වෙලාවේ පුතා කියලා කෙනෙක් කිව්වා තාත්තා කොරෝනා හැදිලා මැරුණා කියලා. එහෙම මැරුණු කෙනා කොහොමද කුඹුර එළි කළේ කියලා අදහා ගන්නවත් බැරි වුණා මට යැයි නිලධාරිනිය පැවැසුවාය.

නිලධාරිනිය මිය ගියා යැයි කී විශ්‍රමික බැංකු නිලධාරියාගේ දුරකථනයට ඇමතුමක් ගෙන මහත්තයෝ යළි ඉපදුණාද... ඉඩම ශුද්ධ කරලා තියෙන්නේ. බොහොම හොඳයි. මේ කන්නයේ වගා කරන්න ඕනෑ නැත්තම් ඉඩම ගන්නවා යැයි කියමින් දුරකථනය විසන්ධි කළාය.

අරුණ
2023 ජූලි 20 බ්‍රහස්පතින්දා
SPORT 12



ඡායාරූප - ක්‍රිෂාන් කාරියවසම්

# ශ්‍රී ලංකාවේ ඉරණම පන්දු යවන්නන් අත

■ චතුර රණසිංහ

ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ සිට...

ටෙස්ට් ලෝක ශූරතාව යටතේ ක්‍රියාත්මක සංචාරක පාකිස්තාන කණ්ඩායම සහ ශ්‍රී ලංකා කණ්ඩායම අතර පැවැත්වෙන ටෙස්ට් තරගාවලියේ ජයග්‍රහණය සඳහා ලකුණු 131ක ඉලක්කයක් හඹා යමින් සිටින පාකිස්තානය දිනය නිමාවන විට සිය පන්දුවාර 15 කදී කඩුලු 3ක් දැවී ලකුණු 48ක් ලබා සිටියේය.

ඒ අනුව අද (20 වැනිදා) පාකිස්තානයට ජයග්‍රහණය සඳහා තවත් ලකුණු 83ක් අවශ්‍ය වේ.

නොදැවී කඩුල්ලේ රැඳී සිටින ඉමාම් උල් හක් සහ බාබර් අසාම් පිළිවෙළින් ලකුණු 25ක් සහ ලකුණු 06ක් ලබා සිටී.

ලකුණු 131ක පහසු ඉලක්කයක් හඹා යෑමට පිටියට පිවිසි පාකිස්තාන පිතිකරණ බල ඇණියේ මුල් කඩුලු 3ක් ලකුණු 38කදී දවා ගන්නට ශ්‍රී ලංකා කණ්ඩායම සමත් විය. ඉන් කඩුලු 2ක්ම ප්‍රභාත් ජයසූරියගේ ගිණුමට බැරවිණි.

දිනය නිමාවන විට ශ්‍රී ලංකාවේ ප්‍රභාත් ජයසූරිය ලකුණු 17කට කඩුලු 2ක් දවාගෙන සිටී.

මෙය පාකිස්තානයට ඉතා පහසු ඉලක්කයක් වුවද මීට ඉහතදී එනම් 2018 වසරේදී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පැවැති ටෙස්ට් තරගයකදී ශ්‍රී ලංකාව පාකිස්තානයට එරෙහිව ලකුණු 136ක ඉලක්කයක් ආරක්ෂා කරගෙන තිබේ.

ගාල්ල පිටියේ පැවැති අවසන් තරග 5න් තරග 4ක් ශ්‍රී ලංකාව ජයගෙන ඇති අතර එහි එකම පරාජිත තරගයෙහි ප්‍රතිවාදීන් වී ඇත්තේද පකිස්තානයයි.

ඊයේ කිසිවෙකු නොදැවී ලකුණු 14ක් ලබා සිටියදී දිනය ඇරඹූ ශ්‍රී ලංකා ඉනිමේ මුල් පෙළ කඩුලු එකින් එක බිඳ හෙළන්නට පාකිස්තානයේ නෝමන් අලී සමත් විය. නිෂාන් මධුෂ්ක අන්තය බේරා ගනිද්දී අනෙක් අන්තයේ පන්දුවට පහරදුන් පිතිකරුවන් වූ කුසල් මෙන්ඩිස් සහ ඇන්ජලෝ මැතිව්ස් අලීට ගොදුරු විය.

මෙන්ඩිස් සහ මැතිව්ස් පිළිවෙළින් ලකුණු 18ක් සහ 07ක් රැස් කළහ. පාකිස්තාන ඉනිමේ විශිෂ්ට උඩ පන්දු රැකීම් ශ්‍රී ලංකා පිතිකරුවන්ට පිටියේ රිසි සේ ලකුණු රැස් කරන්නට ඉඩ නොදුන් අතර ඒ අනුව ශ්‍රී ලංකා ඉනිම වරෙක ලකුණු 175කට කඩුලු 6ක් ලෙස දැක්විණි. ප්‍රථම ඉනිමේ සේම නැවතත් සිය කණ්ඩායමේ වගකීම උරමත රඳවා ගත් ධනංජය ද සිල්වා, රමේෂ් මෙන්ඩිස් හා එක්ව ලකුණු 66ක සබඳතාවක් දියත් කළේය. එය ශ්‍රී ලංකා ප්‍රේක්ෂකයන්ට යම් බලාපොරොත්තුවක් එක් කළ නමුත් නව පන්දුව ලබා ගැනීමෙන් රමේෂ් - ධනංජය සබඳතාව බිඳ වැටිණි. නව සෙසු කඩුලු 3ම ලකුණු 28ක් තුළ බිඳ වැටිණි.

ශ්‍රද්ධාන්විත ඉනිමක් දියත් කළ ධනංජය ද සිල්වා හතරේ පහර 10ක් සහ හයේ පහර 2ක් සමගින් ලකුණු 82ක් රැස් කළේය. ඒ අනුව සමස්ත තරගයේදී ධනංජය ලකුණු 224ක් රැස්කර ගැනීම කැපී පෙනෙයි.

පන්දු යැවීමේදී පාකිස්තානයේ නව්මාන් අලී සහ අබ්‍රාර් අහමඩ් අතරේ කඩුලු 3 බැගින් බෙදී ගියේය.

තරගයෙන් අනතුරුව පැවැති මාධ්‍ය සාකච්ඡාවේදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා කණ්ඩායමේ පිතිකරණ පුහුණුකරු නවීඩ් නවාස් "අපිට මීට වඩා තව ලකුණු 100ක් විතර ගහන්න තිබ්බා කියලා මම හිතනවා. නමුත් ලැබුණු ලකුණු සංඛ්‍යාව ආරක්ෂා කර ගනිමින් අද (20 වැනිදා) පෙරවරුවේ කඩුලු 2ක් හෝ දවා ගන්නට අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා" යි පැවසුවේය.

# ලංකාවට පළමු පුහුණුව වරදී

දකුණු අප්‍රිකාවේ පැවැත්වෙන දැල්පන්දු ලෝක ශූරතාව ඉලක්ක කොටගෙන බොට්ස්වානා ජාතික කණ්ඩායම සමග පැවති පුහුණු තරගයෙන් ලකුණු 70-51ක පරාජයකට මුහුණ පෑමට ශ්‍රී ලංකාවට සිදුවිය.

තරගයේ පළමු කාර්තුවේදී ලකුණු 12-19ක් ලෙස බොට්ස්වානා පෙරමුණ ගත්තද, දෙවැනි කාර්තුවේදී සටන්කාමී තරග රටාවක නිරත වූ ශ්‍රී ලංකාව ලකුණු 16-13ක් වශයෙන් පෙරමුණ ගැනිණ. ඒ අනුව තරගයේ පළමු අර්ධය ලකුණු 32-28ක් ලෙස අවසන් විය.

කෙසේ වෙතත් තෙවැනි සහ සිවුවැනි කාර්තුවන්හිදී පිළිවෙළින් 13-15ක් සහ 10-23ක් වශයෙන් ඉදිරියක් ලබා ගැනීම හේතුවෙන් නියමිත කාලය අවසන්වන විට ලකුණු 70-51ක් ලෙස ජය බොට්ස්වානා කණ්ඩායම සතු විය.

මෙම පුහුණු තරගාවලියේ මීළඟ තරගය ලබන 23 වැනිදා පැවැත්වෙන අතර අනතුරුව 25 වැනිදා ඔවුන් බොට්ස්වානා සිට දකුණු අප්‍රිකාව බලා පිටත්ව යාමට නියමිතය.



# මැතිව් වේඩ් වෙනුවට බෙන් මැක්ඩර්මට් දඹුල්ලට?

මේ මස 30 වැනිදා සිට පැවැත්වීමට නියමිත ලංකා ප්‍රිමියර් ලීග් (එල්.පී.එල්.) ක්‍රිකට් තරගාවලියේ සිවුවැනි අදියරේදී දඹුල්ල කණ්ඩායම වෙනුවෙන් ඔස්ට්‍රේලියානු ක්‍රිකට් ක්‍රීඩක බෙන් මැක්ඩර්මට් එක්කර ගැනීම වෙනුවෙන් සාකච්ඡා පැවැත්වෙන බවට වාර්තා වේ.

දඹුල්ල කණ්ඩායම වෙනුවෙන් මීට පෙර එක් වීමට නියමිතව සිටි මැතිව් වේඩ්ගේ පුරප්පාඩුව වෙනුවට මැක්ඩර්මට් එක්කර ගැනීමට නියමිත බව සැලවේ.

ක්‍රීඩක ගිවිසුම අවසාන කිරීමේදී ඇති වූ ප්‍රමාද දෝශයක් හේතුවෙන් මැතිව් වේඩ් ලංකා ප්‍රිමියර් ලීගයට සහභාගි නොවන බවට දඹුල්ල කණ්ඩායමට දැනුවත් කර තිබිණි.

30 වැනිදා සිට පැවැත්වීමට නියමිත මෙවර එල්. පී. එල්. තරගාවලිය කොළඹ ආර්. ප්‍රේමදාස සහ මහනුවර පල්ලෙකැලේ ක්‍රීඩාංගණයන්හීදී පැවැත්වීමට නියමිතය.



# අන්තර් දිස්ත්‍රික් ඒකාබද්ධ පාසල් හොකී 26 දා සිට

■ ඉන්දුවාපා හේරත්

ශ්‍රී ලංකා පාසල් හොකී සංගමයේ සංවිධානයෙන් පැවැත්වෙන අන්තර් දිස්ත්‍රික් ඒකාබද්ධ පාසල් වයස අවුරුදු 20න් පහළ බාලක සහ බාලිකා හොකී තරගාවලියේ 56 වැන්න ලබන 26, 27, 28 සහ 29 යන දිනයන්හි මාතලේ එඩ්වඩ් සහ මාතලේ හින්දු විදුහල් ක්‍රීඩාංගණය කේන්ද්‍ර කරගනිමින් පැවැත්වීමට පියවර ගෙන තිබේ.

මෙවර තරගාවලියට අයැදුම්පත් භාර ගැනීම මේ මස 23 දින දක්වා සිදු කෙරේ. 2004 වසරේ ජනවාරි පළමුවැනිදා සිට 2009 දෙසැම්බර් 31දක්වා කාලය තුළ උපත ලබා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පමණක් මෙවර තරගාවලියට සහභාගි විය හැකි බව ශ්‍රී ලංකා පාසල් හොකී සංගමය නිවේදනය කර සිටී.

මෙරට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කෙරෙන එකම අන්තර් දිස්ත්‍රික් මට්ටමේ හොකී තරගාවලිය මෙය වන අතර ඒ සඳහා දිවයිනේ දක්ෂතම ක්‍රීඩක ක්‍රීඩිකාවන් තම පාසල අයත් දිස්ත්‍රික්කය නියෝජනය කරමින් තරග කිරීම විශේෂත්වයකි.

සියලුම අයැදුම්පත් අනුරුද්ධ හේරත් බණ්ඩාර, ලේකම්, ශ්‍රී ලංකා පාසල් හොකී සංගමය, විජය විද්‍යාලය, මාතලේ. යන ලිපිනයට යොමු කළ යුතුය.





# ඇමරිකාවට වැඩිය සෞදිය හොඳයි

ලොව බිහි වූ විශිෂ්ටතම පාපන්දු ක්‍රීඩකයකු වන ක්‍රිස්ටියානෝ රොනාල්ඩෝ පසුගිය දින ආන්දෝලනාත්මක ප්‍රකාශයක් සිදු කරමින්, ඇමරිකානු ප්‍රධාන (මේජර්) පාපන්දු ලීගයට වඩා සෞදි පාපන්දු ලීගයේ ගුණාත්මකභාවය වැඩි බවට ප්‍රකාශයක් කොට ඇත.

මාධ්‍යවේදීන් මෙසී - රොනාල්ඩෝ ගැටුම ඇමරිකාවේදී දැකගැනීමට හැකි වේවිද යන්න රොනාල්ඩෝගෙන් විමසා ඇති අවස්ථාවකදී රොනාල්ඩෝ මේ බව ප්‍රකාශ කොට ඇත.

38 හැවිරිදි සුපිරි ක්‍රීඩක රොනාල්ඩෝ ප්‍රකාශ කොට තිබුණේ යුරෝපීය පාපන්දු තරගාවලිවල ගුණාත්මකභාවය කෙමෙන් කෙමෙන් අඩු වෙමින් පවතින බවටත් තරගාවලියේ තත්වය රැකගත් එකම යුරෝපීය පාපන්දු ලීගය වන්නේ එංගලන්ත ප්‍රිමියර් ලීගය පමණක් බවටයි.

එංගලන්ත ප්‍රිමියර් ලීගය ලොව අනෙක් තරගාවලීන්ට සාපේක්ෂව සැලකියයුතු ඉදිරියකින් ඇති තරගාවලියක් බවත් රොනාල්ඩෝ මෙහිදී ප්‍රකාශ කළේය. තමන් සෞදි පාපන්දු ලීගයට පාර විවර කර දුන් බව කී රොනාල්ඩෝ එළැඹෙන වසර වන විට ලොව සුපිරි පාපන්දු ක්‍රීඩකයන් රාශියක් සෞදි පාපන්දු ලීගයේ ක්‍රීඩා කරනු ඇති බවත් ප්‍රකාශ කර තිබේ.

ඒ අනුව ඇමරිකානු මේජර් ලීගයට වඩා සෞදි ලීගය ඉදිරියෙන් බව පවසා ඇති හෙතෙම තමන් යුරෝපීය පාපන්දු කණ්ඩායමක් සමඟින් ඉදිරියේදී ගිවිසුම්ගත නොවන බව සියයට සියයක් විශ්වාස යැයිද වැඩිදුරටත් පවසා ඇත.

කෙසේවෙතත් රොනාල්ඩෝගේ මෙම ප්‍රකාශයෙන් පැය 24ක් යෑමටත් පෙර ඔහු ක්‍රීඩා කරන අල් නසාර් පාපන්දු සමාජය ස්පාඤ්ඤ පාපන්දු සමාජයක් වන කෙල්ටා විගෝ කණ්ඩායම හමුවේ 5-0ක් ලෙස පරාජය වීමත් විශේෂත්වයක්.



# සීෂෙල්ස් කාන්තා හා පිරිමි වොලිබෝල් කණ්ඩායම් දිවයිනට

තරග සංචාරයක් සඳහා සීෂෙල්ස් දිවයිනේ කාන්තා සහ පිරිමි වොලිබෝල් කණ්ඩායම් ඊයේ (19) මෙරටට පැමිණියහ. මෙම කණ්ඩායම් ජූලි මස 19 වන දින සිට ජූලි මස 23 වන දින දක්වා ශ්‍රී ලංකා වොලිබෝල් කණ්ඩායම් රාශියක් සමඟින් කොළඹ කේන්ද්‍ර කරගනිමින් තරඟ කිරීමට නියමිතය.

මේ අතර අද (20) දිනයේදී සීෂෙල්ස් කාන්තා කණ්ඩායම නාවික හමුද කාන්තා කණ්ඩායම සමඟ සවස 3ට කොළඹ සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයේදී තරඟ වැදීමට නියමිතයි. අද පස්වරු 5.00ට කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී සීෂෙල්ස් පිරිමි කණ්ඩායම ලංකා විදුලිබල පිර්ටිමි වොලිබෝල් කණ්ඩායමට එරෙහිවත් තරඟ වදිනු ඇත.

තරඟාවලිය මේ මස 21,22,23 දිනවලදීත් කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී පැවැත්වෙන අතර කාන්තා තරඟ පස්වරු 3.00ටත් පිරිමි තරඟ පස්වරු 5.00ටත් පැවැත්වීමට නියමිතය. ඒ 21 වැනි දින ශ්‍රී ලංකා ගුවන් හමුද කාන්තා සහ පිරිමි කණ්ඩායම්වලට එරෙහිවත් 22 දින ශ්‍රී ලංකා යුධ හමුද කාන්තා සහ පිරිමි කණ්ඩායම්වලටත් එරෙහිවයි. එමෙන්ම 23 වන දින සීෂෙල්ස් ජාතික කණ්ඩායම් ශ්‍රී ලංකා ජාතික වොලිබෝල් කණ්ඩායම්වලට එරෙහිවත් තරඟ වැදීමට නියමිතය.

# වික්ටෝරියා පොදුරාජ්‍ය මඬුලු ක්‍රීඩා උළෙල වැට උඩ?

අරමුදල් සපයා ගැනීමේ සහ කළමනාකරණ ගැටලු හේතුවෙන් ලබන 2026 වසරේදී ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියාහිදී පැවැත්වීමට නියමිතව තිබූ පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සත්කාරකත්වයෙන් ඉල්ලා අස්වන බව වික්ටෝරියා ප්‍රාන්ත අගමැති ඩැනියෙල් ඇන්ඩෲස් නිවේදනය කළේය.

ජීලොන්, බෙන්ඩිගෝ ඇතුළු නගර ආශ්‍රිතව පැවැත්වීමට නියමිතව තිබූ මෙම උත්සවය සඳහා ඔස්ට්‍රේලියානු ඩොලර් බිලියන 2.6ක් වැය වනු ඇති බවට එවකදී වික්ටෝරියා ප්‍රාන්ත රජය නිර්දේශ කර තිබිණි.

නමුත් දැන් එම දින 12ක තරගාවලිය සඳහා ඔස්ට්‍රේලියානු ඩොලර් බිලියන 6කට වඩා වැඩි මුදලක් වැය වෙතැයි අපේක්ෂා කරන බව ප්‍රාන්ත අගමැති ඇන්ඩෲස් මාධ්‍ය සාකච්ඡාවක් කැඳවමින් ප්‍රකාශ කර තිබේ. මෙම නව අගය වික්ටෝරියා ප්‍රාන්තයට ලැබෙන ඇස්තමේන්තුගත ආර්ථික ප්‍රතිලාභය මෙන් දෙගුණයකටත් වඩා වැඩි බව වාර්තා වේ.

ඒ හේතුවෙන් ඔවුන් මෙම සත්කාරකත්වයෙන් ඉවත් වන බවට වාර්තා වී තිබේ. නමුත් මුළුමනින්ම මෙම සත්කාරකත්වයෙන් ඔස්ට්‍රේලියාව ඉවත් වන බවට තවම නිල නිවේදනයක් නිකුත් කර නොමැත.

# ලෝකඩ දිනූ දිනේෂ් සහ සමිත ලංකාවට

■ කටුනායක - ටී.කේ.ජී. කපිල

ප්‍රංශයේ පැවති ලෝක ශූරතා පැරා මලල ක්‍රීඩා තරගාවලියේදී ලෝකඩ පදක්කම් දිනූ දිනේෂ් ප්‍රියන්ත සහ සමිත දුලාන් ඊයේ (19 වැනිදා) උදෑසන කටුනායක ගුවන් තොටුපළ වෙත පැමිණියේය.

ඉකුත් 07 වැනිදා සිට 17 වැනිදා දක්වා ප්‍රංශයේ පැරිස් නුවර පැවැති අදාළ තරගාවලිය සඳහා රටවල් 106ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගි විය.

එහිදී ටී.46 කාණ්ඩයෙන් දිනේෂ් ප්‍රියන්ත සහභාගි වූ අතර ටී.44 කාණ්ඩයෙන් සමිත දුලාන් තරගාවලිය සඳහා ඉදිරිපත් වූයේය.

මොවුන් පිළිගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ ව්‍යාපෘති නිලධාරි ගාමිණී කොස්තා, ජාතික පැරා ඔලිම්පික් කමිටුවේ සභාපති දීපාල් හේරත් ඇතුළු එම කමිටුවේ සාමාජිකයන් මෙන්ම ශ්‍රී ලංකා යුද හමුද ක්‍රීඩා කමිටුවේ නිලධාරීන් පිරිසක් ද කටුනායක ගුවන් තොටුපළ විශේෂ අමුත්තන්ගේ මැදිරිය වෙත පැමිණ සිටියහ.



කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින් මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# මාළු ඇයි මේ තරම් ගණන්
## නාරා ආයතනය හේතුව කියයි

■ සාලිය කුමාර ගුණසේකර

මෝසම් සුළං සක්‍රීය නොවීම මෙරට මුහුදු කලාපය ආශ්‍රිතව මත්ස්‍ය අස්වැන්න විශාල ලෙස අඩුවීමට බලපෑ බව ජාතික ජලජ සම්පත් පරේයේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනයේ (නාරා) සඳහන් කරයි.

මෝසම් තත්වය මෙවර සක්‍රීය නොවීම දිවයිනේ වර්ෂාපතන තත්වය අඩුවීමටද බලපා තිබේ.

මත්ස්‍ය අස්වැන්න අඩුවීම මත මත්ස්‍ය මිල ගණන්ද විශාල ලෙස ඉහළ ගියේය.

ජාතික ජලජ සම්පත් පරේයේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනයේ (නාරා) සමුද්‍රජීව විද්‍යා සම්පත් අංශයේ ප්‍රධානි ආචාර්ය ප්‍රභාත් ජයසිංහ කියා සිටියේ මෝසම් තත්වය පැමිණීමට ප්‍රමාද වීම මත්ස්‍ය අස්වැන්න අඩුවීමට බලපෑ බවය. එමෙන්ම, මුහුදු ජලයේ මතුපිට උෂ්ණත්වය ඉහළ යෑමද මත්ස්‍ය අස්වැන්න අඩුවීමට බලපෑ බවද ඔහු කියා සිටියේය.

මෝසම් සුළං සක්‍රිය වීමත් සමග මුහුදු ජලය කැලඹීමට ලක්වන අතර, එහිදී මුහුද අභ්‍යන්තරයේ තිබෙන පෝෂණ ද්‍රව්‍ය ඉහළට පැමිණේ. මේ නිසා මෙම පෝෂණ ද්‍රව්‍ය මත්ස්‍යයන් ආහාරයට ගැනීමට සහ මත්ස්‍යයන්ගේ බෝවීමට පහසු වන බවද ආචාර්ය ප්‍රභාත් ජයසිංහ කීවේය.

මෝසම් තත්වය මෙවර ප්‍රමාදවීමත් සමග මුහුදු ජලය කැලඹීම අඩුවිය.

මුහුදු ජලය කැලඹීමට ලක්වන විට සාගර අභ්‍යන්තරයේ පෝෂණ ද්‍රව්‍ය ඉහළට පැමිණීමත් සමග හරිතප්‍රද වර්ධනය වීම සිදුවන බවත්, මෙලෙස මුහුදු ජලය කැලතෙද්දී මුහුද අභ්‍යන්තරයේ උෂ්ණත්වය අඩු වුවත්, මත්ස්‍යයන් ඉහළට පැමිණීම සිදුවන බවද ඔහු සඳහන් කළේය.

මත්ස්‍යයන් වර්ධනය සඳහා මුහුදු ජලයේ මතුපිට උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 28 ක පැවතිය යුතු වුවද, පසුගිය දිනවල උෂ්ණත්ව සෙන්ටිග්‍රේඩ් අංශක 30 ක් දක්වා වැඩිවූ බවට ජාතික ජලජ සම්පත් පරේයේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය (නාරා) නිරීක්ෂණය කර තිබිණි.

කෙසේ නමුත්, මේ දිනවල යළි මෝසම් තත්වය සක්‍රීය වෙමින් පවතින බවද, ලංකාව ආශ්‍රිතව මත්ස්‍ය බිම් තිබෙන බවට යළි පුරෝකථනය කර ඇතැයිද ආචාර්ය ප්‍රභාත් ජයසිංහ පැවසුවේය.

මේ දිනවල මෝසම් තත්වය යම් මට්ටමක පැවැතියද, මෝසම් සුළං එතරම් සක්‍රීය නොමැති බවද, මේ නිසා වර්ෂාපතනයේ අඩුවීමක් තිබෙන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

මෝසම් සුළං සක්‍රීය නොවන විට දියවැල්වල වේගය අඩුවන බවද එම දෙපාර්තමේන්තුව කියයි.

01 වැනි පිටුවෙන්...

## ජෙරොම්ට සල්ලි දුන්...

'මිරකල් ඩෝම්' සම්මන්ත්‍රණ ශාලාව සඳහා රුපියල් කෝටි 250කට අධික මුදලක් පරිත්‍යාග කළ බව කියන දහතුන්දහසකගෙන් ප්‍රකාශ ලබාගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත.

මේ සඳහා මුදල් ආධාර ලබාදුන් පුද්ගලයන්ගේ ලේඛන නීතිවිරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය වෙත ලබාගෙන ඇත. මෙකී ලේඛන හා දත්ත මේ වන විටත් විශ්ලේෂණය කරමින් සිටින බවත් 'ඉන්ටර්නැෂනල් පේමන්ට් ගේට්වේ' වෙබ් අඩවිය හරහා 2018 සිට මෙම වසරේ මාර්තු 31 දක්වා මුදල් ලබාදුන් අය ගැන විමර්ශනය කරන බවත් හෙළි වී තිබේ.

රුපියල් මිලියන 92කට ආසන්න මුදලක් ගෙවා පර්චස් 450ක කටුනායක ඉඩම තමා මිලදී ගත් බවත් ජෙරම්, ප්‍රනාන්දු දේවගැතිවරයාගේ දේශනව ලට සහභාගි වී තමාගේ සියලු රෝගී තත්ත්වයන් සුව වූ නිසා මෙම ඉඩම මිරකල් ඩෝම් සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමට ත්‍යාගයක් ලෙස දුන් බව හැන්ඩ්ස් ඉන්ටර්නැෂනල් හිමිකරු වූ ග්‍රේෂන් කිංස්ලි ගුණවර්ධන පවසා ඇත. මේ වන විට තමාගේ ආදායමෙන් සියයට දහයක ප්‍රමාණයක් මෙම මිරකල් ඩෝම් සභාවට පරිත්‍යාග කරන බවත් හෙතෙම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පවසා තිබේ.

අවුරුදු තිහක් තිස්සේ මගේ ලේවල සුව නොවූ තත්ත්වයක් ප්‍රොපට් ජෙරම් සුව කළා. ඒ විශ්වාසයට මම කටුනායක ඉඩම් දෙක පරිත්‍යාග කළා. එයාව ජෙරුසලම් පවා එක්ක ගියා. අවශ්‍ය නම් විශ්වාසය වෙනුවෙන් දෙවියන් වහන්සේ උදෙසා තව දේපළ පරිත්‍යාග කරන බව ව්‍යාපාරික ග්‍රේෂන් කිංග්ස්ලි ගුණවර්ධන 'අරුණ' කළ විමසුමකදී පැවැසීය.

## ළමයින් හා කාන්තාවන්...

මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් සහ කාන්තාවන් අතරින් වැඩිම පිරිසක් සිටින්නේ බස්නාහිර පළාතේ ය. එම දරුවන් සංඛ්‍යාව අසූ පන්දහස් අටසිය හතළිස් හතක් වන අතර කාන්තාවන් සංඛ්‍යාව එක් ලක්ෂ අනූ හය දහස් එකසිය අනූ හතකි. දහත් දහස් එකසිය අසූවක් වන අඩුම දරුවන් පිරිස සිටින්නේ සබරගමුව පළාතේ වන අතර අඩුම කාන්තාවන් පිරිස වන විසි අටසිය අසූ තුනක් සිටින්නේ උතුරු පළාතේ ය.

වයඹ පළාතේ අවරුදු පහට අඩු දරුවන් හතළිස් හත් දහස් හත්සිය හැට පස් දෙනෙක් ද දකුණු පළාතේ තිස් හත් දහස් තිස් දෙදෙනෙක් ද මන්ද පෝෂණයෙන් පෙළෙන අතර මධ්‍යම පළාතේ තිස්දහස් තුන්සිය අනූ තුන් දෙනෙක් හා නැගෙනහිර පළාතේ විසි හත් දහස් දෙසිය අසූ දෙනෙක් ද මන්දපෝෂණයෙන් පෙළෙති. උතුරු මැද පළාතේ එම සංඛ්‍යාව දහනව දහස් හැට හතක් වන අතර ඌව සහ උතුරු යන පළාත්වල එම සංඛ්‍යාව පිළිවෙළින් දහ අටදහස් දෙසිය හැත්තෑ අටක් සහ දහත්දහස් නවසිය හතරකි.

මධ්‍යම පළාතේ කාන්තාවන් එක් ලක්ෂ විසි හය දහස් නවසිය හැත්තෑ හය දෙනෙක්ද දකුණු පළාතේ හැත්තෑ නව දහස් දෙසිය පනස් හතර දෙනෙක් ද මන්දපෝෂණයෙන් පෙළෙන බවත් එම පිළිතුරේ සඳහන්ව තිබේ. දකුණු පළාතේ මන්දපෝෂණයෙන් පෙළෙන කාන්තාවන් සංඛ්‍යාව හැත්තෑ නව දහස් දෙසිය පනස් හතරකි. වයඹ පළාතේ එම සංඛ්‍යාව හැට අට දහස් හත්සිය හැට තුනක් වන අතර සබරගමුව පළාතේ එම සංඛ්‍යාව පනස් හතර දහස් තුන්සිය අනූ හතරකි. ඌව, නැගෙනහිර සහ උතුරු මැද යන පළාත්වල එම සංඛ්‍යාව පිළිවෙළින් හතළිස් හය දහස් එකසිය හැත්තෑ පහක්, තිස් නව දහස් හයසිය තිස්එකක් සහ තිස් අට දහස් අටසිය හැට නවයකි.

මේ බව සඳහන් වන්නේ කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී සමන්ප්‍රිය හේරත් විසින් අසන ලද ප්‍රශ්නයකට සෞඛ්‍ය අමාත්‍යාංශය දුන් පිළිතුරක ය.

## සෑම පැමිණිලිකරුවකුගේම...

ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ පැමිණිලි භාර නොගැනීම ඇතුළු හේතු දෙකක් සම්බන්ධයෙන් යැයි එම කොමිෂන් සභාව පොලිස්පති සී.ඩී. වික්‍රමරත්නට ඊයේ (19වැනිදා) ලිඛිතව දැනුම් දී තිබේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් තමරා ඩී. පෙරේරා විසින් පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න වෙත යවන ලද එම ලිපියේ වැඩිදුරටත් සඳහන් කර තිබුණේ හඳුනාගත් එකී ගැටලු පිළිබඳ සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන් හරහා පොලිස් නිලධාරීන් දැනුවත් කරන ලෙසය. කොමිෂන් සභාව වෙත ලද පැමිණිලි විමර්ශනය කිරීමේදී පොලිස් නිලධාරීන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත චෝදනා එල්ල වී ඇත්තේ සාමය කඩවීම් හා ඊට ආසන්න ආරවුල් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගැනීමෙන් බව නිරීක්ෂණය වී තිබෙන බවත් මෙම ලිපියේ සඳහන්ය.

ප්‍රාථමික නඩු විධාන සංග්‍රහයේ 66 වැනි වගන්තියට අනුව එවන් සාමය කඩවීම් පිළිබඳ ආරවුල් ස්ථානාධිපතිවරයා විසින් පුද්ගලිකව සොයා බලා ඒ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකිරීම තම විමර්ශන නිලධාරීන් ලවා සිදුකළ යුතු වුවත් ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැති බවද එහි සඳහන්ව ඇත. මේ සම්බන්ධයෙන් මසකට වරක් ප්‍රගතිය සමාලෝචනය කිරීම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් වෙත පවරන ලෙසත් මසකට වරක් අධිකරණයේ ගොනුකරන නඩුකර ගැන මාස තුනකට වරක් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලෙසත් පොලිස්පතිවරයාට දැනුම් දී තිබේ.

එසේම පොලිසිය පැමිණිලි භාර නොගැනීම සම්බන්ධයෙන් වන චෝදනා නිසා සෑම පොලිස් ස්ථානයකටම පැමිණෙන පුද්ගලයන්ගේ තොරතුරු ඇතුළත් ලේඛනයක් යථාවත් කරන ලෙසත් පොලිස් 27 පෝරමයද පැමිණිලිකරුවන් වෙත ලබාදෙන ලෙසත් මෙම ලිපිය මගින් තවදුරටත් උපදෙස් දී තිබේ.


අඟහරුවාදා දිනුම් ඇදීම 2023.07.18 www.nlb.lk
National Lotteries Board NLB

මහජන සම්පත — දිනුම් වාරය : 5179 — රු. 23,273,408.00
ජයග්‍රාහී අක්ෂරය W — ජයග්‍රාහී අංක 2 0 8 2 5 3

ගොවිසෙත — දිනුම් වාරය 3421 — රු. 69,527,718.00
ඉංග්‍රීසි අක්ෂරය X — ජයග්‍රාහී අංක 26 31 32 57

Lucky 7 — දිනුම් වාරය 0005 — ජයග්‍රාහී අංක 3 1 0 0 4 0 — LT අංක 0 3 — රු. 10,095,950.24

ධන නිධානය — 1209 — රු. 100,533,703.20
B — 01 09 45 64 — B

හඳහන — දිනුම් වාරය 488 — රු. 3,530,763.00
ජයග්‍රාහී අංක 04 06 08 54

Mega Power — 1527 — Rs. 401,512,616.00
J 08 01 28 38 47
රු. 10,000,000.00
රු. 10,000,000.00


01 වැනි පිටුවෙන්...

## මසකට ලක්ෂ 50...

මෙම නඩුව ඊයේ කොළඹ මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැඳිගේ ඉදිරියේ කැඳවනු ලැබූ අවස්ථාවේදී විත්තිකරුවන් අධිකරණයේ පෙනී සිටි අතර ඔවුන් ඉදිරියේ නීතිපතිවරයා විසින් ගොනුකර තිබූ සංශෝධිත අධිචෝදනා පත්‍රය කියවනු ලැබීය. එහිදී විත්තිකරුවන් ප්‍රකාශ කළේ තමන් අදාළ චෝදනාවන්ට වරද පිළිගන්නා බවයි.

ඊට අමතරව මාසිකව රුපියල් ලක්ෂ 50 බැගින් වාරික විස්සකින් තමන් මුදල් ගෙවා අවසන් කිරීමට සූදානම් බවත් විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් අධිකරණයට දැනුම් දුන්හ.

ඒ අනුව ඊයේ දින රුපියල් ලක්ෂ 50ක මුදලක් අධිකරණයේ තැන්පත් කරන බවත් ඔවුන් විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව විත්තිකරුවන් වරදකරුවන් කළ මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැඳිගේ මහතා අදාළ මුදල් ගෙවීමට අවසර දුන් අතර නඩුව නැවත අගෝස්තු මස 24 වනද කැඳවන ලෙසත් නියෝග කළේය.

මෙසේ තැන්පත් කරනු ලබන මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සකස් කරනු ලබන වැඩපිළිවෙළක් හරහා තැන්පත්කරුවන්ට ගෙවීමට කටයුතු කරන බවත් මීට පෙර අධිකරණය හමුවේ සාකච්ඡා වී තිබිණි.

2006 වසරේ ජනවාරි පළමු වැනිද සහ 2008 වසරේ සැප්තැම්බර් තුන් වැනි ද අතර කාලසීමාව තුළ නුගේගොඩ ප්‍රදේශයේ සක්විති හවුසිං ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් නමින් මූල්‍ය සමාගමක් පවත්වාගෙන ගොස් රුපියල් 164,185 000 මුදලක් වංක ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් සක්විති රණසිංහ සහ ඔහුගේ බිරිඳට එරෙහිව නීතිපතිවරයා විසින් මෙම සංශෝධිත චෝදනා පත්‍රය ඉදිරිපත් කර තිබිණි.

## බීමත් රියැදුරා...


ගිනි තැබූ යතුරුපැදිය

දියතලාව පොලිසියේ රථවාහන අංශයේ ස්ථානාධිපතිවරයා වශයෙන් කටයුතු කරන උප පොලිස් පරීක්ෂකවරයකුට අයත් යතුරු පැදියක් මෙසේ රැගෙන ගොස් ගිනි තබා ඇති බව පොලිසිය කියයි.

රාත්‍රි අමුත්තන්ගේ මෙහෙයුම් රාජකාරියේ යෙදී සිටින අතරතුර බීමත් ත්‍රිරෝද රියදුරකු දියතලාව නගරයේ දී අත්අඩංගුවට ගෙන තම යතුරුපැදිය එම ස්ථානයේ නවතා අත්අඩංගුවට ගත් ත්‍රිරෝද රථය උප පොලිස් පරීක්ෂකවරයා පොලිසියට රැගෙන ගොස් තිබේ.

පසුව නැවත යතුරු පැදිය ගෙන ඒමට ගියද එම ස්ථානයේ එය තිබී නැත. සොයා බැලීමේදී එය දියතලාව ගල්කන්ද ප්‍රදේශයේ ගිනි තබා තිබියදී හමු වූ බව පොලිසිය කියයි.

යතුරුපැදිය මුළුමනින්ම ගිනිගෙන විනාශ වී තිබූ බවද පොලිසිය කියයි.

යතුරු පැදිය පැහැරගෙන ගිනිතබා විනාශ කළ පුද්ගලයන් සොයා කඩිනම් විමර්ශනයක් ආරම්භ කළ බවද දියතලාව පොලිසිය කියයි.

## සුදු කබර සුව කරනවැයි කියා...

කාන්තාවකට සුදුවීමට බෙහෙතක් දෙන බව පවසා රුපියල් ලක්ෂ 03ක මුදලක් වංචා කරන ලදැයි කියන විශේෂඥ වෛද්‍යවරයකුට එරෙහිව විමර්ශනයක් ආරම්භ කර ඇතැයි වැලිකඩ පොලිසිය අධිකරණයට ඊයේ (19 වැනිද) දන්වා සිටියේය.

අංගොඩ ප්‍රදේශයේ පදිංචි යුද හමුද කපිතාන්වරයකුගේ බිරිඳක් රවටා මුදල් වංචා කරන ලදැයි කියන රාජගිරිය උද්‍යාන පාර ප්‍රදේශයේ පුද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන විශේෂඥ වෛද්‍යවරයකු සම්බන්ධයෙන් එලෙස විමර්ශන පවත්වන බව පොලිසිය, කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය වෙත දන්වා සිටියේය.

පැමිණිලිකාර යුද හමුද කපිතාන්වරයාගේ බිරිඳට සුදු කබර රෝගය සෑදී ඇති බව දන්වා සිටි පොලිසිය ඒ පිළිබඳව ප්‍රතිකාර ගැනීමට පැමිණිලිකරු හා ඔහුගේ බිරිඳ විශේෂඥ වෛද්‍යවරයා හමුවී ඇතැයි දන්වා සිටියේය.

සුදු කබර රෝගය නිට්ටාවටම සුව කිරීමට තමාට හැකි බවත් ඒ සඳහා එන්නතක් විදීමට රුපියල් ලක්ෂ 03ක මුදලක් අවශ්‍ය වන බව විශේෂඥ වෛද්‍යවරයා පැමිණිලිකරුට සහ ඔහුගේ බිරිඳට එහිදී දැනුම් දී තිබේ.

එම රුපියල් ලක්ෂ 03ක මුදල අවස්ථා 02කදී විශේෂඥ වෛද්‍යවරයාට පැමිණිලිකරු විසින් ලබා දී ඇතැයි පොලිසිය දන්වා සිටියේය.

නමුත් අදාළ එන්නත විශේෂඥ වෛද්‍යවරයා විසින් ලබා නොදීම හේතුවෙන් පැමිණිලිකරු මුදල් ඉල්ලා තිබෙන බවත් එහිදී වෛද්‍යවරයා අගරු චෙක්පතක් පැමිණිලිකරුට දී තිබෙන බවත් පොලිසිය දන්වා සිටියේය.

කාන්තාවක් සම්පූර්ණයෙන්ම සුදු වීමට තිබෙන බෙහෙතක් හෝ තම බිරිඳට ලබාදෙන ලෙසට පැමිණිලිකරු වෛද්‍යවරයාගෙන් ඉල්ලා සිටියද එම ඉල්ලීමද ඉටු කර නොදුන් හෙයින් පැමිණිලිකරු පොලිසියට පැමිණිලි කර ඇතැයි වැලිකඩ පොලිසිය අධිකරණයට දන්වා සිටියේය.

මෙම විශේසඥ වෛද්‍යවරයා සම්බන්ධයෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ සහ ණය ආපසු අය කර ගැනීමේ පනත යටතේ විමර්ශනයක් පවත්වන බවද පොලිසිය අධිකරණයට දන්වා සිටියේය.

## සිඟිත්තාගේ බෙල්ලට...

පොලිස් හදිසි ඇමතුම් අංකයට මදුරන්කුලිය ජින්නාවත්තේ සංඛ නමැත්තකු කාන්තාවකට පහර දෙන බවට ලද තොරතුරක් මත පොලිසියේ දෙදෙනකු එහි පිටත්ව ගොස් ඇත.

එහිදී සංඛ නමැත්තා පොලිස් නිලධාරීන් දෙදෙනාට පිහියකින් ඇනීමට තැත් කර එහි ගිය කොස්තාපල් අම්ස්ඩි (37772) නමැති අයයට පහරදී නිල ඇඳුම් ඉරා දමා තිබේ.

මෙම සිද්ධිය පොලිස් ස්ථානයට දැන්වීමෙන් පසුව පොලිස් නිලධාරීන් පිරිසක් සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. එහිදී එතැනට රැස්වූ ජින්නාවත්තේ පිරිසක් පොලිසියට විරෝධය පා සැකකරු මුදාගෙන ඇත.

මෙය සැලවී තවත් පොලිස් කණ්ඩායමක් එම ස්ථානයට පැමිණ සැකකරු නැවත අත්අඩංගුවට ගැනීමට උත්සාහ කර තිබේ.

එහිදී සැකකරු විසින් වයස අවුරුදු තුනහමාරක දරුවා තමා සන්තකයට ගෙන මන්නා පිහියකින් කපා දරුවාගේ පිට ප්‍රදේශය තුවාල සිදු කර ඇත.

මෙහිදී පොලිස් නිලධාරීන් දරුවා සැකකරුගෙන් බේරාගෙන දරුවා සහ සිද්ධියෙන් තුවාල ලද කොස්තාපල් අම්ස්ඩි පුත්තලම රෝහලට ඇතුළත් කර ඇත.

සැකකරු හා ඔහුව පොලිස් භාරයෙන් මුදගැනීමට කටයුතු කළ සිව් දෙනෙකුද මදුරන්කුලිය පොලිසිය අත්අඩංගුවට ගෙන තිබේ.

## බස් අනතුර නරඹන්න ආ...

දෙමෝදර ප්‍රදේශයේ පදිංචි මැදි වයසේ පසුවන කාන්තාවක් වන ඇය උදෑසන තම නිවසට අවශ්‍ය බඩුබාහිරාදිය රැගෙන ඒමට වෙළෙඳ සැලකට ගොස් නිවසට යමින් සිටින අතරතුර එම අනතුර ආරංචි වී එහි ගොස් තිබේ.

මෙම කාන්තාව එම ස්ථානයට යන අවස්ථාවේ බදුල්ල මහ රෝහලේ ගිලන් රථ පැමිණ තුවාලකරුවන් වහා රෝහල් කරා ගෙන යාමට පටන් ගෙන තිබූ අතර, කම්පනයට පත්ව පසෙකට වී සිටි මෙම කාන්තාවද බස්රථයේ පැමිණ තුවාල ලැබූ තැනැත්තියක් යැයි සිතා ගිලන් රථයක දමාගෙන බදුල්ල මහ රෝහලට රැගෙන ගොස් තිබේ.

බදුල්ල මහ රෝහලට ගොස් ගිලන් රථයෙන් බැස බාහිර රෝගී අංශයේදී විමතියට පත්ව සිටි ඇයගෙන් ප්‍රශ්න කිරීමේදී ඇය තමන්ට වූ සිද්ධිය පවසා ඇති අතර, පසුව රෝහල් පරිශ්‍රයේ සිටි පිරිසක් ඇයට දෙමෝදර යාමට මුදල් දී පිටත්කර යවා තිබේ.


අවමංගල්‍ය දැන්වීමයි

උපත 1958 07 29



මරණය 2023 07 18

එම්.ඒ. මිල්ටන් සුනිල් පෙරේරා මහතා


# දිනපොත

## කඩවලගෙදර විමලරතන නාහිමිට අක්ත පත්‍ර ප්‍රදානය 23දා

මල්වතු මහා විහාර පාර්ශ්වයේ සත්කෝරළ මහ දිශාවේ උප ප්‍රධාන අධිකරණ සංඝනායක ධුරයෙන් පිදුම් ලබන රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති කඩවලගෙදර විමලරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේට ශ්‍රී සන්නස් පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවය මෙම 23 වැනි ඉරුදින ප.ව:2.30ට මල්වතු මහා විහාරයේ දී සිදු කෙරේ. උන් වහන්සේ පිළිගැනීමේ උත්සවය 24 වැනි සඳු දින ප.ව: 2.30ට කොළඹගම මියුගුණාරාම රාජමහා විහාරයේ දී සිදු කෙරේ.

## මෙත්තානුසාරී හා ධම්මානන්ද හිමිවරු උපසම්පදා ලබති


කිරිඉබ්බන්ආරේ මෙත්තානුසාරී හිමි


රන්සෑගොඩ ධම්මානන්ද හිමි

ගාල්ල, දඩල්ල මහමුදලින්දරාමය, කොළඹ 15, මෝදර ශ්‍රී බෝධිසමුද්‍රාරාමය යන උභය විහාරාධිපති, කොළඹ 03, කොල්ලුපිටිය ශ්‍රී ධර්මකීර්ති මූලික පිරිවෙනේ නියෝජ්‍ය පරිවේණාධිපති, ශාස්ත්‍රපති තුඹේ උපනන්ද හිමිපාණන් වහන්සේගේ ශිෂ්‍ය කිරිඉබ්බන්ආරේ මෙත්තානුසාරී සහ රන්සැගොඩ ධම්මානන්ද සාමණේර හිමිවරු දෙනම ජූලි මස 19 වැනි දින බලපිටිය කප්පින වලව්ව ආසන්න මාදුගඟ ස්වේජින් සීමා මාලකයේ දී අධිසීල සංඛ්‍යාත සුපරිශුද්ධ උපසම්පදවේ පිහිටුවනු ලැබූහ.

එලෙස අභිනවයෙන් උපසම්පද සීලයෙහි පිහිටුවනු ලැබූ පොඩි හාමුදුරුවන් වහන්සේ දෙනම පිළිගැනීමේ මහා පිංකම ජූලි මස 23 වන ඉරිද සවස 3.00ට ගාල්ල දඩල්ල මහමුදලින්දරාම විහාරස්ථානයේ දී සිදු කෙරේ.

## හන්තාන සංචාරක වන උද්‍යානය අද විවෘත කෙරේ

හන්තාන ජාතික මූලික අධ්‍යයන ආයතනයට අයත් "පොපම් ආබරේටම්" සංචාරක වන උද්‍යානය අද (20 වැනිද) විවෘත කිරීමට නියමිතය.

මෙම වන උද්‍යානය දඹුල්ල සිට කණ්ඩලම මාර්ගයේ කිලෝමීටර් දෙක හමාරක් පමණ දුරින් පිහිටා ඇත.

පරිසර ඇමැති නසීර් අහමඩ්,පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ ඇතුළු ආරාධිතයන්විසින් මෙය විවෘත කිරීමට නියමිතය.

## වැඩකරන අම්මලාට...

වැඩට යන දෙමාපියන්ට සහනදයි වෙනසක් මවුකිරි දෙන්න සවියක් යන තේමාවෙන් ලෝක මවුකිරි දීමේ දිනයට සමගාමීව ඊයේ [ 19 ] පවුල් සෞඛ්‍ය කාර්යාංශය සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය හා එක්ව සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේදී විශේෂ මාධ්‍ය හමුවක් පැවැත්විණ. එහිදී ඇය මෙලස කියා සිටියාය.

මෙලස කිරි පැය දෙකක් හිමිවන බව බොහෝ දෙනා නොදැන සිටි කරුණක් බවත් එලස පැය දෙකක කාලයක් හිමිවී තිබුණේ 2018 වසරේ සිදුකළ සංශෝධනයක ප්‍රතිඵලයක් ලෙසින් බවත් ඇය කියා සිටියාය.

ඒ අනුව අදාළ මවගේ සේවා කාලය තුළ ඕනෑම පැය දෙකක් දරුවාට කිරි දීම සඳහා යාමට ඉඩ ලබාදීමට සේවා යෝජකයා බැඳී සිටී.

උදෑසන රාජකාරිය ආරම්භ වන වෙලාවට පැයක් පසුව සහ රාජකාරි අවසන් වන වෙලාව ට පැයක් පෙර මෙලස කිරි ලබාදීමේ පැය දෙක ලබාගැනීමට හැකිය.

එසේත් නොමැතිනම් අදාළ මව කැමති ඕනෑම වේලාවන් දෙකක දරුවාට කිරි ලබාදිය හැකිය. එමෙන්ම අදාළ මව සේවය කරන ස්ථානයේම දරුවා සිටී නම් එම දරුවාට කිරි ලබාදීම සඳහා සේවා කාලය තුළ ඕනෑම වෙලාවක පැය භාගය බැගින් දෙවරක් හිමි වේ.

2018 ජුනි 18 වැනිද සිට මෙලස දරුවන්ට කිරි ලබාදීමට පැය දෙකක කාලයක් ලබාගත හැකි පරිදි කම්කරු නීතින් සංශෝධනය වී තිබුණද ඒ පිළිබඳව කිසිවකු හරිහැටි දැනුවත් වී නොමැති බව කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශයේ කම්කරු කොමසාරිස් වරිය පවසා සිටියාය. ඇය පවසා සිටියේ එම අයිතිය ලබාගැනීමට සියලුම මවුවරුන් කටයුතු කළ යුතු බවය.

එමෙන්ම මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වා සිටි ඇය පැවසුවේ මින් පෙර නීති සකස්ව තිබුණේ පළමු සහ දෙවැනි දරු ප්‍රසූති දෙක සඳහා පමණක් සති 12 ක එනම් දින 84ක නිවාඩු ලබාදීම පමණක් වුවත් 2018 වසරේදී සිදුකළ සංශෝධනයෙන් අදාළ මවට ඕනෑම දරු උපතකදී ඇයට ලබාදෙන නිවාඩු දින 84 ලබාගත හැකිය.

ඒ පිළිබඳවද බොහෝ දෙනා දැනුවත් නොමැති බවද ඇය වැඩිදුරටත් ප්‍රකාශ කළාය. ලෝක මවුකිරි දීමේ සතිය 2023 අගෝස්තු 01 සිට 07 දක්වා යෙදී ඇත. ඊට සමගාමීව ලබන අගෝස්තු මාසය ජාතික මවුකිරි දීමේ මාසය ලෙස නම් කර ඇත.

## ඔන්ලයින් ණය වංචා ගැන ...

අන්තර්ජාලය හරහා මාර්ග ගත ක්‍රමය ඔස්සේ (On line) ක්ෂණික ණය ලබාදෙන ආයතන වලින් සිදුවන වංචාවන් පිළිබඳව විවිධ පැමිණිලි විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවට ලැබෙන බවද ඇය කීවාය.

අන්තර්ජාලය හරහා ක්ෂණික ණය නිකුත් කිරීම සම්බන්ධයෙන් වගකීමක් ගත නොහැකි බවට ශ්‍රී ලංකා මහ බැංකුවද විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවට දැනුම්දී ඇතැයිද අධ්‍යක්ෂකවරිය සඳහන් කළාය.

මෙහිදී ග්‍රාහකයන් ස්ව කැමැත්තෙන් මෙම ක්ෂණික ණය ලබා ගැනීමට යොමුවී පසුව විවිධ ගැටලුවලට මුහුණපාන බවද අධ්‍යක්ෂකවරිය කීවාය.

දුරකථන හෝ අන්තර්ජාලය භාවිත කර යම් වංචාවක් සිදුවූයේ නම් ඊට සේවාදායක සමාගම (සන්නිවේදන සමාගම) හෝ විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවට වගකීමට නොහැකි බවද ඇය පැවසුවාය. සේවාදායක සමාගම විසින් ග්‍රාහකයාට සන්නිවේදන සබඳතාවක් ලබාදුන්නද ඒතුළ සිදුවන ක්‍රියාකාරකම්වලට වගකීමට නොහැකි බවද අධ්‍යක්ෂකවරිය සඳහන් කළාය.

කෙසේ නමුත්, අන්තර්ජාලයේ පළවන දෑ සම්බන්ධව මහජනතාව අවබෝධයෙන් කටයුතු කරන්නේ නම් මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුවන වංචා අවම කර ගැනීමට හැකි බවද ඇය පැවසුවාය.




# බෑනා මරන්න ඇවිත් මාමාට වෙඩි තියලා

අම්බලන්තොට ඝාතනය



මියගිය සිරිපාල

## දොර අරිනවිටම නාඳුනන තුවක්කුකරුවකු ගෙහිමියාට වෙඩි තියයි

■ අජිත් පුෂ්පකුමාර - අම්බලන්තොට

අම්බලන්තොට කොග්ගල්ල උතුරු කඩවර ප්‍රදේශයේදී පෙරේද (18 වැනිදා) පුද්ගලයකු වෙඩිතබා ඝාතනය කර තිබෙන බව අම්බලන්තොට පොලිසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්ව ඇත්තේ උතුරු කඩවර පදිංචි අමරකෝන් කංකානම්ගේ සිරිපාල (61) දෙදරු පියකි. ඔහු මෙසේ වෙඩිපහරට ලක්ව ඇත්තේ තම බෑනාගේ නිවසේදී බව පොලිසිය පවසයි.

පෙරේද (18 වැනිදා) රාත්‍රි 11.30 පමණ නිවසට පැමිණි නාඳුනන පුද්ගලයන් පිරිසක් නිවැසියන්ට කතාකර ඇති අතර නිවසේ ගෙහිමියා ඉදිරිපස දොර අරිනවාත් සමගම නාඳුනන තුවක්කුකරුවකුගේ වෙඩි පහරින් ගෙහිමියා දෙරකඩ ඉදිරිපිටම වැටී මියගොස් තිබෙන බව පොලිසිය පවසයි.



පොලිසිය පරීක්ෂණය කරන අයුරු

මිය ගිය පුද්ගලයාගේ දියණියක් විවාහව සිටින බෑනා සමග කිසියම් පිරිසක් ආරවුල් තත්ත්වයක් ඇති කරගෙන තිබෙන බවත්, ඒ අනුව බෑනා ඝාතනය කිරීමට පැමිණි මෙම නාඳුනන තුවක්කුකරුවන්ගේ වෙඩි පහර මාමාට එල්ලවන්නට ඇතැයිද පොලිසිය සැකකරයි.

සිද්ධිය සම්බන්ධව එක් සැකකරුවෙක් අම්බලන්තොට පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇති අතර වැඩිදුර පරීක්ෂණ අම්බලන්තොට පොලිසිය සිදු කරයි.






## කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk
කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk
Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

# පාලම ගලවලා ඉවරකරනකම් අපි තව ගාණක් හදමු

නව කැලණි පාලම මෙන්ම ඒ ආශ්‍රිත කටුනායක අධිවේගී මාර්ගයට කුඩ්ඩන්ගෙන් සිදුව ඇති 'අතවරය' සුළුවෙන් තැකිය නොහැක. මේවායේ ඇණමුරිච්චි ගලවමින්, තඹ කම්බි, විදුලි රැහැන්, යකඩ බට ආදී දෑ මහා පරිමාණයෙන් ගලවා හෝ කපාගෙන යන තරමට කුඩ්ඩන් අතට පත්ව ඇති නම් එක් අතකින් එය ජනතාවගේ ජීවිතාරක්ෂාව ගැන සිතන්නට වන තත්ත්වයකි. තවත් අතකින් රාජ්‍ය දේපළකට සිදුව ඇති බරපතළ හානියකි. තවත් අතකින් ජාතික ආරක්ෂාව ගැනද ප්‍රශ්නයක් මතුවන්නකි. එමතුද නොව, මෙය කුඩ්ඩන්ගේ 'ඇබ්බැහියක්' බවට පත්වුවහොත් රටේ අනෙකුත් පොදු හෝ පුද්ගලික දේපළවලට සිදුවිය හැකි අනර්ථයද බැහැර කළ නොහැක්කකි.

නමුත් ඒ සියල්ලට වඩා වෙනස් ගැටලුව වන්නේ මේ කාරණාවේ ඇති බරපතළකම වටහා ගැනීම වෙනුවට, හඳ පෙන්වන විට ඇඟිල්ල දෙස බලා අදහස් දක්වන සමහරක් වගකිවයුත්තන්ද, තමන්ගේ ගණිත පොරත්වය පෙන්වන්නට හදන මොන්ටිසෝරි ෆේස්බුක් පයිතගරස්ලා ද, ඒ 'බේබිගරස්'ලාට රුවටෙන මැති ඇමැත්තෝද මේ සිදුවීමේ 'නැට්වලින් අල්ලාගෙන' නන්දෙඩවීමට පටන්ගෙන තිබීමය. සමහරක් වගකිව යුතු ආයතන මෙය 'සිම්පල්' දෙයක් යැයි හැඟෙන පරිදි මාධ්‍ය නිවේදන නිකුත් කිරීමය.

'නව කැලණි පාලම අනතුරේ' යන සිරසින් යුතුව මෙම පුවත පළමුවෙන්ම රටට හෙළි කරනු ලැබුවේ ඉකුත් 14 වැනිද පළවූ 'අරුණ' පුවත්පතෙනි. ඒ පුවත ලියැවුණේ ඉකුත් 11 වැනිද රැස්වූ ජාතික ආරක්ෂක කවුන්සිලයට ඉදිරිපත්වූ කරුණු මෙන්ම පාර්ලිමේන්තුවේ ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික සභාවට ඉදිරිපත්වූ කරුණු පාදක කරගනිමිනි. රටක ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් විමසුම් කෙරෙන මෙවැනි සභා හමුවට ඉදිරිපත් වන කරුණක් යනු හුදු ඕපාදූපයක් හෝ සභාව පිනවීම පිණිස කරනු ලබන ඉදිරිපත් කිරීමක් නොවේ. ඒවා ජාතික මට්ටමේදී විශේෂයෙන් සැලකිල්ලට ගතයුතු ගැඹුරක් සහිත කරුණුය. අපි එකී පුවත ඉදිරිපත් කළේ ඒ පදනමෙනි. මෙම හානියේ තක්සේරුවට අදාළ ඉලක්කම් සඳහන් කළේද වගකීමකිනි.

නව කැලණි පාලම මෙන්ම එයට සමාන්තරව ඉහළින් දිවෙන අධිවේගී මාර්ගයද රටේ අගනගරය වෙත ඇති ප්‍රධාන පිවිසුමකි. එවැන්නක් වෙත පිවිස එහි කොන්ක්‍රීට් ආවරණ කඩා දමමින් කෝටි ගණනක වටිනාකමින් යුත් තඹ කම්බි ගලවා ඇතිනම්, ඇණ මුරිච්චි ගලවාගෙන යාමට තරම් අවස්ථාවක්, නිදහසක් ඇති නම් එය මෙරට ජාතික ආරක්ෂාවේ දැවැන්ත හිඩැසක් නොවේද? එද ප්‍රභාකරන් හටවත් තමන්ගේ ගෝලයකු රිංගවාගත නොහැකිවූ තැන්වල අද කුඩ්ඩන් 'පදිංචි වී' තඹ කර්මාන්තයේ, යකඩ කර්මාන්තයේ යෙදෙන්නේ නම් එය සුළුවෙන් ගතහැකි කරුණක්ද? එසේම, නොතිත් 'තඹ කාමයකින්' පෙළෙන මේ කුඩ්ඩන් කැලණි පාලමෙන් නොනැවතී රටේ මෙයටත් වඩා සංවේදී කාර්යයක් සිදුවන තැනක තඹ කම්බි හෝ රැහැන් කපාගෙන ගියහොත් උද්ගතවිය හැකි තත්ත්වය කවරේද?

මෙම ඇණ ගැලවීම පාලමක් බිම පතිතකරවීමට තරම් මේ මොහොතේදී භයානක නොවුණිද, මෙය සේදවත්ත හා අවට සිටින කුඩුලෝලීන්ගේ පුරුද්දක් බවට පත්වුවහොත් හෝ පාලමේ යකඩ ගලවාගැනීම හෝ යකඩ කපාගෙන යෑම ඔවුන්ගේ කර්මාන්තයක් බවට පත්වුවහොත් පාලමට අනාගතයේදී එවැනි ඉරණමක් හිමි නොවේ යැයි වගකීමෙන් කිව හැකි යමෙක් සිටිත්ද?

'අරුණ' විසින් රටට හෙළි කරන ලද මෙම පුවත ජාතික ආරක්ෂාවේ ඇස් ඇරවීමට මිස, පුස් මිනිසුන්ගේ හිස් තර්ක පිණිස නොවේ. එවැනි තර්ක නගන ඇත්තන් මෙහිදී පළමුවෙන්ම තේරුම්ගත යුතු කරුණ වන්නේ මෙය තප්පුලෑමෙන් විසඳුම් ලබාදිය හැකි ගැටලුවක් නොවන බව හා මෙවැනි සංවේදී ජාතික දේපළවලට මේ ආකාරයේ හානි සිදුකිරීමේ 'සික් එකට' නියම බෙහෙත නොදුනහොත් මත්තේදී රටේ මතුවිය හැකි දරුණු තත්ත්වයයි.

උද්ගතව ඇති තත්ත්වය වළක්වනු පිණිස මේ ප්‍රදේශය අධි ආරක්ෂිත කලාපයක් කිරීමට ඉදිරිපත්ව ඇති යෝජනාව ඉක්මනින් ක්‍රියාත්මකභාවයට පත්විය යුත්තකි. එසේම කුඩු දහය සංසිඳවාගැනීම පිණිස හානියකට ලක්විය හැකි කොළඹ මෙන්ම රටේ අනෙකුත් දේපළ මෙන්ම සංවේදී ස්ථානද රැකගැනීම පිණිස මතුදැක්මෙන් යුත් ආරක්ෂක වැඩපිළිවෙළක අවශ්‍යතාවද මෙහිදී මතුවන්නේය. එපමණක්ද නොව, මෙම පාලමේ කෑලි ගැලවූ කුඩ්ඩන් මෙන්ම ඒවා යකඩ බරට හෝ තඹ බරට මිලට ගත් එවුන්ද සොයා නීතියේ ඇති හොඳම තැනින් සැලකිල්ල ද දැක්විය යුතුය. විශේෂයෙන්ම මෙම කුඩ්ඩන්ගේ හොර බඩු තුට්ටු දෙකට ගැනීමට සැදී පැහැදී සිටින, හෙවත් මෙවැනි ජාතික අපරාධ සහ හොරකම් වෙනුවෙන් අනියමින් ආධාර අනුබලය ලබාදෙන මුදලාලිලා සොයාගැනීමත්, ඔවුනට ප්‍රසිද්ධියේ දඬුවම් පැමිණවීමත් අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තකි. එය සිදුකිරීමට නොහැකි නම් මෙරට රාජ්‍ය බුද්ධි අංශවලින් හෝ පොලිසියෙන් ඇති වැඩක් නැත. මේ අපරාධ කිසිදු නැවතීමටද නොහැක.

එසේම මෙවැනි හානිකර දෙයක් දුටු විගස ඒ පිළිබඳ පොලිසිය හෝ වගකිවයුතු ආයතනයකට දැනුම් දීම පිණිස ජනතාව පෙලඹවිය යුතුය. එසේ නිවැරදි ඔත්තු දෙන්නන් මුදලින් හෝ අන් අයුරකින් ඇගයීමේ වැඩපිළිවෙළද සකස්විය යුතුය. මේ ආකාරයෙන් දැනට සිදුවන මෙන්ම මත්තට සිදුවිය හැකි ව්‍යසනකාරී දේ වලකාලීමට ජනතාව සහ ආරක්ෂක අංශ ඒකාබද්ධ වූ ජාතික මට්ටමේ වැඩපිළිවෙළක් දැන් හෝ ඇරඹිය යුතුය. නැතහොත් ඒ සියල්ල පසෙක දමා, පාලමේ ඇති ඇණයක මිල ගණන් හද , එය, පාලමට සිදුව ඇති සකලවිධ හානියේ තක්සේරුවෙන් බෙදා, ගලවා ඇති ඇණ සංඛ්‍යාව මෙපමණක් යැයි ගණනය කර 'එතරම් ඇණ ගණනක් පාලමක නැත. එබැවින් මෙය සාවද්‍ය පුවතකැයි 'බේබි-ගරස් න්‍යායයෙන්' පවසනු ඇත. ඒ බින්නය අමුවෙන්ම ගිල දැමූ මැති ඇමැත්තෙක් පසුද පාර්ලිමේන්තුවට පැමිණ, ඒ සටහන ඇසුරින් කියන බයිලාවක් හැන්සාඩ්ගතවනු ඇත.



'ස්ට්‍රීට් ෆුඩ්' සංකල්පය අද වනවිට අප රටේ ජනප්‍රිය වී ඇත. එහෙත් එවැනි තැන්වල අලෙවි වන ආහාරවල ප්‍රමිතිය පිළිබඳව ඇත්තේ ගැටලුකාරී බවකි. පසුගිය සමයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් එවැනි ස්ථානවල සැකසෙන ආහාර පාන පිළිබඳ කළ පරීක්ෂාවන්හිදී බොහෝ වෙළෙඳ කුටිවල එම ආහාර සැකසීමට භාවිත කරන අමුද්‍රව්‍ය කිසිදු ප්‍රමිතියක් නැති මිනිස් ශරීරයට අහිතකර ද්‍රව්‍ය අඩංගු ඒවා බව තහවුරු විය. එපමණක් නොව රට පුරා ඇති ඇතැම් ආපනශාලාවල ඇති ආහාරපානවල තත්ත්වයද එසේමය. එවැනි ආහාරපාන මනුෂ්‍ය පරිභෝජනයට සුදුසුද නැතිද යන්න පිළිබඳව රසායනාගරයන් තුළ පරීක්ෂණ කළ යුතුය. නමුත් මේ වන විට රසායනාගාරයන් තුළ අවශ්‍ය මානව සහ භෞතික සම්පත් නොමැති වීම හේතුවෙන් පරීක්ෂණයන් නිසි පරිදි කරගැනීමට නොහැකි වී ඇති බව වාර්තාවේ. මේ හේතුවෙන් මිනිසුන්ට වස විස අන්තර්ගත ආහාරපාන කෑමට සිදුව තිබේද? යන්න පිළිබඳ අපි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ භාණ්ඩාගාරික රෝෂන් කුමාරගෙන් විමසුවෙමු.

# බොන වතුර පරීක්ෂාවටම තියෙන එකම ආයතනයත් කොට උඩ

**පසුගිය සමයේ විවිධ තැන්වල ඇති ආහාරපාන පිළිබඳ පරීක්ෂාවක් මහජන පරීක්ෂකවරු සිදුකළා. එවැනි තැන්වලදී ලබාගන්නා ආහාර නියැදි රසායනාගාර පරීක්ෂාවන් යොමුකරන බව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු කියනව. ඇත්තටම ඒ නියැදි සියල්ල නිසි ලෙස පරීක්ෂා කිරීම්වලට ලක්වෙනවාද?**

ක්ෂේත්‍රයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 2500ක් පමණ සිටිනවා. මේ අය ලබා ගන්නා සෑම ආහාර හා ජල සාම්පලයක්ම පරීක්ෂාවට ලක්කිරීමට රසායනාගාර ශිල්පීන්ට හැකියාවක් නැහැ. මොකද ඉන්න පිරිස සීමිතයි. අවම පහසුකම් යටතේ තමයි ඔවුන්ට පරීක්ෂා කිරීම් කරන්න වෙලා තියෙන්නේ.

ඒ වගේම තමයි රසායනාගාර පරීක්ෂණයන් කරන්න අවශ්‍ය කරන ප්‍රතික්‍රියක ද්‍රව්‍යවල හිඟයක් පවතිනවා. එහෙම වුණාම පරීක්ෂණ කරන්න හැකියාවක් නැහැ. අනෙක, සමහර රසායනික ද්‍රව්‍යවලට හුඟ වේලාවක් නිරාවරණය වීම ශරීර සෞඛ්‍යයට හිතකර නැහැ. ඒ නිසා ඔවුන්ගේ සෞඛ්‍යය ගැනත් ඔවුන් බලන්න ඕන.

ඔවුන් තමන්ට හැකි උපරිම අයුරින් ඒ දේවල් කරනවා. රජය නව බඳවාගැනීම් නතර කිරීම නිසා විශාල සේවක හිඟයක් නිර්මාණය වෙලා තියෙනවා. සමහර රසායනාගාරවල වෛද්‍ය රසායනාගාර තාක්ෂණ නිලධාරීන් ඉන්නේ දෙන්නයි, තුන්දෙනයි. ඒ අයට දිනකට කරන්න පුළුවන් පරීක්ෂණයන් ඉක්මවා ගොස් ඔවුනගේ සේවාවන් ඉටු කරනවා.

**රසායනික ප්‍රතික්‍රියක කට්ටල නොමැති වීමෙන් හෝ රසායනාගාර පහසුකම් නොමැති විමෙන් අපට කළ නොහැකි පරීක්ෂාවන් මොනවද?**

අපිට බොහෝ පරීක්ෂා කිරීම් කරන්න පුළුවන්. නමුත් බැක්ටීරියාවන්ගෙන් දූෂණය වූ ආහාරපාන පරීක්ෂාවන් කරන්න විදිහක් නැහැ. ජෙලටින් වර්ග දෙකක් වෙළෙඳපොළේ අලෙවි වනවා. එකක් මුහුදු පැළෑටිවලින් (seaweeds) හදන එකක්. අනික ඌරන්ගේ සහ හරකුන්ගේ උරහන් සහ කටුවලින් තමයි නිෂ්පාදනය කරන්නේ. ජෙලි පැකට්වල බොහෝ විට ගහලා තියෙන sea weeds කියලා. ඒත් මේවා මිල අධිකයි. මිල අධික ජෙලි රුපියල් 10-20 වැනි සුළු මුදලකට ප්ලාස්ටික් කුරුවල නැතිනම් පැකට්වල හෝ කප්වල අසුරා අලෙවි කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා අපි විශ්වාස කරනවා අඩු මුදලට විකුණන ජෙලි සත්ව කොටස්වලින් නිපදවන ඒවා විය හැකියි කියලා. මෙවැනි දේවල් පරීක්ෂා කරන්න පහසුකම් ඇත්තේම නැති තරම්. ඒ වගේම තමයි රස උත්ප්‍රේරක අඩංගු ආහාර පරීක්ෂා කිරීමේ හැකියවක් නැහැ.

ආහාර ඇසුරුම් සඳහා යොදා ගැනීමට සුදුසු ප්ලාස්ටික්ද නැද්ද කියලා සොයා ගැනීමේ හැකියාවක් අපේ රසායනාගාරයන්වල නැහැ. බොහෝ ප්ලාස්ටික ඇසුරුම් විනිවිද භාවයෙන් තොරයි. මේවා සුදුසු නැහැ. විශේෂයෙන්ම ඉතා සුළු මුදලකට අලෙවි කරන ජෙලි අඩංගු ප්ලාස්ටික් කුරු අහිත කරයි.

**අපි දකිනව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කරන හදිසි වැටලීම්වලදී පිසින ලද ආහාර නියැදි අරගන්නවා. ඇත්තටම පිසින ලද ආහාරවල සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ හැකියාවක් නැතිද?**

ආහාර පරීක්ෂාව මේ වන විට යම් මට්ටමකින් කළත් ඒක හැම රසායනාගාරයකම සිදුකරන්න පහසුකම් ප්‍රමාණවත් නැහැ. විශේෂයෙන්ම ආහාරවල බැක්ටීරියා පරීක්ෂණයන් මේ වන විට සීමාවෙලා තියෙනවා. විශේෂයෙන්ම ඝන ආහාරවල බැක්ටීරියාවන් පරීක්ෂාව සීමාවෙලා තියෙනවා. නමුත් අර්ධ ඝන ආහාරයන් බැලූ බැල්මට නරක්වෙලා නම් අපේ ඇහැට පේනවා, දිවට දැනෙනවා. නමුත් මිනිස් අසූචිවලින් දූෂණය වුණ ආහාරයක් හරියටම දැනගන්න පුළුවන් වෙන්නේ රසායනාගාර පරීක්ෂාවකින්ම පමණයි. නැත්නම් දැන ගන්න වෙන්නේ ආහාරයට ගත් පසුව බඩේ ඇතිවන අජීර්ණ තත්ත්වයක් හෝ වමනය හේතුවෙන්.

අනික් කරුණ තමයි අපිට මාසයකට එකවරක් පමණයි රසායනාගාරයන්ට ආහාර සාම්පල් රැගෙන ඒමට ප්‍රවාහන පහසුකම් ලබාදෙන්නේ. අපි නරක් නොවන ආහාර සාම්පල් එකතු කරලා රසායනාගාරයට රැගෙන එන දිනයේම තමයි පිසූ ආහාර සාම්පල රැගෙන එන්නේ. ඒවත් ඉක්මනින් ගෙන ආ යුතුයි. මෙසේ ගෙන ආවත් ඒවා බාරගැනීම රසායනාගාර මගින් සීමා කර තිබෙනවා. මම මුලින් සඳහන් කළ පරිදි එකට ප්‍රධාන හේතුවෙ මානව හා භෞතික සම්පත්වල හිඟය.

**ආහාර පරීක්ෂා කිරීමට කොපමණ රසායනාගාර සංඛ්‍යාවක් රට පුරා තියෙනවාද?**

ආහාර පනත යටතේ ආහාර නියැදි පරීක්ෂා කරන රසායනාගාර නම් කර තිබිය යුතුයි. මෙසේ නම් කළ රසායනාගාර 5ක් දිවයිනේ තියෙනවා. මේ රසායනාගාර පහ තමයි කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, රජයේ රස පරීක්ෂක ආයතනය, කොළඹ නාගරික රස පරීක්ෂක ආයතනය, කුරුණෑගල රස පරීක්ෂක ආයතනය, අනුරාධපුර රස පරීක්ෂක ආයතනය.

**මේ රසායනාගාරයන්වල ජල පරීක්ෂාවන් කරන්නේ නැද්ද?**

මේ සියලුම රසායනාගාරයන්හි ජල සාම්පල පරීක්ෂා කරන්නේ නැහැ. ඒත් ජල සාම්පල පමණක් පරීක්ෂා කරන රසායනාගාරයක් තියෙන්නේ ගාල්ලේ විතරයි. හැබැයි දැන් මාස කීපයක සිට ගාල්ල රසායනාගාරයේ ජල සාම්පල පරීක්ෂා කිරීම නතර කරලා තියෙන්නේ.

**ඇයි ඒ..?**

ස්ථිර බැක්ටීරියා විශේෂඥවරයෙක් මේ රසායනාගාරය සතුව නැහැ. අනික තමයි නිලධාරීන්ගේ හිඟය, යන්ත්‍ර උපකරණවල හිඟය, රසායනික ද්‍රව්‍යවල හිඟය ආදී හේතු නිසා තමයි පරීක්ෂා කිරීම් නතර කරලා තියෙන්නේ.

**මේ වෙද්දි වෙළෙඳපළේ කෘත්‍රිම වර්ණක, රසකාරක යෙදූ ආහාර ද්‍රව්‍ය වගේම ලුණු කුඩු, පාන්පිටි මිශ්‍ර කළ වියළි ආහාර තියෙනවා. මේවා ගැන නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමේ හැකියාවක් නැද්ද?**

වෙළෙඳපොළේ වර්ණක යෙදූ පරිප්පු, වියළි ඉස්සෝ, රෝස කැකුළු වගේ දේවල් තියෙනව තමයි. නමුත් මේවා රසායනාගාරවල නිසි පරීක්ෂාවකට ලක් කිරීමේ හැකියාවක් නැහැ. මොකද භෞතික හා මානව සම්පත් හිඟය නිසා. අනික සෞඛ්‍ය ඇමැතිවරයාගේ අනුමැතිය ඇති රසායනාගාරවලින් හැර අන් රසායනාරගාරවලින් ආහාර සාම්පල් පරීක්ෂා කරලා ලබා ගන්නා වාර්තාවන් අධිකරණයේ නීතිමය කටයුතු සඳහා භාවිත කරන්න හැකියාවක් නැහැ. අනික අපි අධිකරණයට කරුණු වාර්තා කර ඒ මගින් යම් ආහාර සාම්පලයක් රසායනාගාරයට පරීක්ෂණයට යැව්වොත් ඒ අය ඒ සාම්පලය අනිවාර්යයෙන්ම පරීක්ෂා කර දිය යුතුයි.

**කෘත්‍රිම වර්ණක, රසඋත්ප්‍රේරක යෙදූ ආහාර ද්‍රව්‍ය බැලූ බැල්මට හඳුනාගන්නෙ කොහොමද?**

ලුණු කුඩු, පාන්පිටි මිශ්‍ර කළ මිරිස් කුඩු, කහ කුඩු වගේ දේවල් බැලූ බැල්මට කියන්න පුළුවන්. අනික තමයි මිරිස් කුඩු, තුනපහ කුඩුවලට රස උත්ප්‍රේරකයක් වන මොනෝසෝඩියම් ග්ලූටමේට් යොදා අලෙවි කරනවා. ඒවා කුඩා වීදුරු කැබලි වගේ දිස්වෙනවා. ඒ වගේමයි අබ, උළුහාල් වැනි කුළුබඩු වර්ණක යොදා වෙළෙඳපොළේ තියෙනවා. ඒ නිසා අපි මහජනතාවගෙන් ඉල්ලා සිටින්නේ මෙවැනි ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේදී හොඳින් පරීක්ෂා කරන්න කියලයි. වර්ණක යෙදූ පරිප්පු, ඉස්සෝ වගේ දේල් මිලදී ගැනීමේදී වඩාත් සැලකිලිමත් වන්න. විශේෂයෙන්ම අබ ඇට මුළුමනින්ම දම් පැහැයට හුරු නම් ඒවාට වර්ණක යොදා තිබෙනවා. මොකද අබ ඇට දම්, ලා දුඹුරු වැනි වර්ණවලින් යුක්ත විය යුතුයි. එහෙම වෙන්නේ අබ ඇටවල හොඳින් මෝරලම නම් විතරයි. ලා ඇට හා මඳ වශයෙන් මෝරපු ඇටවල සම්මිශ්‍රණයක් තියෙන්නේ. මේ සියලුම අබ ඇට වර්ණ ගැන්නුවාම තමයි එකම වර්ණයකින් දිස්වෙන්නේ. උළුහාල්වල තත්ත්වයත් ඕකම තමයි.

**පසුගිය කාලයේ රස උත්ප්‍රේරකයක් ලෙස භාවිත කළ මොනෝසෝඩියම් ග්ලූටමේට් පිළිබඳව දීර්ඝ වශයෙන් කතා කළා. නමුත් තවමත් මේ රසකාරකය ආහාර සැකසීමේදී භාවිත කරනවා...**

මොනෝසෝඩියම් ග්ලූටමේට් කියන්නේ වයස අවුරුදු 3ට අඩු දරුවන්ට කොහෙත්ම දෙන්න සුදුසු දෙයක් නෙවෙයි. නමුත් මේවා මිශ්‍රකළ ආහාර පරීක්ෂා කරන්න අපේ රටේ රසායනාගාර පහසුකම් තවමත් නැහැ. අනික රස උත්ප්‍රේරකයක් ලෙස යොදා ගන්නා ඩයිසෝඩියම් 5- ග්වානිලේට් හා ඩයිසෝඩියම් 5 ඉනොසිනේට් නමැති රස උත්ප්‍රේරකය භාවිත කර සාදන ලද විවිධ ආහාරමය කෑට වර්ග වයස අවුරුදු 3ට වඩා අඩු දරුවන්ගේ ආහාරයට එකතු කර ගැනීම සුදුසු නැහැ. නමුත් මේවා කුඩා දරුවන්ගේ ආහාරවල අන්තර්ගතද කියලා බලන්න හැකියාවක් නැහැ.

**රසායනාගාරයන් තුළ අවශ්‍ය මානව හා භෞතික සම්පත් නැතිනම් වෙළෙඳපළ තුළදීම ආහාර පරීක්ෂාවන් කළ හැකි විකල්පයක් නැතිද?**

නැත්තේ නැහැ, තියෙනවා. නමුත් අපිට ඒ පහසුකම් දීලා නැහැ. වෙළෙඳපොළ පරීක්ෂා කිරීම්වලදී අපට හැඟී ගියොත් මේ ආහාර ද්‍රව්‍යවලට වර්ණකයක් යොදා ඇති බවට ඒ මොහොතේදීම එය පරීක්ෂා කරන්න 'ටෙස්ට් කිට්' දැන් ලෝකයේ තියෙනවා. අපි කියන්නේ මේ වගේ ටෙස්ට් කිට් ටිකක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට දීලා තියෙනවා නම් අපිට වෙළෙඳපොළවල් තුළදීම මේ පරීක්ෂා කිරීම් කරන්න පුළුවන්. ලුණුවල අයිඩින් තියෙනවාද නැද්ද කියලා බලාගන්න පුළුවන්, ආහාර ද්‍රව්‍යවලට වර්ණක යොදා තිබෙනවාද කියල බලන්න පුළුවන්. පොල්තෙල්වල ඇෆ්ලටොක්සීන් මිශ්‍රකරලා තියෙනවාද නැද්ද කියලා බලා ගන්න පුළුවන්. මේ වගේ පරීක්ෂා කිරීම් සඳහා අපට පහසුකම් දීලා තියෙනවා නම් රසායනාගාරය වෙත යවන සාම්පල් ප්‍රමාණය හැකි පමණ අඩුකර ගන්න පුළුවන්.

**රසායනාගාරයන් තුළ තිබෙන පහසුකම් නැංවීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය දැනුම්වත් නොකළේ ඇයි?**

ආහාර පාලන ඒකකයේ කිසිම රැස්වීමකට අපිව කැඳවන්නේ නැහැ. ඒ නිසා ක්ෂේත්‍රයේ තියෙන ගැටලු ගැන ඔවුන් දැනුම්වත් නැහැ. සීත කාමරවල ඉඳලා මේ ගැටලුවලට විසඳුම් දෙන්න බැහැ.

■ සංවාදය - ශ්‍රියානි විජේසිංහ




## ගපිරිගේ කවිය

### සමහරු අහලා...

"කපලා දමන්නට අර පඬු කරඳ ගස
තීරණ කළේ කැබිනට් ඇමැතිලා රැස
ඒ අය මාසෙකට ඇතුළට දමනු මිස
පොලිසිය බලා ඉන්නේ ඇයි මගට බැස?''

ගම්මන්පිල මැතිඳු කිව් විදියට කරලා
ඔය සේරෝ ම අල්ලල ඇතුළට දමලා
එතුමල ගෙනැත් ඒ පුටුවල ඉන්දවලා
වේවිද වැඩක් සමහරු තිබුණා අහලා

# වාරි ජලාශවල ජල මට්ටම ඉදිරියේදී 30%කින් අඩුවේවි

**- වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

■ සාලිය කුමාර ගුණසේකර

සැප්තැම්බර් මාසය වනතුරු සැලකිය යුතු වර්ෂාපතනයක් නොලැබෙන බැවින් වාරි ජලාශවල ජල මට්ටම සියයට විසිඅටත් තිහත් (28%-30%) අතර ප්‍රතිශතයක් දක්වා ඉදිරියේදී අඩුවෙනු ඇතැයි වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහන් කළේය.

ඊයේ (19 වැනිදා) වන විටදී දිවයිනේ ප්‍රධාන ජලාශවල සමස්ත ජල මට්ටම සියයට හතළිහක් (40%)ක් දක්වා අඩුවී තිබිණි.

මෝසම් වැසි ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් උතුරු මැද හා උතුරු පළාත්වල පිහිටි ගම් වැව් (කුඩා වැව්) රැසක් සිඳී ගොස් ඇතැයි වාරිමාර්ග දෙපාර්තමේන්තුව පවසයි. දිවයින පුරා ගම් වැව් 12,000ක් පමණ ඇති අතර, වර්ෂා ජලයෙන් මෙම වැව් පෝෂණය වෙයි.

තවද, මෝසම් වැසි ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් ජල විදුලි නිෂ්පාදනය සඳහා වතුර සපයා ගැනීමේදී ගැටලු පැනනැගෙනු ඇතැයි ද වාරිමාර්ග නිලධාරීහු පැවසූහ.

දෙවැනි අන්තර් මෝසම් වැසි ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලදී ලැබෙතැයි අපේක්ෂා කළද, ඉකුත් වසරවලදී මෙන් තද වැසි අපේක්ෂා කළ නොහැකි බවද වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහන් කළේය.

# පාකිස්තානයේ මහ කොමසාරිස් ධුරය අද්මිරාල් රවීන්ද්‍ර විජේගුණරත්නට

■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා



පාකිස්තානයේ නව ශ්‍රී ලංකා මහ කොමසාරිස් ලෙස අද්මිරාල් රවීන්ද්‍ර විජේගුණරත්න ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් පත් කර ඇත.

ඔහු මීට පෙර ඛනිජ තෙල් සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරමින් එම සංස්ථාව ලාභ ලබන ආයතනයක් බවට පත් කර තිබේ.

හිටපු නාවික හමුදපතිවරයකු වූ හෙතෙම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙස විශ්‍රාම ගත්තේය.

පාකිස්තානයෙයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ධුරය හෙබ වූ අද්මිරාල් මොහාන් විජේවික්‍රමගේ ධුර කාලය අවසන් වූ බැවින් අද්මිරාල් රවීන්ද්‍ර විජේගුණරත්න ඒ සඳහා පත් කර තිබේ.

ඔහු පත් කිරීමට ජනාධිපතිවරයා ගත් තීරණය පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවට හා පාකිස්තානු රජය වෙතද මේ වන විට දැනුම් දී ඇත.



අතුරුදන් කත සැමියා සමග

## අඟුරුවාතොට නිවෙසක සිටි
# රූමත් මවක හා බිළිඳියක අතුරුදන්

## මස්සිනා සැකපිට අල්ලයි



නිවෙස අවට පරීක්ෂා කරමින්



අතුරුදන් වූ බිළිඳිය

## මවට අවුරුදු 24යි බිළිඳියට මාස 11යි

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

අඟුරුවාතොට, ඌරතුඩාව ප්‍රදේශයේ නිවසක විසූ රූමත් තරුණ මවක මාස 11ක් වයසැති සිය දියණිය සමග සැකකටයුතු ලෙස අතුරුදන්ව ඇතැයි අඟුරුවාතොට පොලිසිය පැවසීය.

මෙලෙස අතුරුදන්ව ඇත්තේ එම්. වාසනා කුමාරි (24) ඇයගේ එකම දියණිය වන ටශ්මි දිලන්යා (මාස 11) දැරියයි.

අතුරුදන් වූ කාන්තාවගේ සැමියාගේ මස්සිනා (නැගණියගේ සැමියා) වන හිටපු හමුද සෙබළා එම සිද්ධිය සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගෙන ඇත.

නිවසේ ශීතකරණයේ දෙරේ පැල්ලම් කිහිපයක් සහ ඒ අසල බිම මැකී ගිය ලේ පැල්ලම් කිහිපයක් දක්නට ලැබෙන බව විමර්ශන සිදු කරන පොලිස් නිලධාරියෙක් පැවැසීය. තවද අතුරුදන් වූ කාන්තාව පරිහරණය කළ තුවාය අස්ථානගත වී ඇතැයි පොලිස් විමර්ශනවලදී අනාවරණය වී ඇත.

අතුරුදහන් වූ කාන්තාවගේ සැමියා පෙරේද (18 වැනිද) රාත්‍රියේ අඟුරුවාතොට පොලිසියට පැමිණ තම බිරිඳ හා දියණිය අතුරුදන්ව ඇති බවත් එදින සවස් වරුවේ තම මස්සිනා ද නිවසට පැමිණ ඇති බවත් පවසමින් පැමිණිල්ලක් සිදුකර තිබේ.

සැකපිට අත්අඩංගුවට ගත් පුද්ගලයා පැමිණිලිකරුගේ නිවසට පැමිණ ඔහුට දුරකථන ඇමතුමක් ලබාදී 'වැඩක් බාර ගෙන තියෙනවා එන්නෙ කීයට දැයි' අසා ඇති බවත් තමා රෑ බෝ වන බවට පැවසීමෙන් අනතුරුව දුරකථනය විසන්ධි කර තිබූ බවත් පැමිණිලිකරුගේ ප්‍රකාශයකින් අනාවරණය වී ඇත.

එම පුද්ගලයා එලෙස පැමිණිලිකරුට දුරකථන ඇමතුමක් ලබාදී ඇත්තේ ඔහු රැකියා ස්ථානයේ සිට නිවසට පැමිණීමෙන් සිටිනවාද නැතහොත් රැකියා කරන ස්ථානයේ සිටිනවා දැයි සැක හැර දැන ගැනීමට විය හැකි බවට පොලිස් නිලධාරිහු සැක පළ කරති.

තමා නිවසේ නොමැති අවස්ථාවලදී මස්සිනා පැමිණ සිටීම කරදරයක් බව බිරිඳ දින කිහිපයකට පෙර අවස්ථා දෙකකදී තමන්ට පවසා තිබූ බව ද අදාළ පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් වේ.

අත්අඩංගුවේ පසුවන සැකකරු කාන්තාවන් දෙදෙනකුට අයුතු යෝජනා කර ඇති අයකු බව ද හෙළිව තිබේ.

පානදුර කොට්ඨාස අපරාධ පරීක්ෂණාගාරයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රුවන් කුමාර සහ පොලිස් කොස්තාපල් සරෝජනී (6921) ඇතුළු නිලධාරිහු අතුරුදන් කාන්තාව සහ බිළිඳිය පදිංචිව සිටි නිවසේ පැය 5කට අධික කාලයක් රැඳී සිටිමින් පරීක්ෂණ සිදු කළ ඇතත් කිසිදු හෝඩුවාවක් සොයාගැනීමට හැකිව නැත.

අනතුරුව හොරණ පොලිස් නිල සුනඛ අංශයේ සිටින 'බෲනෝ' නමැති නිල සුනඛයා එම නිවස වෙත ගෙන්වා පරීක්ෂා කර තිබේ.

එම කාන්තාවගේ පාවහන් දෙකක් හා පනාවක් ඉව කිරීමෙන් පසු සුනඛයා මද දුරක් ගොස් දැනට අත්අඩංගුවේ සිටින සැකකරුට අයත් ත්‍රිරෝද රථය අසල පැවතුණ බව පොලිසිය කීවේය.

මෙම කාන්තාවගේ අතුරුදන්වීම සැලවීමෙන් පසු සැකකරු ඔහුගේ බිරිඳ සමග මෙම නිවසට පැමිණ ඇති බවත් නිල සුනඛයා නතරවී ඇත්තේ එම ත්‍රිරෝද රථය අසල බවත් පොලිසිය පැවසීය.

කළුතර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති සුගතපාල, පානදුර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමන්ත වෙදගේ යන අයගේ උපදෙස් මත අඟුරුවාතොට පොලිසියේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආනන්ද සිල්වා සහ අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක නිශ්ශංක ඇතුළු පිරිසක් වැඩිදුර පරීක්ෂණ පවත්වති. ඊට අමතරව බුද්ධි නිලධාරීන්ද සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වයි.

## රාජ්‍ය අනුග්‍රහය නැත්නම්
# පන්දම් එළියෙන් හරි දළදා පෙරහර තියනවා

**- ශ්‍රී නාථ දේවාලයේ බස්නායක නිලමේ**

■ කමල් සුරවීර - මහනුවර



බස්නායක නිලමේවරුන්ගේ සාකච්ඡාව

මහනුවර ශ්‍රී දළදා පෙරහරට රජයෙන් අනුග්‍රහය නොලැබෙන්නේ නම් අතීතයේ මෙන් පන්දම් එළියෙන් පෙරහර පැවැත්විය හැකි බව මහනුවර ඓතිහාසික ශ්‍රී නාථ දේවාලයේ බස්නායක නිලමේ ශානක බණ්ඩාරනායක පැවසුවේය.

මහනුවර ඇසළ පෙරහර සමයේ ශ්‍රී දළදා මාලිගාව සහ සිව් මහා දේවාල සඳහා රුපියල් එක්කෝටි තිස්තුන් ලක්ෂයකට ආසන්න ඇස්තමේන්තුගත විදුලි බිලක් එවීම සම්බන්ධයෙන් ශ්‍රී දළදා මාලිගාවේ ඊයේ (19 වැනිදා) පැවැති සාකච්ඡාවකදී බස්නායක නිලමේවරයා මේ බව කීවේය.

මෙම සාකච්ඡාවෙන් පසු අදහස් පළ කළ ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල සඳහන් කළේ එවා ඇති එම විදුලි බිල නැවත ඇස්තමේන්තුගත කිරීමට විදුලි බල මණ්ඩලය එකඟ වූ බැවින් ගැටලුවක් පැන නොනගින බවයි. මෙම සාකච්ඡාවේදී ගැටලු සඳහා සාධනීය පිළිතුරු ලද බවත් පෙරහර පැවැත්වීම සඳහා පෙර පරිදිම විදුලිය ලැබෙන බවත් ඒ මහතා කීවේය.

## රිජ්වේ ආර්යා රෝහලේ
# විශේෂඥ වෛද්‍යවරියකට එරෙහි වැඩවැරුමක්

■ චාමර පල්ලේගෙදර

බොරැල්ල රිජ්වේ ආර්යා ළමා රෝහලේ විශේෂඥ වෛද්‍යවරියකගේ අත්තනෝමතික ක්‍රියාමාර්ගවලට එරෙහිව බාහිර රෝගී අංශයේ වෛද්‍යවරු ඊයේ (19 වැනිද) පැයක කාලයක් වැඩවර්ජනයක නිරත වූහ.

එලෙස පැයකට සීමා වී තිබුණේ එදින පෙරවරු 8.00 සිට පැය 24ක කාලයක් පැවැත්වීමට නියමිතව තිබූ වැඩවැරුමකි. අදාළ වෛද්‍යවරිය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වන ලද විමර්ශනයේ ප්‍රතිඵල මෙම සතිය අවසන් වීමට පෙර ලබා දීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පොරොන්දු වීමෙන් පසු අදාළ වැඩවර්ජනය මෙලෙස අත්හිටුවා තිබේ.

මෙම වැඩවර්ජනය සම්බන්ධයෙන් තමා දැනුවත් වූයේ මාධ්‍ය මගින් බවත් එසේ නොමැතිව වෛද්‍යවරුන් රාජකාරි මට්ටමින් ඒ පිළිබඳ තමා දැනුවත් කර නොතිබූ බවත් රෝහල් අධ්‍යක්ෂ වෛද්‍ය ජී. විජේසූරිය පැවසීය. කෙසේ වෙතත් මෙම ගැටලුව සම්බන්ධයෙන් තමා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග සාකච්ඡා කළ බවද එහිදී අදාළ වෛද්‍යවරිය සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනයේ ප්‍රතිඵල මෙම සතිය අවසන් වීමට පෙර ලබා දීමට පොරොන්දු වූ බවද අධ්‍යක්ෂවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

# වෛද්‍ය රසායනාගාර විද්‍යාඥයන්ගේ වැඩවැරුම තාවකාලිකව නවතී

■ චාමර පල්ලේගෙදර



සිය ඉල්ලීම් සම්බන්ධයෙන් සාකච්ඡාවක් ලබාදීමට කොළඹ ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා එකඟත්වය පළ කිරීම හේතුවෙන් වෛද්‍ය රසායනාගාර විද්‍යාඥයෝ ඊයේ (19 වැනිද) ආරම්භ කළ වැඩවර්ජනය තාවකාලිකව නතර කළහ. අධිකාරි වෛද්‍ය රසායනාගාර විද්‍යාඥ නිලධාරීන්ට අයත් නිල රාජකාරිවලට සිදු කරන අතපෙවීම් හා බාධා කිරීම්, වෛද්‍ය රසායනාගාර විද්‍යාඥ නිලධාරීන්ට අයත් දීමනා සම්බන්ධයෙන් චක්‍රලේඛවලට පරිභාහිරව කටයුතු කිරීම, නිලධාරීන්ගේ දීමනා ඔවුන්ට නොදන්වා කප්පාදු කිරීම ඇතුළු ඉල්ලීම් පහක් මුල්කර ගනිමින් මෙම වැඩවර්ජනය පැවැත්විණි.

දින දෙකක කාලයක් මෙම වැඩවර්ජනය පැවැත්වීමට සැලසුම් කර තිබිණි. රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිල කාමරය ඉදිරිපිට වැඩවැරුම පැවැතියදී නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා එහි පැමිණ සිය ඉල්ලීම් සම්බන්ධයෙන් සාකච්ඡාවක් අද (20 වැනිද) දහවල් 12.00ට ලබා දුන් බව වෛද්‍ය රසායනාගාර විද්‍යාඥ සංගමයේ සභාපති රවී කුමුදේශ් පැවසීය.

## විදුලි ගාස්තු සංශෝධනයට එරෙහි
# ජනකගේ පෙත්සම නිෂ්ප්‍රභ කරන්න

**- නීතිපති ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලයි**

■ කේ.එස්. උදයකුමාර

මෑතකදී ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගත් විදුලි ගාස්තු සංශෝධනය කිරීමේ තීරණය බල රහිත කිරීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා මහජන උපයෝගිතා කොමිසමේ හිටපු සභාපති ජනක රත්නායක ඇතුළු පිරිසක් ගොනුකර තිබෙන මූලික අයිතිවාසිකම් පෙත්සම් නීතිය ඉදිරියේ පවත්වාගෙන යාමට හැකියාවක් නොමැති හෙයින් ඒවා විභාගයට නොගෙන නිෂ්ප්‍රභ කරන ලෙස නීතිපතිවරයා ඊයේ (19 වැනිද) ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික විරෝධතා මතු කළේය.

මෙම පෙත්සම් ඊයේ (19 වැනිද) ප්‍රීති පද්මන් සූරසේන, ජනක් ද සිල්වා සහ මහින්ද සමයවර්ධන යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල ඉදිරියේ කැඳවනු ලැබූ අවස්ථාවේදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජනරාල් විවේකා සිරිවර්ධන අධිකරණය හමුවේ කරුණු දක්වමින් මෙම පෙත්සම් වල වගඋත්තරකරුවන් ලෙස අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නම් කර නොමැති බව පෙන්වා දුන්නාය.

## පොල් ගෙඩියක් ඇහිලූ අයකුට
# මොට ආයුධයකින් ගහලා

**ගුටි කෑ කම්කරුවා රෝහලේදී මරුට**

■ දීපා වසන්ති එදිරිසිංහ

අනුන්ගේ වත්තකින් කෑමට පොල් ගෙඩියක් අහලා ගන්නට ගොස් එම ඉඩම් හිමියාගේ මොට ආයුධ ප්‍රහාරයකට ලක්ව රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටි අයකු සති හතකට පසු පෙරේද (18 වැනිද) මිය ගොස් ඇත.

මෙසේ ජීවිතක්ෂයට පත්ව ඇත්තේ මිනුවන්ගොඩ, යටියන ප්‍රදේශයේ පදිංචිව සිටි එල්. ප්‍රීතිලාල් නමැති 60 හැවිරිදි කම්කරුවෙකි.

ඔහු ඉකුත් මැයි මාසයේ 26 වැනිද පස්වරුවේ නිවසට යන අතරතුර අසල පිහිටි වූ ධනපාල නමැති ව්‍යාපාරිකයකුට අයත් ඉඩමක පොල් වැටී තිබෙනු දැක ඉන් ගෙඩියක් අහුලා ගන්නට වත්තට ඇතුළු වී ඇතැයි පැවසේ. එම ඉඩමේ අයිතිකරුවන 65 හැවිරිදි ව්‍යාපාරිකයා සහ ඔහුගේ රියැදුරුද එහි සිට තිබේ. එහිදී දෙපිරිස අතර බහින් බස් වීමක් සිදුව ඇත. එහිදී ඔවුන් හොරකමේ යනවාට පාඩමක් උගන්වන්නේ යැයි කියා එහි තිබූ මොට ආයුධයකින් පහරදී තුවාල සිදු කර තිබේ.

මෙම සිදුවීමෙන් පසු අදාළ ව්‍යාපාරිකයා 119 පොලිස් හදිසි ඇමතුම් අංකයට ඇමතුමක් දී කියා ඇත්තේ තම වත්තට හොරෙකු ඇතුළු වූ බවත් ඔහුට පොල් පිත්තකින් පහර දුන් බවත්ය. මෙම තොරතුරු මිනුවන්ගොඩ පොලිසියට ලැබීමෙන් පසු පොලිස් නිලධාරීන් කණ්ඩායමක් එහි පිටත්ව ගොස් ඇති අතර ඒ වන විටත් එම පුද්ගලයා ඉතා බරපතළ තත්ත්වයෙන් සිට ඇත. පසුව ඔහු ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර ඇත.

එම අවස්ථාවේ පහර කෑ කම්කරුවා සිය දියණියට කියා ඇත්තේ ධනපාලත් ඔහුගේ රියැදුරුත් තමාට පහර දුන් බවයි. හිසට මොට ආයුධයකින් පහර දුන් බවටද ඔහු විසින් තමාට පැවසූ බව දියණිය පොලිසියට ලබා දුන් කට උත්තරයේ සඳහන්ය.

මේ අනුව අදාළ සැකකාර ව්‍යාපාරිකයා හා රියැදු රා සති දෙකක් රක්ෂිත බන්ධනාගාරගතව සිට ඇප මත නිදහස්ව තිබේ.

ඒ අතරතුර හිසට සිදුවූ බරබපතළ තුවාල හේතුවෙන් කොළඹ ජාතික රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලද කම්කරුවා පෙරේද (18 වැනිද) මියගොස් ඇත.

මේ පිළිබඳ ඉදිරි විමර්ශන මිනුවන්ගොඩ පොලිසිය විසින් සිදු කරයි.

# ග්‍රහචාරය

**2023 ජූලි මස 20 වැනිදා බ්‍රහස්පතින්දා**

රාහු කාලය
සවස 01.50 - සවස 3. 24
රාත්‍රී 01.43 - රාත්‍රී 3.10

සුබ දිශාව - උතුර
මරු - දකුණ

### මේෂ
**සමාජ අසාධාරණය**

අන්‍යයන් අතරේ වඩාත් ඉස්මතුව සිටීමට ඇති ඉඩකඩ පාලනයක් විය හැකිය. ඒ සඳහා අවැසි මානසික තත්ත්වය ප්‍රබල වන නමුදු සවස් කාලයේදී එය වෙනස් වීමට පුළුවන. එහෙත් සමාජ අසාධාරණත්වය කෙරේ සැලකිලිමත් වේ.

### වෘෂභ
**ඉක්මන් හැඟීම්**

මෙතෙක් තරගකාරී මානසිකත්වයක සිටි ඔබට අද සවස් වනවිට එම තත්ත්වය වෙනස් වනු ඇත. හැඟීම් ඉක්මන් වූ තීරණයන්ට එළැඹීමට ඉඩ ඇත. පසු ප්‍රතිඵල ගැන අවධානය අවශ්‍ය වේ. විවාහ ජීවිතයන් සම්බන්ධව විශේෂයි.

### මිථුන
**සුහදශීලී ගුණය**

සාමාන්‍ය කතාබහේදී පැවති සුහදශීලී ගුණය තරමක් වෙනස් විය හැකිය. ඊට වඩා තරගකාරී ක්‍රියාකාරකම්වලට පෙලඹවීම් ඇති කෙරේ. ධෛර්යයත් උනන්දුවත් වඩාත් කැපී පෙනෙනු ඇත.

### කටක
**ධන ලාභ**

ස්වයං ශක්තිය වඩාත් ඵලදායිව ක්‍රියාත්මක කළ හැකිය. යම් යම් දේවල් ලැබීමේ ශක්තිය ගෙනදේ. ධන ලාභ ගෙන දේ. ජලය, කෘෂිකර්මය මෙන්ම කථනය හා සම්බන්ධ අයට වඩාත් විශේෂ වේ. අභිමානනීය හැඟීම් ඇතිවේ.

### සිංහ
**මානසික අසහන**

පෙර දිනවල පැවති මානසික අසහන ගතිපැවතුම් හැඟීම්වල වෙනසක් අද සවස වනවිට දැනෙනු ඇත. වඩාත් හැඟීම් පාලනයෙන් යුක්ත වේ. ආගමික හා උසස් අය අතරේ සබඳතා තවදුරටත් පවතිනු ඇත.

### කන්‍යා
**මූල්‍ය වාසි**

ඍජු මූල්‍ය වාසි ඇතත් තම හැකියාව හා ශක්තීන් මත වැඩ කටයුතු පාලනය කරගනු ඇත. සවස් කාලයේදී ඔබගේ මූල්‍ය ශක්තියේ වෙනසකට ඉඩ ඇත. ලැබෙන දේ වියදම් කිරීමට හේතු ඇතිවිය හැකිය.

### තුලා
**යහපත් දවසකි**

සාමාන්‍යයෙන් යහපත් දවසකි. ලැබීම් ඇතින් සාමාන්‍ය වුවත් වැඩ කිරීම් හා සම්බන්ධව යම් ලැබීමකට අවස්ථාව උදාවිය හැකිය. සවස් කාලයේදී වඩාත් විශේෂ වේ. රාජ්‍ය අංශයේ වැඩ කරන අයටද විශේෂය.

### වෘශ්චික
**ආකල්ප පාලනයක්**

වඩාත් කාර්යක්ෂම ලෙස යුහුසුළුව වැඩ කිරීමට පෙලඹේ. සවස් කාලය වනවිට එය වඩාත් සශ්‍රීක වුවත් ඊට ගැළපෙන අයුරින් මානසිකත්වය ස්ථාවර කරගන්න. ආකල්ප පාලනයක් අවශ්‍ය වේ.

### ධනු
**බාධාකාරී තත්ත්වයන්**

ඔබගේ හැකියාවන් අනන්‍යතාවන් තවදුරටත් සුපුරුදු ලෙස පවත්වාගෙන යනු ඇත. මානසිකව හෝ ජලය සම්බන්ධව කිසියම් බාධාකාරී තත්ත්වයන් ඇති වුවත් සවස් කාලය වනවිට එය කෙමෙන් තුනී වී යනු ඇත.

### මකර
**කරදර සහිතයි**

කතාබස් හා අන්‍යයන්ට වාචික උපදෙස් දීමේදී හැකි තරම් නිරවුල් වීමට උත්සාහ ගන්න. අනපේක්ෂිත ප්‍රතිචාරයන්ට ඉඩ ලැබිය හැකි බැවිනි. විවාහයන්, පාර්ශ්විය සබඳතාවන් ගැන යොමුවීමට සවස් කාලය බෙහෙවින්ම කරදර සහිත විය හැකිය.

### කුම්භ
**මුදල් ගැටලු**

වඩාත් කල්පනාකාරීව කටයුතු මෙහෙයවන්න. මිල මුදල් ගැටලුවලට ඉඩ ඇත. තරගකාරී හෝ සහෝදර හේතු ඇති කළ හැකිය. මනසට බාධක හිරිහැර වූ යමකින් සවස් කාලය වනවිට නිදහස් වීමට ඉඩ ඇතිවේ. විවාහ කටයුතු සම්බන්ධව හදිසි තීරණ නොගන්න.

### මීන
**ශරීර උෂ්ණාධිකවේ**

මිල මුදල් පරිහරණය සාමාන්‍ය පරිදි සිදුවනු ඇත. එහෙත් තැන්පතු ගැන පරීක්ෂාකාරී වන්න. දරුවන් හෝ තම අධ්‍යාපනික කටයුතු සම්බන්ධ ගැටලුකාරී තත්ත්වයකට සවස කාලයේදී ඉඩ ඇති කරයි. ශරීර උෂ්ණාධික තත්ත්වයන්ගෙන් ආරක්ෂා වන්න.




## සජිත් බන්දුලගෙන් ප්‍රතිඥාවක් ඉල්ලයි

විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන්ට රියැදුරු බලපත්‍ර ලබා ගැනීමට පහසුකම් සැලසීම සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් නිශාන්ත අනුරුද්ධ වීරසිංහ නව චක්‍රලේඛයක් නිකුත් කරන ලද්දේ පසුගියදය. එම චක්‍රලේඛය තවමත් අක්‍රිය තත්ත්වයේ පැවතීම සම්බන්ධයෙන් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය. එම ප්‍රශ්නය ඉදිරිපත් කරන අවස්ථාවේ සභාවේ සිටි ප්‍රවාහන කැබිනට් ඇමැති බන්දුල ගුණවර්ධනගෙන් විපක්ෂ නායකවරයා ඉල්ලා සිටියේ අදාළ චක්‍රලේඛය ක්‍රියාත්මක කරවන බවට ප්‍රතිඥාවක් දෙන ලෙසය.



විපක්ෂ නායකවරයා -

මම මේ ඉදිරිපත් කරන්නෙ බොහොම සංවේදී කාරණාවක්. අපේ රටේ ආබාධිත ප්‍රජාව ලක්ෂ දහතක් ඉන්නවා. ඒ ප්‍රජාවට රියැදුරු බලපත්‍ර ලබා දීමේදී අපේ රටේ ක්‍රියාත්මක වෙන්නේ යල් පැන ගිය වැඩසටහනක්.

ඒ ක්‍රමවේදයේ වෙනසක් වෙනුවෙන් අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කටයුතු කළා. එතුමා සිංගප්පූරුවටත් ගිහිල්ලා මේ ගැන සොයා බැලුවා. ඒ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස මේ වනවිට චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. මේක හොඳ වැඩක්. නමුත් තවම ඒ හොඳ වැඩේ ක්‍රියාත්මක නැහැ. මම ඉල්ලීමක් කරනවා එය ක්‍රියාත්මක කරන්න කියලා.

ප්‍රවාහන ඇමැති බන්දුල ගුණවර්ධන -

මේ ගැන මම අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා සමගත් සාකච්ඡා කළා. මේ විෂයය අදාළ වන්නේ ප්‍රවාහන රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න ඇමැතිතුමාට. එතුමා විශේෂ අවශ්‍යතා ඇති අයට රියැදුරු බලපත්‍ර ලබාදීම අත්හදා බැලීමේ ව්‍යාපෘතිය ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළා. එහෙම කරලා විවිධ විශේෂඥයන් සමග සාකච්ඡා කරලයි මේ චක්‍රලේඛය නිකුත් කළේ. ඒ චක්‍රලේඛය නිකුත් කරන්න මම දයක වෙනවා.

ඊට පිළිතුරු වශයෙන් 'මම කියනවා අජිත් මාන්නප්පෙරුමයි චක්‍රලේඛය නිකුත් කළේ' යනුවෙන් විපක්ෂනායකවරයා මෙහිදී කියා සිටියේ ඇමැතිවරයාට දැඩි ප්‍රතිචාරයක් දක්වමිනි.

'චක්‍රලේඛය නිකුත් කළ පසු ක්‍රියාත්මක නොකරන ලෙස බලපෑමක් තිබෙනවා. ඇමැතිවරයා ලෙස ඔබතුමා ප්‍රතිඥාවක් දෙන්න ඒක ක්‍රියාත්මක කරනවා කියලා. එතකොට කිසිම කෙනකුට බලපෑමක් කරන්න බැහැ.'

### බන්දුල ප්‍රතිඥා දෙන්න බැහැ කියයි

ඇමැතිවරයා -

'ක්‍රියාත්මක කරන්න තමයි චක්‍රලේඛය නිකුත් කරලා තියෙන්නේ. ප්‍රතිඥා දෙන්න අවශ්‍යතාවක් නැහැ.'

චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම නතර කිරීමට බලපෑමක් තිබෙන බව ප්‍රකාශ කළ නමුත් ඒ කවුදැයි විපක්ෂ නායකවරයා නොකීවේය. අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීවරයා මෙම වාදයට එක් වූයේ ඒ බලපෑම් කළ බව කියන රාජ්‍ය ඇමැතිවරයාගේ නමද කියමිනි. එහෙත් රාජ්‍ය ඇමැතිවරයා එම අවස්ථාවේ සභාවේ නොසිටියේය.

'දින කිහිපයක් මේ ගැන සාකච්ඡා කරලා චක්‍රලේඛය නිකුත් කළා. නමුත් ලසන්ත අලගියවන්න රාජ්‍ය ඇමැතිවරයා ඒක ක්‍රියාත්මක කරන්න එපා. කමිටුවකට ඉදිරිපත් කරන්න අවශ්‍යයි කියලා තියෙනවා.'



ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ඇමැති ප්‍රසන්න රණතුංග -

විශේෂ අවශ්‍යතා ඇති තැනැත්තන්ට රියැදුරු බලපත්‍ර දෙන්න කටයුතු කළේ ලසන්ත අලගියවන්න ඇමැතිතුමා. මුලින්ම රියැදුරු බලපත්‍ර පහක් ලබා දීලත් තියෙනවා. ඒ ක්‍රමය දැනටත් ගම්පහ ක්‍රියාත්මකයි.

අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රිවරයා -

අපි රණ්ඩු විය යුතු නැහැ. අද ගම්පහ ආර් එම් වී එකේ ආබාධිත පුද්ගලයකුට බලපත්‍ර දෙන්න යද්දි ඇමැතිතුමාම කතා කරලා කියලා තියෙනවා දෙන්න එපා කියලා. ඇමැතිවරයකුට පුළුවන්ද චක්‍රලේඛයක් නතර කරන්න.

බන්දුල ගුණවර්ධන ඇමැතිවරයා -

චක්‍රලේඛයක් ගහන්නේ ක්‍රියාත්මක කරන්න. කාටවත් නතර කරන්න බැහැනේ..

## මාර්ග අනතුරු නිසා අබාධිතයන්ට වෙලා තියෙන දේ

විවාදාත්මක තත්ත්වය එතැනින් අවසන් වූ නමුත් ඉන් විනාඩි කිහිපයකින් සභාවට පැමිණි ලසන්ත අලගියවන්න රාජ්‍ය ඇමැතිවරයා තමන්ට එල්ල කළ චෝදනාවට පිළිතුරු දෙමින් තමන් එම චක්‍රලේඛය අත්හිටුවූ බව පිළිගත්තේය. එම අවස්ථාවේ මාන්නප්පෙරුම මන්ත්‍රිවරයාද සිටි හෙයින් යළිත් විවාදාත්මක තත්ත්වයක් ඇති විය.

රාජ්‍ය ඇමැතිවරයා -

මම චක්‍රලේඛය තාවකාලිකව නතර කළා. මොකද එම යෝජනාව දෙවැනි වරටත් අමාත්‍යාංශ උපදේශක කාරක සභාවට යොමු කිරීමට එකඟතාවක් තිබුණා. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. යළිත් උපදේශක කාරක සභාවට යොමු කළ යුතු නිසයි නතර කළේ. සිංගප්පූරුව, ඔස්ට්‍රේලියාව වැනි රටවල තියෙන මාර්ග පද්ධතිය නෙමෙයි අපේ රටේ තියෙන්නේ. මෙරට මාර්ග පද්ධතිය අනුව විශේෂ අවශ්‍යතා ඇති තැනැත්තන්ට බලපත්‍ර දීමෙදි මීට වඩා වැඩි අවධානයක් ඒ සඳහා යොමු කළ යුතුයි. සදාකාලික නතර කිරීමක් නෙමෙයි කරන්නෙ..

අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රිවරයා -

මාර්ග අනතුරුවලින් සිදුවන මරණ ආබාධිත පුද්ගලයන් පිටින් යවන්න එපා. ඔවුන්ට රියැදුරු බලපත්‍ර ලබා ගැනීමට ඇති අවස්ථාව වළක්වන්න එපා.එයට රාජ්‍ය ඇමැතිවරයාගේ පිළිතුර වූයේ 'මේ නතර කිරීම ඒ අය නොසලකා හැරීමක් හෝ ඒ අයට කරදර කිරීමේ චේතනාවකින් කළ දෙයක් නෙවෙයි.' යන්නය.

■ නිලන්ත මදුරාවල



# ඊළඟ ජනාධිපතිවරණයට මුදල් හොයාගන්න අධික මිලකට පිටි විකුණනවා

**- අනුර දිසානායක (ජා.ජ.බ.)**

**ලෝක වෙළෙඳපොළේ තිරිඟු පිටි මිල අඩු වෙමින් තිබියදී සහ ඩොලරයේ අගය අඩු වෙමින් තිබියදී පිටි සමාගම් ඒ වාසිය පාරිභෝගික ජනතාවට නොදෙන බව ජාතික ජන බලවේගයේ කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී අනුර දිසානායක පාර්ලිමේන්තුවේ දී ඊයේ (19 වැනිදා) පැවැසීය. විශේෂ ප්‍රකාශයක් කරමින් මේ බව කී ඒ මහතා මෙසේද කීවේය.**

අද වෙනකොට දිවයින පුරා බේකරි 6000ක් පමණ ක්‍රියාත්මකයි. ප්‍රධාන ආහාරය වන බත් හැර වතුකරයේ ජනතාව වැඩි වශයෙන් ලබාගන්නා ආහාර වර්ග බොහොමයක් හදන්නේ පිටිවලින්. මේ අනුව තිරිඟු පිටි මිල වැඩිවීම ජනතාවගේ ජීවන බරට සෘජුවම බලපානවා. මෙවැනි තත්ත්වයක් තිබියදී ආනයන බලපත්‍ර නොමැතිව තිරිඟු පිටි ආනයනය කිරීම තහනම් කිරීමට ආණ්ඩුව තීරණය කර තිබෙනවා. ආනයනය තහනම් කළාට නව ආනයන බලපත්‍ර ලබාදෙන බව සඳහන් කළා. නමුත් නව ආනයන බලපත්‍ර ලබාදීමක්ද සිදුකර නැහැ. ඒ අනුව දේශීය වෙළෙඳපොළට අවශ්‍ය තිරිඟු පිටි ඇට ආනයනය කර මෙරටදී පිටි නිෂ්පාදනය කරන සමාගම් දෙකක ඒකාධිකාරයට යටත්ව තිබෙනවා.

තිරිඟු පිටි ආනයනය කරන්න දෙන්නේ නැත්නම් ප්‍රීමා ආයතනය හා සෙරන්ඩිබ් ආයතනය තමයි අපේ රටට අවශ්‍ය පිටි ලබා දෙන්නේ. ඒ කියන්නේ තිරිඟු පිටි ඒකාධිකාරයක් තිබෙන්නේ. ගැටලුව වන්නේ අයුතු ලාභයක් ලබමින් තිරිඟු පිටි අලෙවියයි. ඒ වගේම පිටි කිලෝවක් රුපියල් දෙසිය ගණනකට අලෙවි කළත් මේ අය ඇට කිලෝවක් වෙනුවෙන් ආණ්ඩුවට ගෙවන්නේ රුපියල් තුනක් වැනි මුදලක්. සමාගම් දෙකක් විසින් පිටි මිල සම්බන්ධයෙන් ඒකාධිකාරයක් පවත්වාගෙන යන්නේ. මෙවැනි තත්ත්වයක් තුළ මේ අය විශාල ලාභයක් ලබනවා. ඒ වගේම පිටි කිලෝවකින් රුපියල් තිස්පහක මුදලක් රජයට අයවිය යුතුයි. නමුත් ඒක ගෙවන්නෙත් නැහැ. පාරිභෝගික ජනතාවට සහන මිලට පාන් පිටිත් නැහැ.

ලෝක වෙළෙඳපොළේ තිරිඟු පිටි මිල අඩු වෙමින් තිබියදී තිරිඟු ඇට අඩු වෙමින් තිබියදී ඩොලරයේ අගය අඩු වෙමින් තිබියදී පිටි සමාගම් ඒ වාසිය පාරිභෝගික ජනතාවට දෙන්නේ නැහැ. මම දන්නවා ජනාධිපති ඡන්දයේදී අරමුදල් හදන්නේ මේ අයගේ සල්ලිවලින්. ඒ නිසා මේ සමාගම්වලට වෙන ආකාරයෙන් මුදල් උපයා ගන්න අවස්ථාව දෙනවා. මේක තමයි තියෙන එකඟතාව. මේ ගොල්ලන් හැම ජනාධිපති ඡන්දයකටම සල්ලි පොම්ප කරපු අය. එළැඹෙන ජනාධිපතිවරණයට අරමුදල් එකතු කිරීමට සිදුවී ඇති නිසා තමයි පිටි අධික මිලකට පාරිභෝගික ජනතාවට දීමට සිදුවී තිබෙන්නේ. මේ ගැන පිළිතුරු දීමට අගමැතිතුමාට සභානායකතුමාට අපහසුවක් තියෙන බව මම දන්නවා.

# නව කැලණි පාලමේ කොටස් සොරා ගැනීමෙන් වෙලා ඇති අලාභය ලක්ෂ 59ක්

**- ඇමැති බන්දුල ගුණවර්ධන**

**පසුගිය වසරේ මැයි මාසය දක්වා කාලයේදී කැලණි පාලමේ කොටස් හොරකම් කිරීමෙන් රුපියල් දෙකෝටි අනූ හතර ලක්ෂයක සහ නව කැලණි පාලමේ කොටස් හොරකම් කිරීමෙන් රුපියල් පනස් නව ලක්ෂයක අලාභයක් සිදු වී තිබෙන බව ප්‍රවාහන හා මහාමාර්ග ඇමැති බන්දුල ගුණවර්ධන පාර්ලිමේන්තුවේදී ඊයේ (19 වැනිදා) පැවැසීය. විශේෂ ප්‍රකාශයක් කරමින් මේ බව කී ඇමැතිවරයා මෙසේද සඳහන් කළේය.**

කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ මීට දෙවසරක කාලයක පමණ සිට බාහිර පුද්ගලයන්ගේ නොයෙක් හොරකම්වලට ලක්වීම පටන් ගත්තා. මුලින්ම අධිවේගී මාර්ග රක්ෂිත වැඩ කොටසේ සොරකම්වලින් පටන් ගන්නා ලද මෙම විනාශකාරී ක්‍රියා කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ මධ්‍ය විදුලි පහන්වලට හා විදුලිය සපයන තඹ විදුලි රැහැන් කැපීම දක්වා වර්ධනය වෙලා. එමෙන්ම මේ වනවිට සොරුන් විසින් නව කැළණි පාලම් ව්‍යාපෘතියේ අපවාහන ජල පද්ධතියේ පීවීසී නල කොටස්, වායු සමීකරණ යන්ත්‍ර කොටස්, පාලමේ නිරීක්ෂනය සහ නඩත්තු කටයුතු සඳහා පාලමේ යටපැත්තේ ඉදිකර ඇති පදික පාලමේ ආරක්ෂිත වැටේ ජීඅයි බට සොරකම් කිරීම සිදුකර තිබෙනවා. කොවිඩ් 19 වසංගතය නිසා රට වැසීමත්, විදුලි අර්බුදය යටතේ බොහෝ කාලයක් විදුලිය සම්පූර්ණයෙන් විසන්ධි කර තිබීමත්, කළුවරේ තිබුණු කාලවල හොරකම් සඳහා වැඩියෙන් පාවිච්චි කර තිබෙනවා. තඹ විදුලි රැහැන් තමයි වටිනාකමින් වැඩි. ඇණ නෙවෙයි.





## දූෂණ විරෝධී පනත සම්මතයි

**දූෂණ විරෝධී පනත් කෙටුම්පත සංශෝධන සහිතව ඡන්ද විමසීමකින් තොරව පාර්ලිමේන්තුවේදී ඊයේ (19 වැනිදා) සම්මත විය. මෙම පනත් කෙටුම්පතට ආණ්ඩු පක්ෂයෙන් මෙන්ම විපක්ෂයෙන්ද සංශෝධන ඉදිරිපත් කෙරිණි. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමැති විජේදාස රාජපක්ෂ 2023 අප්‍රේල් 27 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද මෙම පනත් කෙටුම්පතෙහි දෙවැනිවර කියවීමේ විවාදය ජූනි මස 21 සහ ජූලි 6 යන දෙදිනේ පැවැත් විණි.**

## ළමා නිවාසවල දරුවන් 1,747ක්

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති ළමා නිවාසවල දරුවන් එක් දහස් හත්සිය හතළිස් හත් දෙනෙක් රැකවරණය ලබන බව පාර්ලිමේන්තුවේ ඊයේ සභාගත කරන ලද පිළිතුරක සඳහන් වෙයි. මෙම දරුවන් රැකවරණය ලබන ළමා නිවාස සංඛ්‍යාව හතළිස් දෙකකි. මෙම පිළිතුර සඳහන් වූයේ කෑගල්ල දිස්ත්‍රික් මන්ත්‍රිනි රාජිකා වික්‍රමසිංහ අසන ලද ප්‍රශ්නයකට ලබා දුන් පිළිතුරකය.

# පාසල් දරුවන් වැඩි පිරිසක් මත්ද්‍රව්‍යවලට ගොදුරු වෙලා



**- අතුරලියේ රතන හිමි (අ.ජ.බ.ප.)**

**පාසල් වයසේ දරුවන් වැඩි පිරිසක් මත්ද්‍රව්‍යවලට ගොදුරු වී ඇති බව අපේ ජනබල පක්ෂයේ පත් කළ මන්ත්‍රී අතුරලියේ රතන හිමියෝ පාර්ලිමේන්තුවේදී ඊයේ (19 වැනිදා) ප්‍රකාශ කළහ. විශේෂ ප්‍රකාශයක් කරමින් මේ බව කී උන්වහන්සේ මෙසේද පැවැසීය.**

අද වනවිට අප සිටින්නේ රට අරාජිකත්වයට පත්වන වකවානුවක. මෙය බරපතළ තත්ත්වයක්. රට දේශපාලනික හා ආර්ථික වශයෙන් කඩා වැටීමේ අවදානමක තිබෙනවා. මෙවන් තත්ත්වයක් යටතේ රටට ඇති වූ දේ අපි දැක්කා. හැමෝම මෙම ව්‍යාකූල තත්ත්වය උඩ තනිව ගොඩනැගෙන්නට උත්සාහ කරන බවක් පේන්නට තිබෙනවා. ශමිනි කෞශල්‍යා අපේ ක්‍රීඩිකාවක්. ජාතික රිටි පැනීමේ ශූරිය. මේ වෙනකොට යන්තමින් අවුරුදු විස්සයි. අද වෙනකොට මැදපෙරදිග ගෘහ සේවයට ගිහින් තිබෙනවා. ඇයගේ ප්‍රකාශයක් එක්තරා රූපවාහිනී නාලිකාවක විකාශය වුණා. සමාජ මාධ්‍ය තුළත් මෙය ප්‍රචාරය වුණා. හෘද සාක්ෂියක් ඇති අපට මේ සම්බන්ධයෙන් දුකක් කනගාටුවක් ඇති වන්නේ නැද්ද.

ඒ වගේම ජාතික මට්ටමට ක්‍රීඩිකාවක් හදන්න මොන තරම් වෙහෙසක් දරන්නට සිදු වෙනවාද. අධ්‍යාපන අමාත්‍යාංශය පුහුණු සැසි පවත්වමින් මොන තරම් වෙහෙසක් ගන්නවාද. ඒ වගේම මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අධ්‍යාපන ඇමතිවරයාත් දන්නවා. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින්නේ මොන වගේ වාතාවරණයක්ද කියලා අපි දන්නවා. කොවිඩ් ඇතුළු විවිධ හේතු නිසා දරුවො පාසල් ගියේ නැහැ. දරුවො ජංගම දුරකථනවලට පුරුදු වුණා. සූම් තාක්ෂණයෙන් ළමයි ඉගෙන ගත්තේ අඩුවෙන්. දරුවන්ගෙන් විශාල පිරිසක් අද මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා. අවුරුදු 16, 17 දරුවො ගොඩක් ගොදුරු වෙලා.



**- ඇමැති සුසිල් ප්‍රේමජයන්ත**

# පාසල්වල මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පාලනයට දීප ව්‍යාප්ත වැඩසටහන් ක්‍රියාත්මකයි

**පාසල්වල මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා දීප ව්‍යාප්ත මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක බව අධ්‍යාපන ඇමැති සුසිල් ප්‍රේමජයන්ත පාර්ලිමේන්තුවේදී ඊයේ (19 වැනිදා) ප්‍රකාශ කළේය. අපේ ජන බල පක්ෂයේ පත් කළ මන්ත්‍රී අතුරලියේ රතන හිමි මතුකළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් මේ බව කී ඇමැතිවරයා මෙසේද සඳහන් කළේය.**

කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පාසල් පද්ධතිය තුළ දිවා ආහාර ලබාදීම, මත්ද්‍රව්‍ය නිවාරණය, වෘත්තිය පුහුණුව යන කාරණා කෙරෙහි අවධානය යොමුකර තිබෙනවා. රාජගිරිය, ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සහ කොළඹ කලාපයේ පාසල් එකසිය හතළිස් හතරක් තිබෙනවා. එයින් පාසල් විසි එකක් ජාතික පාසල්. 21ක් රජයේ ආධාර ලබන හෝ පෞද්ගලික පාසල්. ඉතිරි පාසල්වලින් 18ක් දිවා ආහාරය ලබා දියයුතු බවට අපි හඳුනා ගත්තා. දරුවන් දෙසීයට අඩු පාසල් සම්බන්ධයෙන් අපි වැඩපිළිවෙළක් ඇති කළා. මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් අපි වැඩපිළිවෙළක් ආරම්භ කර තිබෙනවා.

අපි කවුරුත් නිකන් නැහැ. මම මාසිකව පළාත් අධ්‍යක්ෂවරුන් නව දෙනා සමගම සූම් තාක්ෂණය ඔස්සේ රැස්වීමක් ගන්නවා. ඒ න්‍යාය පත්‍රයේ එකක් තමයි තිල ඇඳුම්, දිවා ආහාරය, මත්ද්‍රව්‍ය නිවාරණය කියන මේ කාරණා සියල්ලම කතා කිරීම. පළාත් නවය සම්බන්ධයෙන්ම අපි අවධානය යොමුකර තිබෙනවා. හැම පළාතෙම මේ තත්ත්වය නැති වෙන්න පුළුවන්. ඒ සියල්ලම පළාත් බලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු වෙනවා. ඒ වගේම කොළඹ නගරයේ පමණක් උපදේශනයට අදාළ ගුරුවරුන් කැඳවා මත්ද්‍රව්‍ය නිවාරණ අංශය, පොලිසිය, අන්තරායකර ඖෂධ නියාමන අධිකාරිය ආදි සියල්ල එක්වී වැඩමුළු පැවැත්වූවා පාසල් තුළ මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන්. පසුගිය කාලයේදී එක්තරා කාලයක අතිශයෝක්තියෙන් ඇතැම් මාධ්‍ය පාසල් සම්බන්ධයෙන් වාර්තා කළා. ඒකෙන් අහිතකර බලපෑමක් ඇති වෙනවා. ඒ වගේම අපි මේ කාර්ය කරන්නේ පාසල් දරුවන් පෙළන්නේ නැතිවයි.

මම සාකච්ඡා වට ගණනාවක් පැවැත්වූවා. ඒ සාකච්ඡාවලදී අන්තරායකර ඖෂධ නියාමන අධිකාරියේ වෛද්‍යවරු, මනෝ වෛද්‍යවරු අපට උපදෙස් දෙනවා මෙය කළ යුතු ආකාරය සම්බන්ධයෙන්. ඒක අපේ මට්ටමින් මාසිකව අපි යම් අධීක්ෂණයකට ලක් කරනවා.

# අලි ප්‍රහාරයෙන් මිත්තණිය මරුට මිනිබිරිය රෝහලේ

■ නුවන් ආරියවංශ- ඇල්ල

මහියංගණය දෙහිගොල්ල ගම්මානයේ නිවසකට ඊයේ (19 වැනිදා) අලුයම් කාලයේ එල්ලවූ අලි ප්‍රහාරයකින් එම නිවෙස් ජීවත්වූ කාන්තාවක් මියගොස් තවත් කාන්තාවක් බරපතළ තුවාල ලබා ඇතැයි මහියංගණය පොලිසිය පවසයි. මියගොස් ඇත්තේ කුඩාගලයාය දෙහිගොල්ල ලිපිනයේ පදිංචිව සිටි ඊ.ජී. දයාවතී නමැති 68 හැවිරිදි කාන්තාවකි. තුවාල ලබා ඇත්තේ ඇගේ මිනිබිරිය වන පියුමි ලක්ෂානි (23) නමැත්තියකි. ආතම්මා සහ මිනිබිරිය නිදාගෙන සිටියදී අලුයම 2.30 ට පමණ මෙම අලි ප්‍රහාරය එල්ලවී ඇත. නිවසටද බරපතළ හානියක් සිදුව තිබේ.

කාන්තාවන් දෙදෙනා මහියංගණය මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් මිත්තණිය මියගොස් ඇතැයිද පොලිසිය සඳහන් කළේය. බදුල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුජිත් වෙදමුල්ලගේ උපදෙස් මත මහියංගණය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්. විජේරත්නගේ මෙහෙයවීමෙන් මහියංගණය පොලිසිය විමර්ශන සිදුකරයි.



# කළු ඇලෙන ද්‍රව්‍යයක් බටහිර වෙරළට ඇවිත්

■ ජුඩ් සමන්ත-පුත්තලම

කළු පැහැති කිසියම් තෙල් සහ තාර වැනි ද්‍රව්‍යයක් බටහිර වෙරළට විශාල වශයෙන් ගොඩ ගසන්නට පටන්ගෙන ඇති බව ධීවරයෝ සඳහන් කරති.

මීගමුවේ සිට කල්පිටිය - නොරච්චෝලේ දක්වා මෙම ද්‍රව්‍යයන් දක්නට ඇති බව සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරිය තහවුරු කළේය.

පෙරේදා (18 වැනිදා) පෙරවරුව වන විට ඉතාමත්ම සුළු වශයෙන් මෙම ද්‍රව්‍යයන් වෙරළ තීරය තුළ දක්නට ලැබිණි. නමුත් එදින සවස් කාලය වන විට මෙම ද්‍රව්‍යයන් විශාල වශයෙන් ගොඩ ගසන්නට පටන් ගත් බවද ධීවරයන් කියයි.

ඇලෙන සුලු තත්ත්වයක පවතින මෙම ද්‍රව්‍යයන් මුහුදට එකතුවී ඇත්තේ කුමන අකාරයකටද යන්න තහවුරු වී නොමැති බව සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරිය සඳහන් කරයි. මේවා කිසියම් නැවකින් පිටකර ඇති ද්‍රව්‍යයක්ද, එසේ නොමැති නම් කර්මාන්ත ශාලාවකින් මුහුදට ගෙනවිත් දැමූ ඒවාද යන්න තහවුරු වී නොමැති බවද ඔවුහු කියා සිටිති.

මේ අතර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ද පැමිණ වෙරළට ගොඩ ගසා ඇති ආගන්තුක ද්‍රව්‍යයන් පිළිබඳව සොයා බලන ආකාරයක් දක්නට ලැබිණි.

# වාලච්චේනේ රථගාලක ගින්නක්



ගින්නෙන් විනාශ වී ගිය පාපැදි හා යතුරු පැදි ගාල

## යතුරු පැදි 30ක් - පාපැදි 7ක් අළු වෙයි

■ නිමල් ජයරත්න -මනම්පිටිය

මඩකලපුව වාලච්චේන කරුවන්තේනි හන්දියේ පිහිටි පෞද්ගලික යතුරු පැදි, හා පාපැදි රථ ගාලකට පෙරේදා (18 වැනිදා) සවස හතරට පමණ ඇති වූ ගින්නකින් එහි තිබූ යතුරුපැදි හා පාපැදි ගාල සම්පූර්ණයෙන්ම ගිනිගෙන විනාශ වී ඇති බව වාලච්චේන පොලිසිය කියයි.

මෙම ගින්න හේතුවෙන් ගාල් කර තිබූ යතුරුපැදි තිහක් හා පාපැදි හතක් සම්පූර්ණයෙන් ගිනිගෙන විනාශ වී ඇති බව වාලච්චේන පොලිස් ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්ත බණ්ඩාර අප කළ විමසීමකදී පැවසීය.

පාළුවට ගිය ඉඩමක මෙම රථ ගාල පුද්ගලයකු විසින් පවත්වාගෙන ගොස් ඇති අතර ඒ අසල ඇති වූ ගින්නක් පැතිර යාම නිසා මෙම යතුරු පැදි ගාල ගිනිගෙන ඇති බවට විශ්වාස කරන බව පරීක්ෂණ සිදුකරන වාලච්චේන පොලිසිය සඳහන් කරයි.

පුද්ගලික රථ ගාල පවත්වාගෙන ගිය පුදුකුඩිඉරිප්පු වාලච්චේන ප්‍රදේශයේ අයෙකු අත්අඩංගුවට ගත් බවද පොලිසිය සඳහන් කරයි.

එම පාපැදි හා යතුරුපැදි ගාලේ තිබූ පාපැදි අටක් සහ ත්‍රිරෝද රථයක් පොලිස් නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් එක්ව බේරාගෙන ඇති බවද පොලිසිය පවසයි.

සිද්ධිය සම්බන්ධ වාලච්චේන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්ත බණ්ඩාර ඇතුළු පොලිස් නිලධාරී කණ්ඩායමක් වැඩිදුර විමර්ශන සිදුකරයි.

# රට යවන බිම්මල් බර්ගර් මිශ්‍රණයට ලොකු ඉල්ලුමක්

■ නිර්මාණී තිලකසිරි

අගය එකතු කළ බිම්මල් නිෂ්පාදන අපනයන වෙළෙඳපොළ වෙත නිකුත් කිරීම හරහා මේ වන විට විශාල ආදායමක් උපයන නිෂ්පාදකයන් බිහිවී ඇති බව අපනයන සංවර්ධන මණ්ඩලය සඳහන් කරයි.

වෙළෙඳපොළ තුළ පවතින මාංශ අඩංගු බර්ගර් බනිස් වෙනුවට නිර්මාංශ බර්ගර් බනිස් මිශ්‍රණයක් සකසා මේ වන විට අපනයනය කරයි. මෙම නිෂ්පාදනය කිරීමේදී බිම්මල් සමග පොලොස් මිශ්‍ර කිරීම සිදුකරන බැවින් නිර්මාංශ ආහාරයක් වුවද එයට ආවේණික මස් රසයක් පවතියි. නිර්මාංශ ආහාර සඳහා රුචිකත්වයක් දක්වන බොහෝ පිරිස් බිම්මල් ආහාරය සඳහා එක්කර ගැනීමට පෙලඹී ඇත.





මිශ්‍රණය සකස් කරමින්

Silk coopfration ආයතනය විසින් මෙම බනිස් මිශ්‍රණය නිෂ්පාදනය කරන අතර දෛනිකව බිම්මල් කිලෝ 350ක් පමණ යොදා ගනිමින් බර්ගර් මිශ්‍රණ 15000ක් නිෂ්පාදනය කිරීමේ හැකියාව ඔවුන්ට පවතින බව එහි විධායක අධ්‍යක්ෂ සහන් බක්මීවැව පැවසීය. එමෙන්ම තම ආයතනයේ නිෂ්පාදන හරහා වාර්ෂිකව ඩොලර් මිලියනයක පමණ ආදායමක් හිමිව ඇති බව හෙතෙම පැවසීය. මේ හරහා දැනටමත් ඍජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් නිර්මාණය කර ඇති අතර ඒ අතරින් වැඩි සේවක ප්‍රමාණයක් විශ්වවිද්‍යාල තුළින් ඉවත්ව රැකියා විරහිතව සිටි තරුණ පිරිසක් වීම විශේෂත්වයකි.

නිෂ්පාදන සිදුකිරීම සඳහා අවශ්‍ය බිම්මල් මේ වන විට එම ආයතනය තුළින්ම සපයා ගන්නා බවත් ඉල්ලුම වැඩිවීමත් සමග ඉදිරියේදී බිම්මල් වගාකරුවන් හරහා බිම්මල් ලබාගැනීමට අපේක්ෂා කරන බැවින් වගාකරුවන්ට තම ආයතනය සමග එකතු විය හැකි බවත් අපනයන සංවර්ධන මණ්ඩලය කියයි.

# නව විදුලි ගාස්තු සංශෝධනයට ඇඟලුම් කර්මාන්තය සතුටින්

මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින් කාර්මික ක්ෂේත්‍රයේ කාර්ය බහුල නොවන වේලාවන් (off-peak) සඳහා සිදු කරන ලද විදුලි ගාස්තු සංශෝධනය ඇඟලුම් කර්මාන්තයේ තිරසරභාවය සඳහා හේතුවන බව ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය (JAAF) සඳහන් කරයි.

ජූලි-දෙසැම්බර් කාලය සඳහා මෑතකදී සිදු කරන ලද විදුලි ගාස්තු සංශෝධනයට සිය සතුට පළකරන බවද එම සංසදය කියයි.


ඉකුත් වසරේ (2022) අගභාගයේදී සහ මේ වසර (2023) මුලදී ක්‍රියාත්මක කරන ලද විදුලි ගාස්තු සංශෝධනවලදී ඇඟලුම් කර්මාන්තකරුවන්ගේ අදහස් සහ යෝජනා සැලකිල්ලට නොගත් බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස, කාර්යබහුල නොවන වේලාවන්හි සිදු කරනු ලබන මෙහෙයුම් සඳහා වැය වන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් රැකියා අහිමි වීමේ අවදානමක් මතු වූ බවත් ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය පවසයි.

මාස 12 ක් ඇතුළත කාර්ය බහුල නොවන වේලාවන් සඳහා වන විදුලි ගාස්තු සියයට 400 කින් අසාමාන්‍ය ලෙස ඉහළ ගිය බවත්, එම තත්ත්වය ඇඟලුම් කර්මාන්තයේ තරගකාරිත්වයට සහ රටේ ආර්ථිකයට ඉතා තීරණාත්මක වන විදේශීය ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමේ හැකියාවට සැලකිය යුතු තර්ජනයක් වූ බවත් එම සංසදය පවසයි.

විදුලි ගාස්තු සංශෝධනය නිසා කාර්ය බහුල නොවන වේලාවන්හිදී සිය නිෂ්පාදන මෙහෙයුම් සහ රැකියාවන් පවත්වා ගැනීමට හැකියාව ලැබෙන බවද එම සංසදය කියයි.

නව විදුලි ගාස්තු සංශෝධන හේතුවෙන් සමස්ත කර්මාන්තය සඳහා සියයට 9 කින් පමණ විදුලි ගාස්තු අඩුවීමක් සිදුවී ඇතැයිද ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය පවසයි.

# උතුරේ පොල් ත්‍රිකෝණයට ඉඩම් හඳුනාගනී



■ නිර්මාණී තිලකසිරි

මෙරට දෙවන පොල් ත්‍රිකෝණය උතුරු පළාත තුළ ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගැනීම මේ වන විට සිදුකරමින් සිටින බව පොල් වගා කිරීමේ මණ්ඩලය සඳහන් කරයි.

මීට වසර දෙකකට පමණ පෙර උතුරු පළාත කේන්ද්‍ර කරගනිමින් නව පොල් ත්‍රිකෝණයක් ආරම්භ කිරීමට යොජනා වූ අතර උතුරු පළාත තුළ බහුල ලෙස ව්‍යාප්තව පවතින තල් වගාව සමග පොල් වගාව ව්‍යාප්ත කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය යෝජනා වී ඇත. මේ වන විට එහි මූලික අදියර හඳුනාගැනීම් සිදුකර ඇති බැවින් නව පොල් ත්‍රිකෝණයක් මෙම වසර තුළදී ආරම්භ කිරීමට හැකියාව ඇති බව පොල් වගා කිරීමේ මණ්ඩලය පැවසීය.

ඒ අනුව උතුරු පළාත තුළ අක්කර 50 000ක පමණ නව පොල් වගාව ව්‍යාප්ත කිරීමට නියමිත අතර පොල් වගා කිරීමේ මණ්ඩලය සහ තල් සංවර්ධන මණ්ඩලය එක්ව එම කටයුතු සිදුකරමින් ඇති බවත් නව පොල් ත්‍රිකෝණය සඳහා හඳුනාගෙන ඇති ඉඩම් මේ වන විට පොල් සංවර්ධන නිලධාරින් විසින් පරික්ෂා කරමින් ඇති බවත් පොල් වගා කිරීමේ මණ්ඩලය පැවසීය.












# රනිල් වෙනුවෙන් මහින්දානන්ද කඩුව අතට ගනී

### අරුණ කී දේ සැබෑ වෙයි

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාව පසුගිය සිකුරාද පස්වරුවේ පක්ෂ නායක මෛත්‍රීපාල සිරිසේනගේ ප්‍රධානත්වයෙන් රැස්විය. මෙම රැස්වීමට ආණ්ඩුවේ තනතුරු ලබාගැනීම හේතුවෙන් පක්ෂ සාමාජිකත්වය අත්හිටවූ නිදහස් පක්ෂ සාමාජිකයන් පිරිසක්ද එක්ව සිටියේය. රංජිත් සියඹලාපිටිය හා ශාන්ත බණ්ඩාර පැමිණ සිටියේ නැත. මෙහිදී අදහස් දැක්වූ අමාත්‍ය මහින්ද අමරවීර ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් ලෙස පක්ෂයේ යහපත උදෙසා සිදුකරන ඕනෑම දෙයකට සහාය දෙන බව පැවසීය. මෙහිදී හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන පැවසුවේ ''උසාවි නියෝගය නොවෙයි. උසාවි නියෝගයෙන් පක්ෂයට ආ බව ඇත්ත. හැබැයි හදවතින් එන්න. හදවතින් පක්ෂයත් එක්ක ඉන්න.'' මෙහිදී අදහස් දැක් වූ ආසන සංවිධායකයන් බහුතරයක් ප්‍රකාශ කළේ ආණ්ඩුවෙන් අයින් වෙලා පක්ෂය සමග සිටිනා ලෙසයි. මහ ලේකම් දයාසිරි මේ මතයේ දැඩිව සිටියේය.



අනතුරුව සෙනසුරාද ශ්‍රී ලනිප සමස්ත ලංකා කාරක සභාව සහ විධායක සභාව රැස්විය. මීටද ආණ්ඩුවේ තනතුරු ලබාගත් පක්ෂ සාමාජිකයන්ටද ඇරියුම් කර තිබුණු අතර ඔවුන් ඊටද සහභාගි විය. මෙහිදී ආණ්ඩුවේ තනතුරු ලබාගැනීම හේතුවෙන් පක්ෂ සාමාජිකත්වය තාවකාලිකව අත්හිටවූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාමාජිකයන් යළි එම තනතුරුවල පිහිටුවීමට පියවර ගැනුණි. මේ අනුව අමාත්‍ය නිමල් සිරිපාලට පක්ෂයේ උප සභාපති තනතුරද අමාත්‍ය ලසන්ත අලගියවන්නට පක්ෂයේ භාණ්ඩාගාරික ධුරයද යළි හිමිවිය. ලසන්ත ගිය පසු පක්ෂයේ භාණ්ඩාගාරික වූ දූෂ්මන්ත මිත්‍රපාලට ලසන්ත යළි ආ පසු තනතුර අහිමි විය. මේ නිසා දූෂ්මන්තව අලුතින් ඇති කළ ජ්‍යෙෂ්ඨ උප සභාපති ධුරයක පිහිටු වීය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සමස්ත ලංකා කාරක සභාව හා විධායක සභාව 15වැනිද රැස්වන බවත් එහිදී පක්ෂයේ පොදු මතය කඩ කරමින් ආණ්ඩුවේ තනතුරු ලබාගෙන පක්ෂ සාමාජිකත්වය අහිමිවූවන්ට යළිත් පක්ෂයේ තනතුරු ලැබෙන බවත් මීට සති දෙකකට පෙර අප මෙම තීරුවෙන් මුලින්ම රටට අනාවරණය කළෙමු.

රැස්වීම අවසානයේදී සියලු දෙනා පක්ෂ මූලස්ථානයෙන් එළියට පැමිණ දෙකට බෙදුණු පක්ෂය යළිත් එකක් වූ බව මාධ්‍ය ඉදිරියේ පෙන්වීමට උත්සහා කළේය.

කෙසේවුවද ශ්‍රීලනිප අභ්‍යන්තර ආරංචි මාර්ග පවසන්නේ, සිරිසේනගේ ස්ථාවරය සම්බන්ධයෙන් එම පක්ෂයේ මහ ලේකම් දයාසිරි ජයසේකර, තිලංග සුමතිපාල ඇතුළු කිහිපදෙනකු විරෝධය පළකර ඇති බවයි. තිලංග පවසා ඇත්තේ පක්ෂයට එනවා නම් කරුණා කර ආණ්ඩුවේ නිල තල පැත්තකට කරලා එන්න. නැතිනම් අපට විපක්ෂයේ කාර්ය භාරය කරන්න ඉඩ දෙන්න කියායි.

### රනිල් එජාප භාර දෙන්න සූදානම් වෙයි

එක්සත් ජාතික පක්ෂයේ නායකත්ව මණ්ඩලයක් ඇති කිරීමට එක්සත් ජාතික පක්ෂයේ නායක, ජනාධිපති රනිල් වික්‍රමසිංහ තීරණය කර ඇත. ජනාධිපතිවරයා මෙම තීරණය ගෙන ඇත්තේ, ජනාධිපති ධුරයේ රාජකාරී බහුල බැවින් පක්ෂ කටයුතු උදෙසා වැඩි කාලයක් ගත කිරීමට නොහැකිවීමත් පක්ෂයේ දෙවන පෙළ නායකයන් බිහිකිරීමත් යන අරමුණු මුල් කර ගනිමිනි.

ජනාධිපති වික්‍රමසිංහ ඉකුත් සතියේ මේ සම්බන්ධයෙන් පක්ෂ ජ්‍යෙෂ්ඨයන් හමුවී සාකච්ඡා කර ඇති අතර එක්සත් ජාතික පක්ෂයේ ඉදිරි නායකත්වය සම්බන්ධයෙන් අනවශ්‍ය ගැටලුවක් ඇති නොවීම මෙම නායකත්ව මණ්ඩලය පත් කිරීමේ අරමුණ බව ජනාධිපතිවරයා පක්ෂ ජ්‍යෙෂ්ඨයන්ට දැනුම් දී ඇත. සමාන තත්ත්වයේ බලතල සහිතව නායකත්ව මණ්ඩලයක් පත් කිරීමෙන් සැබෑ නායකයන්ට ඉදිරියට පැමිණිය හැකි වන අතර එසේ කළ නොහැකි පිරිසට පසුබැසීමට සිදුවනු ඇතැයි ජනාධිපතිවරයා මෙහිදී සඳහන් කර තිබේ.

එජාප ආරංචි මාර්ග පවසන්නේ අගෝස්තු මස මැද සතියේ පැවැත්වෙන පක්ෂ සම්මේලනයේදී මෙම යෝජනාව සම්මත කර ගැනීමට නියමිත බවයි.

### ඉන්දියාවට යන්න කලින් ජනපති හමුවූ පිරිස

පසුගිය අඟහරුවාද පස්වරුවේදී ජනාධිපති වික්‍රමසිංහ හා උතුරු නැගෙනහිර දෙපළාත නියෝජනය කරන දෙමළ මන්ත්‍රීන් අතර සාකච්ඡාවක් පාර්ලිමේන්තුවේදී පැවැත්විණි.

දෙමළ දේශපාලන සිරකරුවන්, උතුරේ අතුරුදන් වූවන් සහ උතුරේ ඉඩම් ප්‍රශ්නය පිළිබඳ කාරණා මෙහිදී විශේෂ අවධානයට ලක්ව ඇතැයි ද රජයට සම්බන්ධ ආරංචි මාර්ග පවසයි.

ජනාධිපතිවරයාගේ ඉන්දීය සංචාරයට පෙර මෙම හමුව යොදගෙන ඇත්තේ උතුරු නැගෙනහිරට බලපාන දේශපාලන හා සමාජීය කාරණා සම්බන්ධයෙන් දෙපාර්ශ්වයට එකඟ විය හැකි කරුණු ගැන සාකච්ඡා කිරීමට බවද වාර්තා වේ.

සාමාන්‍ය සම්ප්‍රදායට අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයකු අලුතින් පත් වූ පසු ඉන්දියාවේ නිල සංචාරයක නිරත වීම දශක ගණනාවක සිට සිදුවන්නකි. නමුත් රනිල් බලයට පත් වී වසරකට ආසන්න කාලයක් ගත වුවද ඉන්දියාවේ සංචාරය කරන ලෙස ඔහුට නිල ආරාධනයක් ලැබී නොතිබිණි. නමුත් මෑතකදී එම ආරාධනය ලැබී ඇති අතර ඉදිරි සතියකදී ඔහු ඉන්දියාවේ සංචාරය කිරීමට නියමිතය. ජනාධිපතිවරයාගේ ඉන්දීය සංචාරයට ඇමැති ඩග්ලස් දේවානන්ද, කංචන විජේසේකර, විදෙස් ඇමැති අලිසබ්රි මෙන්ම විදෙස් ලේකම්වරියද සහභාගීවීමට නියමිතය.

රනිල් මීන් පෙර ඉන්දියාවට පොරොන්දු ගණනාවක්ම දී තිබිණි. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කිරීම, බලය බෙදීම වඩා සාධාරණ ආකරයකින් සිදුකිරීම මේ අතර ප්‍රමුඛ වේ. විශේෂයෙන්ම රනිල් පසුගිය නිදහස් දිනට පෙර මෙම කටයුතු නිම කිරීම සිය අරමුණ බව ඉන්දියාවට මෙන්ම දෙමළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමගද පැවසීය. පෙබරවාර් 4 වැනිද පසුවී දැන් මාස 6කට වඩා ගත වී ඇතත් රනිල්ට තවමත් එම පොරොන්දු ඉටු කරගැනීමට නොහැකි වී තිබේ. රනිල්



මේ සම්බන්ධ බලාපොරොත්තු වැඩියෙන්ම ලබා දී ඇත්තේ දෙමළ ජාතික සන්ධානයටය. දෙමළ මන්ත්‍රීන් හා රනිල් අතර අඟහරුවාද නැවත වතාවක් සකච්ඡා ආරම්භ වූයේ එවැනි පසුබිමකය.

### ජනමාධ්‍යය මහින්දානන්දට

ජනාධිපති වික්‍රමසිංහ ආණ්ඩුව උස්සන මාධ්‍ය මෙහෙයුම මහින්දනන්ද අලුත්ගමගේට පවරා ඇතැයි ආණ්ඩුවේ ආරංචි මාර්ග පවසයි. මෙම මාධ්‍ය මෙහෙයුම සිදුකිරීමට හිටපු ජනාධිපති ගෝඨාභය සිටි මලලසේකර මාවතේ නිල නිවස මේ වන විට ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය ලෙස යොදා ගෙන ඇත. ඇමැති ප්‍රසන්න රණතුංග, කංචන විජේසේකර හා මහින්දනන්ද යටතේ මෙම මෙහෙයුම් මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. කංචන හා ප්‍රසන්න මෙහි සිට දේශපාලන ප්‍රොජෙක්ට් කරන අතර මහින්දනන්ද මාධ්‍ය මෙහෙයුම සිදු කරගෙන යයි.

''ස්ථාවර රටකට සැවොම එක මගකට'' යන තේමාව ඔස්සේ මහින්දනන්දලාගේ වැඩේ දුවන අතර දිනකට එක බැගින් මාධ්‍ය සාකච්ඡා පැවැත්වීමටද පටන්ගෙන තිබේ. මේ වාර්තා රැගෙන මහින්දනන්ද දවසකට දෙකකට වරක් ජනාධිපතිවරයා මුණගැසෙන අතර මේ වාර්තා බලා ජනාධිපතිවරයා දැන් උදේට හැපී මූඩ් එකේ සිටින බවද කියයි. මේ අනුව මේ වන විට ආණ්ඩුවේ නොනිල ජනමාධ්‍ය ඇමැති මහන්දනන්දය.

ආණ්ඩුව කරන වැඩ ගැන ආණ්ඩුවේ මාධ්‍යවලින් ලැබෙන ප්‍රචාරණය අල්ප වූ බැවින් ජනාධිපතිවරයා මහින්දනන්දට මේ කාර්යය පවරා ඇත. ''බන්දුලගෙන් පබ්ලිසිටි ලැබෙයි කියලා හෝප් තියාගන්න එපා. එයා මීඩියා එකයි ට්‍රාන්ස්පෝර්ට් එකයි බලන්නේ නෑ. එයා ඉන්ටරෙස්ට් හයිවේ එකට විතරයි'' හිටපු ඇමැති මිතුරකු ජනපතිට පවසා ඇති බව කියයි.



මේ අතර විපක්ෂයට ගහන කොන්තාරාත්තුව ලන්සලාට භාර දී ඇති බවද වාර්තා වේ.

### පොහොට්ටු දෙදරීම එළිපිට

අරගලයත් සමග වසරක පමණ කාලයක් පසු බැස තිබුණු පොහොට්ටුව නැවතත් නගා සිටුවීමට බැසිල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ, සාගර කාරියවසම් දනි පනි ගා වැඩ පටන් ගෙන තිබේ. පසුගිය දිනවල මාතලේ, කුණ්ඩසාලේ, මිනුවන්ගොඩ, රක්වාන, ගලගෙදර වැනි ආසන කීපයකම පොහොට්ටුවේ ප්‍රසිද්ධ රැස්වීම් පැවැතිවිණි. මේ රැස්වීම්වලට පහුගිය කාලේ හැංගි හැංගි සිටි පොහොට්ටුවේ සෑහෙන පිරිසක් නැවතත් පැමිණ සිටි අතර නාමල් මේ සෑම රැස්වීමකටම පාහේ සහභාගී විය. මේ රැස්වීම්වලදී ජනාධිපතිවරයා සමග පොහොට්ටුවේ ඇති කෝන්තරයද අඩු වැඩි වශයෙන් එළියට පැමිණීම කැපී පෙනෙන සිදුවීමකි. සාගරගේ ප්‍රධානත්වයෙන් පැවැති තෙල්දෙණිය ආසන බලමණ්ඩල රැස්වීමේදී මෙය පැහැදිලිව පෙනී තිබේ. ''ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වෙලා සති දෙකකින් මතකද තානාපති කාර්යාලයක සේවය කළ කාන්තාවක් තමන්ව පැහැරගෙන ගිහින් මරන්න උත්සහා කළා කියලා පැමිණිල්ලක් දැම්මා. ඒ කාන්තාව ගිය සතියේ කියනවා මම ඒක වුවමනාවෙන් කරපු බොරුවක් කියලා. අරගල කරලා ගෝඨාභය ජනාධිපති අයින් කරලා අලුත් ජනාධිපති කෙනෙක් ගෙනාවා. හැබැයි ඒ ජනාධිපති පත් වෙලා රටට එක ඩොලර් එකක්වත් එන්නේ නැතිව ප්‍රෙට්‍රල් පෝලිම් ටික ඉවරයි, පැය 14ක් ලයිට් කපන එක පැය 2කට අඩු වුණා. ගෑස් ටැංකි එකක්වත් පිපිරුනේ නෑ. මේවා වුණේ කොහොමද? මේ කුමන්ත්‍රණය අපි හිතන විදිහේ ආණ්ඩු බලය ලබාගන්න කරපු කුමන්ත්‍රණයක් නෙවෙයි. මේ ක්‍රමන්ත්‍රණය මේ සමස්ත ජාතියම විනාශ කිරීමේ කුමන්ත්‍රණයක්.'' සාගර පැමිණ සිටි පිරිස අමතමින් කීවේය. පොහොට්ටු ලේකම් පවසන පරිදි රනිල් ජනාධිපති වී ඇත්තේ කුමන්ත්‍රණයකිනි. එසේනම් රනිල්ට ජනාධිපතිවීම සඳහා බැසිල් පාර්ලිමේන්තුවේදී පොහොට්ටුවේ ඡන්දේ රනිල්ට ලබා දුන්නේ එම කුමන්ත්‍රණයේම අංගයක් ලෙසදැයි මේ වන විට බොහෝදෙනා ප්‍රශ්න කරමින් සිටී.


ජනාධිපතිවරයා කෙරෙහි පොහොට්ටුවේ ඇති ආරෝව එළියට එන තවත් සිදුවීමක් නම් මෙම රැස්වීම්වලදී රනිල් වටා රොක්වී සිටින පොහොට්ටු මැති ඇමැතිවරුන්ට කැපීමය. රමේෂ් පතිරණ, කෙහෙලිය රඹුක්වැල්ල, ප්‍රසන්න රණතුංග යන ඇමැතිවරුන්ගේ ආසනවල තිබුණු පොහොට්ටු රැස්වීම්වලදී මෙම කැපිල්ල කැපී පෙණුනු බව වාර්තා වේ.

එමෙන්ම පහුගිය දිනක රාජ්‍ය ඇමැති ලොහාන් රත්වත්තේගේ මහනුවර නිවසේ පැවැති මහනුවර පොහොට්ටු ක්‍රියාකාරීන්ගේ රැස්වීමට පොහොට්ටුවේ මහනුවර දිස්ත්‍රික් නායක මහින්දනන්ද අලුත්ගමගේට ආරාධනා කර නොතිබිණි. මීට විරෝධය පා දිලුම් අමුණුගම, කෙහෙලිය රඹුක්වැල්ල හා අනුරාධ ජයරත්න රැස්වීම වර්ජනය කර තිබේ. රැස්වීමට පැමිණි බොහෝ පිරිසක් ද මීට විරෝධය පළකරමින් නැගිට ගොස් තිබේ. අවසානයේදී රැස්වීමට කතිකයන් ලෙස සහභාගී වූ නාමල්, සාගර හා රෝහිත දිස්ත්‍රික් නායකයාට මැසේජ් එක දීගන්න බැරිවීම ගැන කනගාටුව පළකර රැස්වීම කල් දමා යන්න ගොස් තිබේ.

සමන් සමරක්කොඩි



# යක්කු දෙන්නෙක්ගෙන් හොඳ යකා තෝරා ගැනීම



ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා 2010 වසරේ පැවැති ජනාධිපතිවරණයේදී ජනාධිපතිවරණයට ඉදිරිපත් වූයේ විපක්ෂයේ පොදු අපේක්ෂකයා වශයෙනි. ඔහු එම වකවානුවේ දී එවක ආරක්ෂක ලේකම්වරයා වූ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරණ ප්‍රචාරක රැස්වීම්වලදී දැඩි ලෙස විවේචනය කළ අතර එහිදී ලැබුණු මහජන ප්‍රතිචාරවලින් උද්දාමයටද පත් වී සිටියේය. එවක ආරක්ෂක ලේකම්වරයා වූ ගෝඨාභය රාජපක්ෂ මහතා හෙළා දකිමින් ජනාධිපතිවරණ ප්‍රචාරක රැලිවලදී විපක්ෂයේ පොදු අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකාගේ බාලවර්ගයේ කතා පිළිබඳව පොදු විපක්ෂයේ ජනාධිපතිවරණ මෙහෙයුම් කමිටුවේද අවධානය යොමු වී තිබිණි.

වරක් ජනාධිපතිවරණ වේදිකාවකදී විපක්ෂයේ පොදු අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා එවක ආරක්ෂක ලේකම්වරයා වූ ගෝඨාභය රාජපක්ෂ මහතාට අපහාසවන අයුරින් කතා කරනු බලා සිටි ජවිපෙ මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා වේදිකාවේ සිටි එජාප මහ ලේකම් තිස්ස අත්තනායකට කීවේ තිස්ස දැන් දැන් ජෙනරාල් කලින්ටත් වඩා අනවශ්‍ය විදියට කතා කරනවා. මං හිතන්නේ මේ තත්ත්වේ පාලනය කළොත් හොඳයි වගේ යැයි රහසින් කීවේය. ඔව් ඔව් ඒකනං අපිටත් පේනවා. කොහෙද මේ මනුස්සයාට කොච්චර කිව්වත් අහන්නේ නැහැනේ. එජාප මහ ලේකම් තිස්සද අනුර කුමාර දිසානායකට පවසා තිබිණි.


මේ අතර මුලින් විපක්ෂයේ පොදු අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකාට දැඩි විරෝධයක් පළකළ ද්‍රවිඩ ජාතික සන්ධානය එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ මැදිහත් වීම මත ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාට සහාය පළ කිරීම සඳහා සාකච්ඡාවකට සහභාගි විය. එම සාකච්ඡාවේදී ද්‍රවිඩ ජාතික සන්ධානයේ ප්‍රබලයකු වූ ටෙලෝ සංවිධානයේ එම්.කේ. සිවාජිලිංගම් රනිල් වික්‍රමසිංහ මහතාගෙන් මෙසේ විමසා තිබිණි. සර් මහින්ද කියන්නේ යකෙක්. ඒ වගේම සරත් ෆොන්සේකා කියන්නෙත් යකෙක්. මේ යක්කු දෙන්නම කළේ ද්‍රවිඩ ජනතාවට හතුරුකම්. ඉතිං අපි කොහොමද සරත් ෆොන්සේකා කියන යකාට උදව් කරන්නේ. සිවාජිලිංගම් මහතාගේ ප්‍රකාශයට පිළිතුරු දෙමින් එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතා පවසා තිබුණේ ''ස්වාජිලිංගම් කියන කතාව මටත් තේරෙනවා. ඔයාලට තියෙන්නේ ඒ යක්කු දෙන්නාගෙන් හොඳ යකා තෝරාගෙන ඒ යකාට උදව් කරන එක'' කියාය.

# ප්‍රථම ඇමැති මණ්ඩලය සභාගයක් වැනිය

ලක්දිව පළමු ආණ්ඩුවට දස දෙනකුගෙන් යුත් අමාත්‍ය මණ්ඩලයක් පත්කරන ලෙස සෝල්බරි කොමිසම යෝජනා කොට තිබුණේය. එහෙත් පාර්ලිමේන්තුවේ ස්ථාවර වැඩි ආසන සංඛ්‍යාවක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව මත අමාත්‍ය මණ්ඩලය පුළුල් කිරීමේ අවශ්‍යතාවක් පැන නැගුණි. ඊට හේතු වූයේ 1947 මහ මැතිවරණයෙන් එජාපය සමස්ත ආසන සංඛ්‍යාවෙන් ආසන 42ක් පමණක් ලබා ගැනීම නිසාය. බෙදී සිටි විපක්ෂය සාර්ථක විකල්පයක් ඉදිරිපත් නොකිරීම නිසා ආණ්ඩුවක් පිහිටුවීමට එජාපය සමත් වූ අතර පාර්ලිමේන්තුවේ බලය තහවුරු කර ගැනීම සඳහා ස්වාධීන මන්ත්‍රීවරුන්ගේ හා සුළු ජන කොටස්වලද සහාය ලබා ගැනීමට මේ අතර පත් කළ මන්ත්‍රීවරුන් සිටීමද එජාප ආණ්ඩුවේ බලය තහවුරු වීමට තවත් හේතුවක් විය. කෙසේ වෙතත් 1947 මහ මැතිවරණයේ දී ඩී.එස්. සේනානායක මහතා ලබා ගත් වැඩි ඡන්ද සංඛ්‍යාව ඉතා අවම වීම නිසා අමාත්‍ය මණ්ඩලය පිහිටුවීමේ දී විශේෂ සැලකිල්ලක් ද ගත යුතු විය.

ආණ්ඩුව පිහිටුවීමේ දී අමාත්‍ය මණ්ඩලය 13 දෙනකුගෙන් සමන්විත විය යුතු බව ප්‍රකාශ කර තිබුණද විවිධ කණ්ඩායම්වල හා පුද්ගලයන්ගේ ඉල්ලීම්වලටද කන්දීමෙන් පසුව අමාත්‍ය මණ්ඩලය 14 දෙනකු දක්වා වැඩි කරන ලදී. එක් ඇමැතිවරයෙක් කාර්ය නියමයක් නොමැති ඇමැතිවරයකු ලෙසත්, ස්වාධීන මන්ත්‍රිවරුන් දෙදෙනකුට ඇමැති තනතුරු 2ක්ද වැඩ කරන ජනයා නියෝජනය කිරීම සඳහා එවක ප්‍රබල කම්කරු නායකයකු වූ ඒ.ඊ. ගුණසිංහ මහතාද ඇමැතිවරයකු ලෙස පත්කරන ලදී. ද්‍රවිඩ කොංග්‍රසයේ නායක ජී.ජී. පොන්නම්බලම් මහතාට අමාත්‍ය තනතුරක් ලබා දුන්නේ ද්‍රවිඩ ජනතාවගේ නියෝජනය ආණ්ඩුවට ලබා ගැනීම සඳහාය.

මේ අතර එජාප ආණ්ඩුවේ ස්වාධීන මන්ත්‍රීවරුන් වූ පසුව ඇමැතිවරුන් ලෙස පත් කළ සී. සුන්දර ලිංගම් හා සී. සිත්තම්පලම් හා ඒ.ඊ. ගුණසිංහ ඇමැතිවරයාද තමන් එජාපයේ සාමාජිකයන් නොවන බව ප්‍රසිද්ධියේම ප්‍රකාශ කිරීම නිසා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ලක්දිව ප්‍රථම අමාත්‍ය මණ්ඩලය සභාග ආණ්ඩුවක් බඳු විය.



එතෙර අරුණ

# මෝදි පරද්දන්න ඉන්දීය විපක්ෂයෙන් බලගතු සන්ධානයක්



මෝදි

■ නිහාල් පීරිස්

ලබන වසරේ පැවැත්වීමට නියමිත ඉන්දියානු මහ මැතිවරණයෙන් අගමැති නරේන්ද්‍ර මෝදි සහ ඔහුගේ භාරතීය ජනතා පක්ෂය පරාජයට පත්කිරීම සඳහා එරට විරුද්ධ පක්ෂ විශාල මෙහෙයුමක් ආරම්භ කර ඇති ආකාරය දැකිය හැකි වේ. නරේන්ද්‍ර මෝදි සැලකෙන්නේ මෙකල ලෝක දේශපාලන කරළියේ සිටින ප්‍රබලම නායකයකු ලෙසිනි. 2014 වසරේ එරට අගමැති ධුරයට පත් ඔහු 2019 වසරේ පැවැති මහ මැතිවරණයෙන් පසු නැවතත් එම ධුරයට පත් විය. මේ වනවිට මෝදි වසර 9කට ආසන්න කාලයක් ඉන්දියාවේ අගමැති ධුරය දරා තිබේ. ඉන්දියානු ජනතාවට ඉතා ආකර්ෂණීය නායකයකු බවට පත්ව සිටින ඔහු දේශපාලන වශයෙන් පරාජය කිරීම අපහසු සහ අභියෝගාත්මක කටයුත්තක් බව බොහෝ නිරීක්ෂකයන්ගේ අදහසයි.

මෙම අභියෝගය ජය ගැනීම සඳහා එරට විරුද්ධ පක්ෂ දැන් සිටම සූදානම් වීමට පටන්ගෙන තිබේ. ඔවුන් සූදනම් වන්නේ පුළුල් එකමුතුවක් ලෙස සටනට පිවිසීමටය. විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වන ඉන්දීය ජාතික කොංග්‍රසයේ මූලිකත්වයෙන් මෙවැනි පොදු පෙරමුණක් ගොඩ නැගීමේ කටයුතු මේ වනවිට ආරම්භ වී තිබේ. දැනටමත් පක්ෂ 26ක් මෙම පෙරමුණට එක්ව සිටින බව සඳහන් වේ. මෙම පෙරමුණේ ඉදිරි කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන හමුවක් පසුගියද කර්ණාටක ප්‍රාන්තයේ අගනුවර වන බෙංගලූරු හි දී පැවැත්විණි. සෝනියා ගාන්ධි, රාහුල් ගාන්ධි, තමිල්නාඩු මහ ඇමැති එම්. කේ. ස්ටාලින්, දිල්ලි මහ ඇමැති අර්වින්ද් කෙජ්රිවාල්, බටහිර බෙංගාල ප්‍රාන්තයේ මහ ඇමැතිනි මමතා බැනර්ජි ඇතුළු කැපී පෙනෙන නායකයෝ රැසක් ඊට සහභාගි වී සිටියහ.

පෙරමුණේ නම, එහි සභාපති ඇතුළු නිලතල දරන්නන් සහ සියලු දෙනාට එකඟ විය හැකි වැඩපිළිවෙළක් ආදිය සම්බන්ධයෙන් මෙම හමුවේ දී සාකච්ඡා කෙරිණි. එහිදී තීරණය කර ඇත්තේ මෙම පෙරමුණ I-N-D-I-A (Indian National Developmental Inclusive Alliance) යනුවෙන් නම් කිරීමටය. එහි සභාපති ධුරයට සෝනියා ගාන්ධි පත් වීමට බොහෝ දුරට ඉඩ ඇති බව සඳහන්ය. මෙම එකමුතුව සාර්ථක වුවහොත් එය අගමැති මෝදිට සහ ආණ්ඩු පක්ෂය වන භාරතීය ජනතා පක්ෂයට විශාල අභියෝගයක් වනු ඇති බව දේශපාලන විශ්ලේෂකයෝ පවසති.



සෝනියා



රාහුල්



බැනර්ජි

විරුද්ධ පක්ෂ මේ ආකාරයෙන් ඔවුන්ගේ සටන් මග තීරණය කිරීම සඳහා රැස්වෙද්දී මේ වනවිට ඉන්දියාව පාලනය කරන භාරතීය ජනතා පක්ෂය ප්‍රධාන ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානයද දිල්ලියේ දී රැස්වීමක් කැඳවා තිබිණි. එම සන්ධානය නියෝජනය කරන පක්ෂ 38ක් ඊට සහභාගි වී සිටි බව සඳහන් වේ. ඊට අමතරව අලුත් පක්ෂ කිහිපයක් අලුතෙන් සන්ධානයට එක්ව සිටිනුද දැකිය හැකිය. දේශපාලන නිරීක්ෂකයන් මෙය සලකන්නේ බී.ජේ.පී.ය තමන්ගේ ශක්තිය පෙන්වීම සඳහා සංවිධාන කරන ලද්දක් ලෙසය. ඉහත කී ආකාරයෙන් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානයට එක් වූ අලුත් පක්ෂයක නායකයකු පවසා තිබුණේ ඉන්දියාවට නරේන්ද්‍ර මෝදි විනා අන් විකල්පයක් නොමැති බවයි. ‘අපත් මෙම සන්ධානයට එකතු වුණා. නරේන්ද්‍ර මෝදි හැර වෙනත් විකල්පයක් නැහැ. අප මැතිවරණයේදී එක්ව සටන් කර 2024 වසරේත් ආණ්ඩුවක් පිහිටුවනවා’ යැයි ඔහු සඳහන් කර තිබිණි.

## සෝනියා - රාහුල් ස්ටාලින් - කෙජ්රිවාල් - බැනර්ජි එක්ව සටන් කරන්න සූදානම්



කෙජ්රිවාල්



ස්ටාලින්

ඉන්දීය මහ මැතිවරණය පැවැත්වීමට නියමිතව ඇත්තේ ලබන වසරේ අප්‍රේල් සහ මැයි මාසවලය. එසේ වුවත්, ඉහත කී සිදුවීම් හරහා පෙනී යන්නේ දැන් සිටම මැතිවරණ උණුසුම ගොඩනැගෙන්නට පටන්ගෙන ඇති බවයි. ඉන්දීය පාර්ලිමේන්තුව මන්ත්‍රී මණ්ඩල දෙකකින් සමන්විත වන අතර එහි පහළ මන්ත්‍රී මණ්ඩලය වන ලෝක් සභාවේ ආසන 543ක් වෙනුවෙන් නියෝජිතයන් පත්කර ගැනීම මහ මැතිවරණයේ දී සිදු වේ. මේ වනවිට මෙම ආසන 543න් 332ක්ම හිමි කරගෙන සිටින්නේ භාරතීය ජනතා පක්ෂය ඇතුළත් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානයයි. විපක්ෂයට හිමිව ඇත්තේ ආසන 205ක් පමණි. (ආසන 6ක් මේ වනවිට තිබෙන්නේ හිස්වය.)

## කොංග්‍රසය සමග පක්ෂ 26ක් එක පෙරමුණකට

කෙසේ නමුත් වර්තමානය වනවිට ඉන්දියාවේ විරුද්ධ පක්ෂ එදට වඩා යම් ප්‍රමාණයකින් ඉදිරියට පැමිණ ඇති ආකාරයක් දැකිය හැකි වේ. පසුගිය මැයි මාසයේ පැවැති කර්ණාටක ප්‍රාන්ත මැතිවරණයෙන් භාරතීය ජනතා පක්ෂය පරදවා සුවිසල් ජයග්‍රහණයක් හිමිකර ගැනීමට ඉන්දීය ජාතික කොංග්‍රසයට හැකි විය. විරුද්ධ පක්ෂවලට යම් උත්තේජනයක් එන්නත් කිරීමට මෙම ජයග්‍රහණයට හැකිව තිබෙනු දැකිය හැකි වේ.

කොංග්‍රස් පක්ෂයේ වත්මන් නායකයකු වන රාහුල් ගාන්ධිට එරෙහිව දේශපාලන පළිගැනීම් ක්‍රියාත්මක වෙමින් ඇති බවට මේ වනවිට ඉන්දියාව තුළ ප්‍රබල මතයක් ගොඩ නැගී තිබේ. ඊට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ සාපරාධී අපහාස චෝදනා යටතේ ඔහුට එරෙහිව නඩු පැවරීමට භාරතීය ජනතා පක්ෂයේ මන්ත්‍රීවරයකු කටයුතු කිරීමයි. මෙම චෝදනාවලට පසුබිම් වූයේ රහුල් ගාන්ධි 2019 වසරේ දේශපාලන රැළියක දී කළ ප්‍රකාශයකි.

“මේ සියලුම හොරුන්ට මෝදි යන වාසගම ලැබී ඇත්තේ මන්ද? නිරව් මෝදි, ලලිත් මෝදි, නරේන්ද්‍ර මෝදි” යයි ඔහු එහිදී විමසුවේය. රාහුල්ට එරෙහිව නඩු පැවරුණේ මෙම ප්‍රකාශය මගින් සමස්ත මෝදි ප්‍රජාවටම අපහාසයක් වනවාය යන චෝදනාව මතය. නිරව් මෝදි සහ ලලිත් මෝදි යන දෙදෙනාම වංචා දූෂණ පිළිබඳ විවිධ චෝදනා එල්ල වී සිටින දෙදෙනෙකි.

ඉහත කී චෝදනාවලට රාහුල් ගාන්ධි වරදකරුවකු බවට තීන්දු කෙරුණු අතර වසර 2ක සිර දඬුවමක්ද නියම කෙරිණි. ඔහුගේ පාර්ලිමේන්තු ආසනය පවා අහිමි විය. දේශපාලන පළිගැනීමක් ලෙස ඇතැම් පාර්ශ්ව හඳුන්වනු ලබන මෙම සිද්ධිය ද එරට විරුද්ධ පක්ෂ අතර යම් සමගියක් ඇති කිරීමට හේතු වී ඇති ආකාරයක් දැකිය හැකි වේ. මෙම සමගිය ඉදිරියේ දී වඩාත් ප්‍රබල බලවේගයක් බවට පත් වුවහොත් ලබන වසරේ මහ මැතිවරණයේ දී උණුසුම් සටනක් දැක බලා ගැනීමට හැකි වනු ඇත.

# අරුණ වාණිජ ලෝකය

## Dialog Star Rewards Loyalty සාමාජිකයන් සුවිශේෂී ප්‍රතිලාභ රැසක්




ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සබඳතා සම්පාදකයා වන ඩයලොග් ආසිආටා පී එල්.සී විසින් හඳුන්වා දී ඇති Dialog Star Rewards වැඩසටහන මගින් smartphones,Dialog TV, Dialog Home Broadband සම්බන්ධතා සඳහා සුවිශේෂී වට්ටම්, හවුල්කාර වෙළෙඳුන් වෙතින් ලබා ගත හැකි සුවිශේෂී දීමනා ඇතුළුව වසර පුරා දීර්ඝ කළ තවත් සුවිශේෂී ප්‍රතිලාභ රැසක් හඳුන්වා දී ඇත.

ඩයලොග් Star Rewards loyalty වැඩසටහන ඩයලොග් පාරිභෝගිකයන් සඳහාම නිර්මාණය කර ඇති අතර එමගින් රීලෝඩ් කිරීම, මාසික බිල්පත් ගෙවීම් ආදිය සිදු කළ හැකි වේ. ඩයලොග් ජාලය සමග ගනුදෙනුකරුගේ සම්බන්ධවී සිටින කාලසීමාව මත දීමනාවන් පදනම් වේ. Star Rewards සාමාජිකයන්ට Dialog හි පුළුල් ජාලයේ කොටසක් වන දීප ව්‍යාප්ත හවුල්කාර වෙළෙඳුන් මගින් හොඳම ලෝයල්ටිවරප්‍රසාදයන් ලබා ගත හැකි වේ.

## ලින්ක් සමහන්, ඊ-වාණිජ්‍යය වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වෙයි




CIC සමූහ ව්‍යාපාරය හා අනුබද්ධිත සමාගමක් වන ලින්ක් නැචුරල්හි ප්‍රමුඛතම සන්නාමය වන ලින්ක් සමහන්, ඇමරිකාවේ සහ එක්සත් රාජධානියේ පිහිටි බහුජාතීය වෙළෙඳ ජාලයන් වන Walmart සහ Amazon UK යන අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක ඔන්ලයින් වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වෙමින් විශිෂ්ට වූ ගෝලීය ව්‍යාපාරික ජයග්‍රහණයක් අත්කර ගෙන තිබේ.

පසුගිය වසර කිහිපය තුළදී ගෝලීය ‘ඊ-වාණිජ්‍යය වෙළෙඳපොළ’ පාරිභෝගිකයන් සඳහා අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව තිබිණි. ගෝලීය අන්තර්ජාල ප්‍රවේශය සහ පිළිගැනීම ශීඝ්‍රයෙන් වර්ධනය වන විට, අන්තර්ජාලය ඔස්සේ මිලදී ගැනීම් කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යමින් පවතී.

ලින්ක් සමහන් මේවන විටත් Amazon.com අන්තර්ජාල වෙළෙඳපොළ තුළට ප්‍රවේශ වී ඇති අතර එය දැන් Walmart.com සහ Amazon UK යන වෙළෙඳ ජාල තුළටද ඇතුළත් කිරීමත් සමගින් එහි ව්‍යාප්තිය පුළුල් වී තිබේ. සමහන් Walmart.com වෙත ප්‍රවේශ වීම මගින් ඇමරිකා එක්සත් ජනපදය පුරා පිහිටි 4,700 කට අධික Walmart බාහිර වෙළෙඳ ශාඛා තුළින්ද සමහන් මිලදී ගැනීමට හැකි වේ.

## SLTC නව උප කුලපති සහ ප්‍රධාන විධායක මහාචාර්ය වේරංජ කරුණාරත්න



SLTC පර්යේෂණ විශ්වවිද්‍යාලයේ නව උප කුලපති සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස මහාචාර්ය වේරංජ කරුණාරත්න පත් කිරීම පිළිබඳව එම ආයතනය සාඩම්බරයෙන් නිවේදනය කරයි.

කීර්තිමත් අධ්‍යයන පසුබිමක්, පුළුල් නායකත්ව පළපුරුද්දක් සහ ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත මහාචාර්ය කරුණාරත්න විශිෂ්ටත්වය සහ නව්‍යකරණය පිළිබඳ SLTC දැක්ම ඉදිරියට ගෙන යාම සඳහා සුදුසුම වෘත්තිකයකු ලෙස හැඳින්විය හැකිය. පුද්ගලාවරෝපිත අධ්‍යාපනය සහ පර්යේෂණ මත පදනම් වූ ඉගෙනුම් ක්‍රියාවලියක් ඔස්සේ SLTC පර්යේෂණ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යයන ආයතන අතර සුවිශේෂී ස්ථානයක් හිමි කරගෙන සිටී.

කැනඩාවේ බ්‍රිටිෂ් කොලොම්බියා විශ්වවිද්‍යාලයේ කෘත්‍රිම කාබනික රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය උපාධියක් හිමි කරුණාරත්න මහතා ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා විශේෂඥතාවක් දක්වයි.

වර්තමානයේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපති සහ ජාතික පර්යේෂණ කවුන්සිලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන මහාචාර්ය කරුණාරත්න මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අංශයේ හිටපු ප්‍රධානී, ජාතික බුද්ධිමය දේපළ කොමිසමේ හිටපු සභාපති, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ (SLINTEC) සහකාර අධ්‍යක්ෂ හා විද්‍යා කණ්ඩායම් නායක සහ SLINTEC ඇකඩමියේ උප කුලපති යන තනතුරු හොබවා ඇත.

## ජාතික ව්‍යාපෘති කළමනාකරණ විශිෂ්ටතා සම්මාන පිරිනැමීම 16 වැනිදා



ව්‍යාපෘති කළමනාකරණ ආයතනය ශ්‍රී ලංකා chapter 6 වැනි වරටත් පවත්වනු ලබන ජාතික ව්‍යාපෘති කළමනාකරණ විශිෂ්ටතා සම්මාන අගෝස්තු 16 වැනි දින කොළඹ කිංස්බරි හෝටලයේදී පැවැත්වීමට කටයුතු සූදනම් කොට තිබේ.

මේ පිළිබඳව මාධ්‍ය දැනුවත් කිරීම කොළඹ කිංස්බරි හෝටලයේදී සිදු කෙරුණි. එදින පෙරවරුවේ සමුළුව පැවැත්වේ. 2023 වසරේ දී සියලුම ව්‍යාපෘති ඇගයීමට ලක්කරමින් එහි විශිෂ්ට යන අගය මෙන් මෙම සම්මාන පිරිනැමේ.

විශිෂ්ටතා සම්මාන කාණ්ඩ විස්සක් යටතේ මේ සඳහා ඉල්ලුම් කළ හැකියි. සම්මන්ත්‍රණය එක්දින වැඩමුළුවක් ලෙස පැවැත්වෙන අතර වෘත්තිකයන්ගේ දේශන මේ සඳහා ඇතුළත් වේ. වාර්ෂිකව පවත්වනු ලබන ජාත්‍යන්තර සමුළුව සඳහා දෙස් විදෙස් ව්‍යාපෘති කළමනාකරණ සාමාජිකයන් එක්වීමට නියමිතයි.

රටේ සංවර්ධනයට දායකත්වය සපයන ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති කළමනාකරණ ක්ෂේත්‍රයේ උසස් ප්‍රමිතීන් මෙරටට හඳුන්වා දීම මෙහි අරමුණ වී තිබේ.

## Unimo Enterprises JMC N720 ට්‍රක් රථය එළිදකී





Enterprises සමාගම විසින් දේශීයව එකලස් කරන ලද නවතම JMC N720 වාණිජ ට්‍රක් රථය පසුගියද හඳුන්වා දෙන ලදී. කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ‘කර්මාන්ත ප්‍රදර්ශනය 2023’ හිදී සිදුවූ මෙම සුවිශේෂී අවස්ථාව සඳහා අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා, කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මහතා සහ කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරින් රැසක් මෙන්ම කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ නියෝජිතයන් සහ යුනිමෝ එන්ටර්ප්‍රයිසස් නියෝජිතයන් රැසක්ද එක්ව සිටියහ.

දැනට රටේ පවතින ආනයන තහනමත් සමග ට්‍රක් රථ ගැනුම්කරුවන් විසින් නවීන ට්‍රක් රථ මිලට ගැනීම වෙනුවට භාවිත කළ ට්‍රක් රථ මිලදී ගැනීමට පෙලඹී ඇති අතර, එමගින් ඔවුන්ගේ ව්‍යාපාරවල කාර්යක්ෂමතාව පවත්වාගෙන යාම පිළිබඳව ගැටලු රැසකට මුහුණ දීමට සිදුවී තිබේ.

එබැවින් අලුතින් වෙළෙඳපොළට හඳුන්වා දුන් මෙමJMC N720 නවතම ට්‍රක් රථය වෙළෙඳපොළ ඉලලුමට සරිලන උසස් නිමැවුමක් මෙන්ම විශ්වාසනීයත්වය සහතික කළ නවතම ට්‍රක් රථයක් මිලදී ගැනීමට අපේක්ෂා කරන පාර්ශ්වයන්ට නිසැකයෙන්ම කදිම ආයෝජන අවස්ථාවක්ද වනු ඇත.

මෙම රථයට ටොන් 3ක බරක් පැටවිය හැකි අතර, බලසම්පන්න 2771cc ඩීසල් එන්ජිමකින්ද සමන්විත වේ. මෙහි අන්තර්ගත වන 5 forward ගියර් පද්ධතිය මගින් ට්‍රක් රථයට අවශ්‍ය පරිදි ප්‍රමාණවත් බලයක් සහ කාර්යක්ෂමතාවක් සපයනු ලබයි.

## 2023 - ජාතික මානව සම්පත් කළමණාකරණ සම්මන්ත්‍රණය නිමවෙයි



පිරිස් කළමනාකරණ වරලත් ආයතනය විසින් සංවිධානය කරනුලබන දේශීය මානව සම්පත් කළමනාකරණයේ අනගිතම උත්සවාංගය වශයෙන් හැඳින්විය හැකි ජාතික මානව සම්පත් සම්මන්ත්‍රණය- 2023 පසුගියද ශ්‍රී ජයවර්ධනපුර මොනාර්ක් ඉම්පීරියල් හෝටලයේදී සාර්ථක ලෙස පැවැත්විණ.

තුන් අවුරුදු නිහැඩියාවකින් පසු ඉකුත් ජුනි 21 -22 දෙදින පුරා පැවැති මානව සම්පත් සම්මන්ත්‍රණයට ගෝලීය මානව සම්පත් කළමනාකරණ වෘත්තිකයන් සහ කර්මාන්ත ක්ෂේත්‍ර නියෝජිතයන් රැසක් සහභාගි විය.

තාක්ෂණික සැසි හයක් හා සාකච්ඡා වට තුනකින් සුසැදි මානව සම්පත් සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ ඒ බවර් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක රොල්ෆ් බ්ලේසර් මහතා විසිනි. පවතින අර්බුදකාරී වාතාවරණයෙන් ගොඩඒම සඳහා වත්මන් තත්ත්වයට බලපෑ හේතු ගැඹුරින් විමසා බැලීමත් ඉන් හුදෙකලා කළ හැකි සාධක කඩිනමින් ඉවත්කර දැඩි පරිශ්‍රමයෙන් වැඩකිරීමත් අත්‍යවශ්‍ය බව ඒ මහතා පැවසීය.

## සංවර්ධන ලොතරැයියේ දස ලක්ෂපතියන්ට මුදල් ත්‍යාග



■ සුමේධ කරුණාරත්න - අනුරාධපුර

සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීමේදී බිහිවූ දස ලක්ෂපතියන් 08 දෙනකුට පසුගියද අනුරාධපුරයේදී ඔවුන්ට හිමි ත්‍යාග මුදල්වලට අදළ චෙක්පත් භාරදෙනු ලැබීය.

එසේම එම ජයග්‍රාහී ලොතරැයිපත් අලෙවි කරනු ලැබූ අලෙවි නියෝජිතයන්ටද මුදල් ත්‍යාග පිරිනැමිණි. අනුරාධපුර, කුරුණෑගල හා පොලොන්නරුව යන දිස්ත්‍රික්කවලින් එම ජයග්‍රාහකයන් බිහිව තිබිණි.

හිටපු අමාත්‍ය එච්.බී. සේමසිංහ හා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති අජිත් නාරගල යන මහත්වරුන් අතින් ජයග්‍රාහකයන් වෙත ත්‍යාග පිරිනැමිණි.

## CDB සමාගමට 6 වැනි වරටත් ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මානය



සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී (Citizens Development Business Finance PLC - CDB) සමාගම, National Business Excellence සම්මාන උළෙලේදී අඛණ්ඩව 6 වැනි වරටත් සම්මානයෙන් පිදුම් ලැබීමට පසුගියද සමත් විය.

කොළඹ ෂැංග්‍රි-ලා හෝටලයේදී පැවැති මෙම සම්මාන උළෙලේදී ‘බැංකු නොවන මූල්‍ය සේවා’ සහ ‘ආයතනික යහපාලනයේ විශිෂ්ටත්වය’ යන කාණ්ඩ යටතේ ජයග්‍රාහකයන්ට හිමි සම්මාන හිමිකර ගැනීමට සමත් විය. පසුගිය වසර 28 ක කාලය තුළ මේ ආකාරයට බැංකු නොවන මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ සංධිස්ථාන රාශියක් සනිටුහන් කිරීමට CDB සමාගම සමත් වී තිබේ.

ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන මෙම සම්මාන උළෙල මෙවර පවත්වන ලද්දේ 18 වැනි වරටය. ව්‍යාපාර කටයුතුවලදී විශිෂ්ටත්වය ළඟා කරගන්නා අතරම රටේ ආර්ථිකයේ දියුණුව වෙනුවෙන් කැපීපෙනෙන දායකත්වයක් ලබාදෙන සමාගම් හා ආයතනවලට මෙම සම්මාන පිරිනැමේ.

ආයතනික යහපාලනය, ව්‍යාපාරික විශිෂ්ටත්වය හා තිරසර ව්‍යාපාර ආකෘතියක් භාවිත කිරීම මෙන්ම, අදළ කාල සීමාව තුළදී මතු වූ දැවැන්ත අභියෝගවලට සාර්ථක ලෙස මුහුණ දීම යන සාධක සැලකිල්ලට ගනිමින් මෙම සම්මාන CDB සමාගම වෙත පිරිනමන ලදී.